# 2014 – 12 – 02 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය (-

| | | |
|---|---|---|
| ☞ | ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| ☞ | කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| ☞ | ඒ.පී.ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | එච්.එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | ග්‍රේෂන් කෙරමිණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | ජේ.ඩබ්.ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | ආර්.පී.දේව් රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | බී.ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | කේ.පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

නොපැමිණීම

| | | |
|---|---|---|
| ☞ | ජේ.ඩබ්.හාෂිණි මෙනුකා විජේසූරිය මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව.9.40 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී** ☸

ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්

අද සණ පූර්ණය අපෙන්.අපි 4 දෙනා නැතිවුනොත් තමුන්නාන්සේට සභාව පටන් ගන්නත් බැරි වෙනවා.අපි නගරයේ බඳු ගෙවන ජනතාව වෙනුවෙන් වාඩි වෙලා ඉන්නවා මේ ගරු සභාව ගෙනයාම සඳහා.

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ස්තූතිවන්ත වෙනවා අපි ඔබතුමාට ඒ පිළිබඳව.

**(01)**

**01:01** **2014 – 11 – 04 දින පවත්වන ලද සාමාන්‍ය මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

2014 – 11– 04 දින පවත්වන ලද සාමාන්‍ය මාසික සභා රැස්වීම් වාර්තාව කියවුවා සේ සලකා පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් යෝජනා කළ අතර ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ ඒ අනුව **2014 –** 11 **– 0**4 දින පවත්වන ලද සාමාන්‍ය මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(02)** සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම විශේෂ නිවේදනයක් කරන්න ඕන ,ඇත්ත වශයෙන්ම නගර සභාවේ රාජ්‍ය සේවකයින්ගේ වැටුප් අඩුවෙන් පළාත් සභාවෙන් එවන බව සඳහන් කරමින් ප්‍රකාශයක් කළා.ඒ ප්‍රකාශය ඇත්තටම පත්තර වල පළ වුණා,ඒ පළ කරපු සියලුම මාධ්‍ය වේදීන්ට සහ පුවත්පත් වලට මං විශේෂ ස්තූතිය පළ කරනවා මේ අවස්ථාවේදී.එහි ප්‍රතිඵලයක් වශයෙන් පළාත් සභාවෙන් පසුගිය නොවැම්බර් මාසයේ වැටුප් පළාත් පාලන ආයතන සඳහා 100% ක් ප්‍රතිපූර්ණය වුණා.මං ඒදා මේක කතා නොකලානම් අපේ ආයතනයට විතරක් නෙවෙයි සියලුම ආයතන වලට විශාල අසාධාරණයක් පළාත් සභාව මඟින් සිදු වුණා.දැන් ඒක නිවරදි වුණා.ඒ පිළිබඳ මම සියලුම මාධ්‍ය වේදීන්ට ස්තූතිවන්ත වෙනවා.නොවැම්බර් මස වැටුප් සඳහා නගර සභාවට අවශ්‍ය වෙනවා හතලිස් දෙලක්ෂ හැත්ත හය දහස් හාරසිය හැට නවයයි ශත විසි තුනක්.ප්‍රතිපූර්ණය වූ මුදල තියෙනවා හතලිස් තුන්ලක්ෂ දෙදහස් පන්සියයක්.ඒ අනුව රුපියල් විසිහය දහස් තිහයි සත හැත්ත හතක් වැඩිපුරත් එක්ක ලැබිලා තියෙනවා.අපි අතිගරු ජනාධිපතිතුමාට මුදල් කොමිසම හරහා රාජ්‍ය සේවකයින්ට සියලුම වැටුප් ප්‍රතිපූර්ණය කිරීම වෙනුවෙන් හැමදාම ස්තූතිවන්ත වෙනවා.දකුණු පළාත් සභාව නිවරදි වීම සම්බන්ධයෙනුත් මේ අවස්ථාවේදී විශේෂ ස්තූතිය පුදකර සිටිනවා.

**(03)** ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**3:1** **‘** අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනය වෙන්කරවා ගැනීම **’** මැයෙන් බූස්ස යුධ හමුදා කඳවුරේ 141බල සේනාවේ බලසේනාධිපති විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

සමස්ථ ලාංකීය ජනතාව අභිමානවත් එකමුතු රටක් කරා රැගෙන යාම පිණිස ධර්ම ප්‍රචාරක කටයුතු ක්‍රියාවට නැංවීම පිළිබඳව සැලසුම් කරන ලද වැඩ සටහන් රාශියක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සංවිධාන ශක්තියෙන් සහ පූජ්‍ය උඩුවේ ධම්මාලෝක ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් යුතුව දිවයිනේ ප්‍රසිද්ධ ධර්මදේශකයානන් වහන්සේවරුන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර අම්බලන්ගොඩ ප්‍රදේශයේ ජීවත්වන පොදු ජනතාව වෙනුවෙන් ඉටුකරනු ලබන එම උදාරතර සත්කාරය 2014 නොවැම්බර් මස 30 වන දින 18 00 පැයට අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේදි පැවැත්වීමට කටයුතු සුදානම්කර ඇති බවත් එම පිංකම සඳහා අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනය ලබා ගැනීම පිණිස අවැසි කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා තිබූ අතර එම

පිංකම පැවැත්වීම සඳහා මෙම භූමිය නිසි අයුරු සකස් කිරිම සඳහා ධර්ම දේශනය පැවැත්වීමට නියමිත දිනට, දින දෙකකට පෙර ලබා දීමට අවැසි කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

❖ **‘ සේවාවන් හා අවශ්‍යතාවයන් ලබාගැනීම - සම්මා සම්මානී ආගමික වැඩ සටහන ’** මැයෙන් බූස්ස යුධ හමුදා කඳවුරේ 141බල සේනාවේ බළසේනාධිපති විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඉහතින් සඳහන් කරන ලද ධර්මදේශනා වැඩ සටහන සඳහා නගර සභා ක්‍රීඩාංගනය විදුලි ආලෝකයෙන් අලංකාර කිරීමට අවශ්‍ය බැවින් අවශ්‍ය විදුලිය දින 02 ට පෙර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

මෙම ඉල්ලීම පරිදි නගර සභා ක්‍රීඩාංගනයේ විදුලි ආලෝකකරණය කිරීම සඳහා අනුග්‍රහය දැක්වීමට අදාළව රු.24600.00ක ඇස්තමේන්තුවක් ප්‍රජා සංවර්ධන නිළධාරිනිය විසින් සකස් කර ඉදිරිපත් කර තිබුණි.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ අවස්ථාවේදීම අපෙන් ඉල්ලා සිටියා ආලෝකකරණය කරලා දෙන්න කියලා.ඒ සඳහා අපි අමාත්‍යාංශ ලේඛම්තුමාගෙත් උපදෙස් අරගෙන ඒ සඳහා ඇස්තමේනතුව සකස්කරලා තියෙන්නේ.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝදතාවයක් නොමැති වූ බැවින් මෙම ධර්ම දේශනය සඳහා නගර සභා ක්‍රීඩාංගනය සහ ක්‍රීඩාංගනය ආලෝකකරණය සඳහා රු.24600.00 ක අනුග්‍රහයක් සහා ආවරණ අනුමැතියට යටත්ව ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**3:2** **‘** අම්බලන්ගොඩ නගර සභාවට අයත් ගෘහස්ථ බැට්මින්ටන් ක්‍රීඩාගාරය සම්බන්ධවයි **’** මැයෙන් ශ්‍රී ලංකා බැට්මින්ටන් සංගමයේ සභාපති සුරාජ් දන්දෙනිය මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ශ්‍රී ලංකා බැට්මින්ටන් ක්‍රීඩාවට දකුණු පලාත තුලින් බිහි වූ ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගණන අති විශාල ගණනක් බවත් ඔවුන් ජාත්‍යන්තර මට්ටම තෙක් ලගා වී ඇති බවත් මොවුන් මෙම දක්ෂතා දක්වා ඇත්තේ ඉතාම අඩු පහසුකම් යටතේ බවත් මොවුන්ට තම අධ්‍යාපන කටයුතුත් සමඟ කොළඹට පැමිණ පුහුණුවීම් කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇති බවත් එම නිසා විධිමත් ගෘහස්ත බැට්මින්ටන් ක්‍රීඩාගාරයක් තිබේ නම් එය මහඟු උපකාරයක් බවත් ,අම්බලන්ගොඩ නගර සභාවට අයත් ගෘහස්ත බැට්මින්ටන් ක්‍රීඩාගාරය විධිමත් අයුරින් නවීකරණය කිරීමට ශ්‍රී ලංකා බැට්මින්ටන් සංගමය කැමැත්ත පළ කර ඇති බැවින් මෙම කටයුත්ත සිදු කර ගැනීමට අවසර ඉල්ලා තිබුණි.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඇස්තමේන්තුව තිස්හතර ලක්ෂ විසිපන්දහස් හත්සියයි සත හතලිස්පහක ඇස්තමේන්තුවක්.ඒ අය කොන්දේසියක් ඉදිරිපත් කරලනම් නෑ.

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝදතාවයක් නොමැති වූ බැවින් 2014.06.02 දින මාසික සභාවේ ඉල්ලීම පරිදි සකස් කළ අදාල ඇස්තමේන්තුව අනුව කාර්මික නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ මෙය අලුත්වැඩියා කර ගැනීමට ශ්‍රී ලංකා බැට්මින්ටන් සංගමයට අනුමැතිය ලබා දීමට ගරු සභාව තීරණය කරන ලදී.**

**3:3** ' විහාරස්ථානයේ භාවනා වැඩ සටහනක් සඳහා දින 4 කට පුටු 400 ක් නොමිලේ ලබා ගැනීම' මැයෙන් කළුවඩුමුල්ල ශ්‍රී විජයාරාමයේ මහාචාර්ය විලේගොඩ අරියදේව හිමි විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

කළුවඩුමුල්ල ශ්‍රී විජයාරාමයේ විහාරස්ථානයේ 2014.11.24/25/26 සහ 27 යන දින වලදී ඔස්ට්‍රේලියාවේ සිට පැමිණෙන ලලිත් වීරරත්න මහතා විසින් මෙහෙයවනු ලබන භාවනා වැඩ සටහන සඳහා පුටු 400 ක් නොමිලයේ ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝදතාවයක් නොවූ බැවින් කළුවඩුමුල්ල ශ්‍රී විජයාරාමයේ විහාරස්ථානයේ 2014.11.24/25/26 සහ 27 යන දින වල පැවැත්වෙන භාවනා වැඩ සටහන සඳහා පුටු 400 ක් සභා ආවරණ අනුමැතියට යටත්ව ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**3:4** ' අම්බලන්ගොඩ බස් නැවතුම්පලේ (රජයේ සහතික කළ)ඖෂධීය බාම් හඳුන්වාදීමට අවසර ලබා ගැනීම ' මැයෙන් " වාසනා" , අංක 19 ,නව මාවත , විහාරගොඩ , වතුගෙදර ලිපිනයේ පදිංචි ඇල්ෆ්‍රඩ් දයානන්ද මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

බස් නැවතුම්පලේ රජයේ බලපත්‍ර ලැබූ ඖෂධීය බාම් අලවි කිරීමට අවසර ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝදතාවයක් නොවූ බැවින් " වාසනා" , අංක 19 ,නව මාවත , විහාරගොඩ , වතුගෙදර ලිපිනයේ පදිංචි ඇල්ෆ්‍රඩ් දයානන්ද මහතාට සංචාරක වෙළඳුන් සඳහා ලබා දෙන අවසර පත්‍රයක් ලබා දීමට ගරු සභාව තීරණය කරන ලදී.**

**3:5** ' කොඩි සහ කොඩි කණු ලබා ගැනීම ' මැයෙන් සීමාසහිත අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

දැයට කිරුළ ජාතික උළෙලට සමගාමීව ලැබී ඇති ගොඩනැගිල්ලේ මුල් ගල් තැබීමේ කටයුතු 2014 නොවැම්බර් මස 18 වන දිනට යෙදී ඇති බවත් එකී උත්සවය සඳහා අවශ්‍ය කොඩි සහ කොඩි කණු 50 ක් මුදල් අය කිරීමකින් තොරව 2014 නොවැම්බර් 17 වන දින සමිතියට ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝදතාවයක් නොවූ බැවින් අම්බලන්ගොඩ සීමාසහිත විවිධ සේවා සමුපකාර සමිතියට 2014.11.17 වන දින මුදල් අය කිරීමකින් තොරව කොඩි සහ කොඩි කණු 50 ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**3:6** **'** ආණ්ඩුකරණය හා දේශපාලනය පිළිබඳ සහතිකපත් පාඨමාලාව 2015**'** මැයෙන් දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යනාංශයේ අංශාධිපති මහේෂ් සේනානායක මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

කොළඹ විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යන අංශය මඟින් ආණ්ඩුකරණය හා දේශපාලනය පිළිබඳ සහතිකපත් පාඨමාලාවක් හඳුන්වා දී ඇති අතර ඊට අදාළ නිවේදනය 2014 ඔක්තෝම්බර් මස 26 වන දින ලංකාදීප පුවත් පතෙහි පල කර ඇති බවත් මෙම පාඨමාලාව හැදෑරීම සඳහා උනන්දු වන නියෝජිතයින් සහ සේවකයින් මේ පිළිබඳ දැණුවත් කරන්නේ නම් ස්තූතිවන්ත වන බවද තවද මෙම පාඨමාලාව සඳහා සහභාගී වූ පළාත් පාලන නියෝජිතයන් වෙත අදාළ පාඨමාලා ගාස්තු එම සභාවන් මගින් ගෙවීමට යෝජනා සම්මත කරගෙන තිබූ බවද ඔබගේ දැන ගැනීම පිණිස සඳහන් කරන බවද දන්වා තිබුණි.000000

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ සඳහා රුපියල් හතලිස් හතරදාහක් ගෙවන්න ඕන.පාඨමාලා කාලය මාස 06 යි.අ.පො.උ.පෙ. විභාගය අවම වශයෙන් විෂයන් 2 ක් හෝ අ.පො.සා.පෙල විෂයන් 06 න් සමත් වීම.රාජ්‍ය පුද්ගලික නොවන ක්‍රියාකාරී වන දේශපාලනයේ වසර 05 ක පුරුද්ද හෝ රාජ්‍ය නොවන ආයතනයක වසර 10 ක පුරුද්ද තියෙන්න ඕන.කිත්සිරි මන්ත්‍රීතුමා කලානේ මේ පාඨමාලාව.

<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>

මෙය ඇත්තටම වැදගත් පාඨමාලාවක්.දේශපාලනයේ නියුතු පුද්ගලයින් හැටියට ප්‍රාදේශීය දේශපාලන නායකයින් හැටියට සමස්ථ ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින දේශපාලන සහෘදයින් හඳුනාගැනීමේ අවස්ථාව තියෙනවා.මෙම පාඨමාලාව අඛණ්ඩව කරගෙන යාම තුළ දේශපාලනික වශයෙන් උසස් අධ්‍යාපනික පිවිසුම් අවස්ථාවක් ලෙසත් සලකන්න පුලුවන්.සත්‍ය වශයෙන්ම පූර්ණ කාලීනව දේශපාලනයේ නියුතු සහෝදර ජනතා නියෝජිතයින්ට අධ්‍යාපනය බැහැර තබලා පූර්ණ කාලීනව නියුක්ත වීම සම්බන්ධයෙන් එතුමන්ලාට නැවත වතාවක් තම අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය ලැබීමේ පිපාසයෙන් සිටින පාදේශීය දේශපාලඥයන්ට හොඳම අවස්ථාවක් කියලා සලකන්න පුලුවන්.විශේෂයෙන්ම කොළඹ විශ්ව විද්‍යාලයේ දේශපාලන හා සමාජ විද්‍යා අංශාධිපති මහේෂ් සේනානායක මහත්මයාටත් අපි ස්තූතිවන්ත වෙනවා.අම්බලන්ගොඩ නගර සභාවේ සමාජිකයකුට මේ සඳහා සහභාගී වීමට සභාපතිතුමා ලෙස ඔබතුමා දක්වන සහයෝගය වෙනුවෙන් ඔබතුමාටත් සමස්ථ මන්ත්‍රී මණ්ඩලයටත් ස්තූතිවන්ත වෙනවා.

<u>තීරණය</u>

**මෙම ලිපිය ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**(04)** **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** නැත

**(05)** යථා පරිදි කල් දී ඇති යෝජනා    නැත

**5:1 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා (නිළධාරීන් විසින් සකස්කරන ලද පරිපාලන යෝජනා) :-**

**5:2 ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා :-**

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා පළාත් පාලන නියෝජිතයන්ගේ දීමනාව වැඩි කිරීම සම්බන්ධ එතුමාට සහ රජයට ප්‍රණාමය පුදකිරීමට මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කරන ලද යෝජනාව ගරු සභාපති ඇම් .ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමණි, අපි දන්නවා දීර්ඝ කාලයක් මේ පළාත් පාලන නියෝජිතයින් ඉතාමත් සොච්චන් දීමනාවකට තමයි මේ මෙහෙවර ඉටු කළේ. මෙහිදී අතිගරු ජනාධිපතිතුමා මේ සම්බන්ධව ගත්තු තීරණය සම්බන්ධව අපි , අම්බලන්ගොඩ නගර සභාවේ මන්ත්‍රීවරු විදියට අපේ ගෞරවය මේ අවස්ථාවේ පුදකර සිටිනවා.මොකද පළාත් පාලන නියෝජිතයන් කියන්නේ දානයක් ,මළ ගෙදරක් අනිවාර්යෙන්ම යන්න ඕන.එහෙම ගියහම ,දෙන ලද රු.5000.00 ක දීමනාව ඉවරයි.සමහර පළාත් පාලන නියෝජිතයින් ඉන්නවා මේ දීමනාව පමණක් අරගෙන දරු පවුල නඩත්තු කිරීම සහ පොදු කටයුතු කිරීමට බැරිව අපහසුව පත් වෙච්ච. එනිසා මේ දීමනාව වැඩි කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන ඇමතිතුමාටත්, සියලුම නිළධාරීන්ටත් අපේ ගෞරවට හා ස්තුතිය පුදකර සිටිනවා.ඒ වගේම කියන්න ඕන අතිගරු ජනාධිපතිතුමා තමයි පළාත් පාලන නිළධාරීන්ට කොන්ද කෙලින් තියාගෙන වැඩ කරන්න පුලුවන් වතාවරණයක් ඇති කළේ.මොකද එතුමා තමයි පළාත් පාලන නිළධාරීන්ට දීමනාවක් ලබා දීලා ගමේ වැඩක් කරන්න පුලුවන් ශක්තිය ලබා දුන්නේ.අපට වඩා ජේෂ්ඨ මන්ත්‍රීවරු මේ සභාවේ ඉන්නවා වසර 20-25 ක් සේවය කරන,ඔවුන් දන්නවා , මම මේ සභාවට මුලින්ම පත්වෙන කොට දීමනාව දුන්නේ රු.3000.00 යි.ඒක 5000.00 කළෙත් අපේ රජයක් යටතේ, දැන් ඒක 20000.00 කළෙත් අපේ රජයක් යටතේ. ඒක තමයි අපේ ජනාධිපතිතුමාගේ සහ අපේ රජයේ පවතින වෙනස.එබැවින් නැවතත් ස්තුතිකරනවා ජනාධිපතිතුමාට මේ සම්බන්ධයෙන්.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමණි පළාත් පාලන නිළධාරීන්ගේ දීමනාව වැඩි කිරීමක් සිදු වුනා.මම නම් මේ සභාවට පත් වෙලා ආපු නවක මන්ත්‍රී කෙනෙක්.ඔබතුමා ,අපේ විපක්ෂනායකතුමා වගේ දීර්ඝ කාලයක් මේ සභාව නියෝජනය කරන අය ඉන්නවා.ඉතින් අපි තමයි බිම් මට්ටමේ පළාත් පාලන නියෝජිතයින්.අපි තමයි ගමේ කෙනාගේ මළ ගෙදරට යන්නේ , මඟුල් ගෙදරට යන්නේ.අපෙන් තමයි මිනිස්සු දෙයක් ඕන වුනහම ඉල්ලගෙන එන්නේ.පසු ගිය දින වල ජනාධිපතිතුමා හමු වුනහමත් එතුමා කීවේ මේක ගරු සේවයක් කියලා.කොහොම වුනත් ජනාධිපතිතුමා ගත්ත මේ තීරණය පිළිබඳ ජනාධිපතිතුමා ඇතුළු සියලුම නිළධාරීන්ට මම ගෞරවනීය ස්තුතිය පුදකර සිටිනවා.මක්නිසාද යත් මේ සියලුම පළාත් පාලන නිළධාරීන් ආර්ථික අතින් ශක්තිමත් අය නෙවෙයි.ඒ ලැබෙන පොඩි වැටුපෙන් මඟුල් 02 ක් ආවොත් , මල ගෙවල් 02 ක් ආවොත් ඒ මාසෙට මේ ගෞරවනීය සේවයට ලැබෙන දීමනාව අවසන් වෙනවා. නමුත් අපි සියලු දෙනා තමයි බිම් මට්ටමෙන් මේ ජනතාවට සේවය කරන්නේ. අපි සමහරක් වෙලාවට රෑ 12 වෙනකනුත් වැඩ කරනවා, ගමේ මිනිස්සු ඇවිල්ලා මොනවා හරි කරලා ඉල්ලුවොත් අපි කවුරුත් ඒක කරලා දෙනවා.ලංකාව පුරාම ඉන්න අපි වගේ බිම් මට්ටමේ පළාත් පාලන නිළධාරීන්ට ජනාධිපතිතුමා මේ කළ දෙයට, මම දකින්නේ මෙය උපහාරයක් විදියට, එනිසා කරන ලද සේවයට ජනසාධිපතිතුමාට බොහෝම ස්තුතියි කියනවා.ඒ වගේම දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්**

මේ දීමනාව මුලින්ම දෙන්න ගත්තේ ප්‍රේමදාස මහත්තයා.මම ඒක මතක් කරන්න ඕන.1977 දී රු.300.00 න් පටන් ගත්තේ.මේ ගෞරවය මම විශේෂයෙන්ම ලබා දෙන්නේ ප්‍රේමදාස මහත්තයට.මුලින්ම පැවතියේ ගරු සේවයක්.එදා සංග්‍රහ වියදම් විදියට රු.250.00 ක් සභාපතිවරයෙක්ට වෙන් කරලා තිබුණා.ප්‍රේමදාස මහත්තයා 77 දී ,ජේ.ආර් .ජයවර්ධන මැතිතුමාගේ රජයෙන් ,එතුමා පත්කලා පළාත් පාලන නියෝජිතයින්ට රු.300.00 ක දීමනාවක්.ඒ කාලේ එක්ක බලන කොට ඒ මුදල ඉතාම වටිනවා.එතුමා එයින් නැවතුන් නෑ.ඒ වගේම පළාත් සභාවල මන්ත්‍රීවරුන්ට,සභාපතිවරුන්ට,උප සභාපතිවරුන්ට නිල බලයෙන්ම සමාදාන විනිශ්චකාරත්වයක් දුන්නේ ප්‍රේමදාස මහත්තයා.ඒවා මතක තියාගන්න ඕන.සභාපතිවරයාට සහ උපසභාපතිවරයාට වාහන පර්මිට් ලබා දුන්නෙත් එතුමා.ඒ විතරක් නෙවෙයි සභාපතිවරයෙක්ට එදා රු.1000.00 ක් තමන්ගේ අභිමතය පරිදි සභාවේ වැඩකට යොදවන්න පුලුවන් වුණා.ඒක රු.10000.00 ක් කරලා දුන්නේ ප්‍රේමදාස මහත්තයා.සභා ආවරණ අනුමැතිය යටත්ව වියදම් කරන්න අනුමැතිය දුන්නේ එතුමා.බණ්ඩාරනායක මහත්තයලා පළාත් පාලනය සේවය ඇති කළා වගේම ඒවා වැඩි දියුණු කරන්න සභාපතිවරුන්ට උපසභාපතිවරුන්ට සභිකයින්ට ප්‍රේමදාස මහත්මයා ලබා දීපු දේවල් තමයි මේ පවත්වාගෙන යන්නේ.මම කියන්න ඕන තවත් කාරණා අපි ඉල්ලුම් කරලා තියෙනවා.පළාත් පාලන ඇමතිවරු මාරු වෙනකොට ,ආණ්ඩු මාරු වෙනකොට මේ රු.300.00 ය 600.00 කරලා ඊළඟට 3000.00 කරලා 5000.00 කරලා ඊලඟට අවුරුදු 15 ට විතර කාලයකට පස්සේ තමයි මේ අද රු.15000 කරලා තියෙන්නේ.එදා මුදලේ වටිනාකම බලනකොට එදා 3000.00-5000.00 හ අද වියදමත් එක්ක බලනකොට 15000.00 කලත් අද මුදලේ වටිනාකම අඩුයි.නමුත් අපි දීම පිළිබඳ ස්තූතිවන්ත වෙනවා.ඒකත් මැතිවරණයක් ඉදිරියට තියලා තමයි ලබා දුන්නේ.අපි ස්තූතිවන්ත වෙනවා පළාත් පාලන නියෝජිතයින් විදියට.අවුරුදු 15 ට විතර පස්සේ මේ මුදල වැඩි වුණේ මං හිතන ආකාරයට.එහෙම බැලුවම මුදලේ වටිනාකම කොහොමද කියලා හිතන්න පුලුවන්.

- ගරු සභාපතිතුමා සභාවේන් මදකට ඉවත්ව යන ලද අතර ගරු උප සභාපතිතුමා මුලසුනට පැමිණෙන ලදී.

**ගරු නගර සභා මන්ත්රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්**

මම පත්තරේ දැක්කා පොදු පෙරමුණේම මන්ත්‍රීවරු කීප දෙනෙක් පළාත් පාලන ආයතන කිහිපයක කතා කරලා තිබුණා මේක මදියි කියලා,මේක වැඩි කරලා දෙන්න කියලා ඉල්ලා තිබුණා.අපි නම් කොයි වේලේවත් කීවේ නෑ මේක මදියි කියලා.එයට ඇහුම්කන් දීලා හරි ජන්දය නිසා හරි මේ මුදල වැඩි වේලා තියෙනවා දැන්.ඒක යම් කිසි සහනයක් විදියට මං දකිනවා.

- ගරු සභාපතිතුමා නැවතත් මුලාසනයට පැමිණෙන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්**

ඒ වගේම මෝටර් සයිකල් ලබා දුන්නා ,ඒකත් පාලක පක්ෂයට විතරයි ලබා දුන්නේ.විපක්ෂයට ලබා දුන්නෑ.ජනාධිපතිතුමාට තිබුණා මේ මුදල් ලබා දුන්නා වගේම බයිසිකලෙත් ලබා දුන්නනම් හරි.අපිට අවශ්‍ය නෑ , මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කියලා තියෙන්නේ අපට එතුමා ආවහම බයිසිකල් නොමිලේ ලබා දෙනවා කියලා.සියලුම ගෙවීම් කපා හරිනවා කියලා.එතනදී එක්සත් ජාතික පක්ෂයට ලබා නොදී වෙනසක් කරලා තියෙනවා.වෙනස කරලා තියෙන්නේ ,මාගේ මිනිස්සුන්ට විතරයි මම මේක ලබා දෙන්නේ , මොකද මේක ජන්දෙට පාවිච්චි කරන්න ඕන. එනිසා මේක විපක්ෂෙට දෙන්නෑ කියන මතයක තමයි මේක තියෙන්නේ, මං හිතන්නේ.කෙසේ නමුත් මේ කටයුතු වලදී මම විශේෂයෙන් ගෞරවයක් දක්වන්නේ අදත් පළාත් පාලන සේවයට යම් යම් සහනදායක දේවල් දීලා ,සභාපතිවරුන්ට නිදහස දීලා ,සභාපතිවරයෙක්ට ,උපසභාපතිවරයෙක්ට තියෙනවා නිල නොවන මහේස්ත්‍රාත් තනතුරක වැඩ බැලීමක් තියෙනවා.ඇත්ත වශයෙන්ම උසාවියට ගියහම උසාවිය දන්නෑ ,එහෙම ගියහම අපි අඬා පනත පෙන්නලා ඕන ඒ ලබා ගන්න.ඒ වගේ වරප්‍රසාද ලබා දුන්නේ ගෞරව ලබා දුන්නේ ප්‍රේමදාස මහතා.අද එතුමා නැති වුනත් ඉන්න අය හරි පළාත් පාලන නියෝජිතයින් දිරි ගැන්වීම කිරීම සහ මේ සහන ලබා දීම වෙනුවෙන් පළාත් පාලන නියෝජිතයින් විදියට මම ස්තූතිවන්ත වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමණි,උප සභාපතිතුමා ප්‍රමුඛව ගෙන ආ යෝජනාවට අපේ නායකතුමා ස්තූතිය ප්‍රකාශ කළා.නමුත් මෙහිදී උප සභාපතිතුමා සඳහන් කළා මන්ත්‍රීවරුන්ට කොන්ද කෙලින් තියාගෙන වැඩ කරන්න ජනාධිපතිතුමා ලබා දුන්නා කියලා මන්ත්‍රී ප්‍රතිපාදන හරහා.මම අහන්න කැමති සභාපතිතුමණි මම මේ සභාවට පත්වෙලා වසර 4 ක් වෙනවා.නමුත් මං හිතන්නෑ ,පළාත් පාලන නීතියෙන් නැහැ පක්ෂ විපක්ෂ කියලා දෙකොටසක්, මේ ඉන්නේ ඔක්කොම පළාත් පාලන නියෝජිතයින්.මන්ත්‍රීවරුන්ට සැලකීමේදී, ප්‍රතිපාදන වෙන් කිරීමේදී පක්ෂ මන්ත්‍රීවරුන්ට කියලා ප්‍රතිපාදන වෙන් කිරීම කරන්නේ මන්ත්‍රීවරුන්ට කොන්ද කෙලින්

තියන් වැඩ කරන්න පුලුවන් වෙන්නද කියලා මං අහන්න කැමති.පාලක පක්ෂය හෝ විපක්ෂය කියලා පළාත් පාලන නීතියේ තියෙනවද කියලා මං අහන්න කැමති.හරි නම් මෙහි අසුන්ගැන්වීම පවා කරන්න ඕන පක්ෂ විපක්ෂ විදියට නෙවෙයි , ජේෂ්ඨත්වය අනුව.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙම යෝජනා කරනවනම් ලබන ජනවාරි වල ඉදලා එහෙම අසුන් පනවන්න පුලුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

අපි 08 වෙනිදගෙන් පස්සේ එහෙම අසුන් ගන්වනවා කෙහොමත්.ගරු සභාපතිතුමණි , විපක්ෂ මන්ත්‍රීවරුන්ට එහෙම ජනතා සේවයක් කරන්න මේ වනතුරු රුපියලකවත් මුදල් වෙන් කිරීමක් කරලා නෑ.මං හිතන්නේ පළාත් පාලන ආයතන වල විතරයි මෙහෙම වෙන්නේ.පළාත් සභාව තුළ,පාර්ලිමේන්තුව තුළ පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන්ට වාර්ෂිකව කිසියම් මුදලක් වෙන් කරනවා.පළාත් පාලන ආයතන වල එහෙම නැහැ.මහජන සේවය සඳහා මුදල් වෙන් කරන්නේ පාලක පක්ෂයට පමණයි.මං හිතන්නේ මේක ලොකු අසාධාරණයක්.එහෙම නම් විපක්ෂයට වෙන්නේ ඔබතුමාලා කරන වැරදි සොය සොය ඉන්න තමයි.උප සභාපතිතුමා කරපු ප්‍රකාශය අයිති වෙන්නේ එබතුමාලගේ කොන්ද කෙලින් තියාගෙන වැඩ කරන්න විතරයි.එහෙමනම් විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ කොන්ද කැඩීමේ ප්‍රතිපත්තියක්ද අනුගමනය කරන්නේ.අපේ විපක්ෂනායකතුමා පෙන්වා දුන්න ආකාරයට පසු ගිය දින වල යතුරුපැදි ලබා දුන්නා,ඒකත් පාලක පක්ෂේ අයට විතරයි.එන කට්ටියට දෙනවා කියලා එතුමා කියලා තියෙනවා.එතුමාගේ කතාවට විරුද්ධත්වය ප්‍රකාශකරන්න කතා කළේ.මොකද විපක්ෂේ මන්ත්‍රීවරුන්ට කොන්ද කෙලින් තියන් වැඩ කරන්න නෙවෙයි කොන්ද කැඩිමේ ප්‍රතිපත්තියට මම වරුද්ධත්වය ප්‍රකාශ කර සිටිනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම මෙහෙදී ඇත්ත වශයෙන්ම අතිගරු ජනාධිපතිතුමාට ස්තූතිවන්ත වෙන්න ඕන,අපේ පළාත් පාලන මන්ත්‍රීවරුන්ගේ දීමනාව මාසිකව කිසියම් වැඩි කිරීමක් කරලා මීට වඩා හොද සේවාවක් කිරීම සඳහා අවස්ථාව සැලසීම සම්බන්ධයෙන් අපි ස්තූතිවන්ත වෙන්න ඕන.ඒ වගේම බයිසිකල් ලබා දීමත් මහජන සේවය සඳහා කරපු සේවයක් විදියට අපි දකිනවා.නමුත් මම දේව් මන්ත්‍රීතුමා කියන ප්‍රකාශය සම්බන්ධයෙන් පිළිතුරක් ඇත්ත වශයෙන්ම ලබා දෙන්න ඕන.කිසිම දවසක ආණ්ඩුපක්ෂේ මන්ත්රීවරුන්ට කියලා මුදල් වෙන් කිරීමක් කරන්නෑ.දැන් ඇත්ත වශයෙන්ම මේ කරන්නේ ජන්දේ දීලා නියෝජිතයෝ පත් කරලා මහජනතාවට සේවය කිරීමක්.නමුත් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ ක්‍රමයෙන් ඔබ්බට ගිහිල්ලා හැම ග්‍රාම සේවා කොට්ඨාශයකටම සල්ලි වෙන් කරලා තියෙන්නේ.අදාල ග්රාම සේවා කොට්ඨාසෙට මුදල් වෙන් කරලා ඒ ග්‍රාම සේවා කොට්ඨාසේ මන්ත්‍රීතුමත් එක්ක ප්‍රදේශයේ ජනතාව රැස්වීමක් තියලා ජනතාවගේ සෘජු කැමැත්ත තමයි අද ක්‍රියාත්මක වෙන්නේ. මන්ත්‍රීවරයට නෙවෙයි බලය දීලා තියෙන්නේ ජනතාවට බලය දීලා තියෙන්නේ.මේ රටේ පරමාධිපත්‍ය කියන එක තියෙන්නේ ජනතාව තුළ, මං හිතන්නේ ජනාධිපතිතුමා ජනතා පරමාධිපත්‍ය කියන වචනේ පරිසමාප්තියෙන්ම අද වන විට ඉටු කරනවා.අද නාගරික මන්ත්‍රීවරයාට වැඩිය බලයක් ජනතාවට තියෙනවා.මොකද ජනතාව තමයි ප්‍රදේශයේ පාලම , බෝක්කුව, ගමේ පාර හදන තැන ,ගමේ සොරොව්ව හදන තැන, ඇළ දොළ හදන තැන තීරණය කරන්නේ ගමේ මිනිස්සු.එනිසා මං හිතන්නේ දේව් මන්ත්‍රීතුමා වැරදි අර්ථකතනයක් මේ වෙලාවේදී කළේ.මොකද එතුමා විශිෂ්ට ජනතා මෙහෙවරක් කරන, ජනතා හඬට ඇහුම්කන් දෙන නායකයෙක් විදියට තමයි හඳුනාගෙන තියෙන්නේ.මොකද එතුමා , අපට මතකයි පෝරඹ අය වැය යෝජනා තියෙන අවස්ථාවේ ඔබතුමා තමයි මුලසුනේ හියියේ.විලේගොඩ යෝජනාකරණ කොට අපේ විපක්ෂ නායකතුමා තමයි මුලසුනේ හියියේ.පොල්වත්ත යෝජනාකරණ කොට අපේ ජනිත් මන්ත්‍රීතුමා මුලසුනේ හිටියේ.හෙප්පුමුල්ල යෝජනා කරණ කොට අපේ පුෂ්පික මන්ත්‍රීතුමා තමයි යෝජනා කළේ.මේ සියලු කටයුතු කළේ තමුන්නාන්සේලාගේ දායකත්වය ඇතිව, මහජනතාවගේ යෝජනා තමයි කරන්නේ.එතුමා නියෝජ්‍ය ප්‍රජාත්‍රන්තවාදයෙන් බැහැර වෙලා සෘජු ප්‍රජාත්‍රන්තවාදයට මුල්තැන දීලා ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කිරීමේ ක්‍රම වේදයක් මේ රටට හඳුන්වා දීලා තියෙනවා.ඒ වගේම එතුමා අදාල පළාත් පාලන නියෝජිතයින් මං ශක්තිමත් කිරීමේ ක්‍රියාදාමය ඉතාමත් වැදගත් වෙනවා.එතුමා මුලා්‍ය වශයෙන් විතරක් නෙවෙයි අපි කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ  හැඩ ගැස්ම පිළිබඳවත් යම් නියමයන් ,දර්ශනයන් අපට ලබා දෙනවා.මට මතකයි අපි පසුගිය අයවැය පැවැත්වුවට පස්සේ රාවය පුවත් පතේ පළ වුණා අම්බලන්ගොඩ අය වැය ඉදිරිපත් කිරීමේ ආදර්ශය කියලා.එතුමා ඒ ලිපිය බලලා මට දුරකතනයෙන් කතා කරලා කීවා ඉතා ප්‍රසංසනීය කටයුත්තක් , මම පළාත් පාළන ඇමතිතුමාට දැන්වුවා කියලා ,අම්බලන්ගොඩ නගර සභාවේ අය වැය හදන මේ ක්‍රමය අනෙක් පළාත් පාලන ආයතන වලත් සිදු කරනවනම් හොදයි කියලා.එතුමාට ඕන ජනතාව සමඟ සිටින ආයතනයක් ,ජනතාව සමඟ සිටින නියෝජිතයෙක් නිර්මාණය කරන්න.එනිසා මං හිතන්නේ මෙහිදී පක්ෂ විපක්ෂ කියලා මුදල් වෙන් කිරීමක් සිදු වෙන්නෑ.ඒ වෙන් කරලා තියෙන අදාල ග්‍රාම සේවක කොට්ඨාසේ සම විදියට ඇත්ත වශයෙන්ම මුළු රටේම සංවර්ධනය වෙනවා.කොට්ඨාශ 13-14 හැම එකකම එක වැඩක් හරි සිද්ධ වෙනවා. වෙනදා සිද්ධ වුණේ එහෙම නෙවෙයි ඇත්ත වශයෙන්ම.වෙනදා ඒ ග්‍රාමසේවා කොට්ඨාසේ මන්ත්‍රීවරයෙක් නැති වුනොත් කිසිම වැඩක් කරන්නෑ.මන්ත්‍රීවරයෙක් හිටියත් නැතත්, විපක්ෂ මන්ත්‍රීවරයෙක් හිටියත් එතුමා මේ රට තුළ ව්‍යාප්ත කරලා

තියෙනවා මේ රට තුළ ජනතාව ජීවත් කරවීමේ ක්‍රමවේදයක්.මේ දීමනාව වැඩි කළා වගේම ගුණාත්මක පළාත් පාලන සේවයක් ඇති කිරීම සඳහා එතුමා දක්වන මෙහෙවර පිළිබඳ ස්තුතිවන්ත විය යුතුයි.

- ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහාන් ද සිල්වා මහතා සභාවෙන් මදකට ඉවත්ව යන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමණි ,විශේෂයෙන් අපේ රටේ අතිගරු ජනාධිපතිතුමාට විශේෂ ස්තුතියක් කරන්න ඕන රු.5000.00 ක දීමනාව රු.15000.00 න් වැඩි කිරීම පිළිබඳව එතුමාටත් , එතුමාගේ නිළධාරී මණ්ඩලයටත්.ඒ වගේම අපේ උප සභාපතිතුමා ප්‍රකාශ කළා අපේ කොන්ද කෙලින් තියාගෙන වැඩ කරන්න ජනාධිපතිතුමා තමයි කියලා අවස්ථාව ලබා දුන්නේ.එතුමා මං හිතන්නේ ඒකෙන් අදහස් කළේ කළින් ඔය ප්‍රතිපාදන එච්චේ ආසන සංවිධායකවරුන්ට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට.නමුත් බිම් මට්ටමේ දේශපාලනය කරන්නේ නගර සභා ,ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්.අතිගරු ජනාධිපතිතුමා ඉතා හොඳින් තේරුම් ගෙන බිම් මට්ටමේ දේශපාලනඥයින් වශයෙන් අපට මෙම මුදල් ලබා දීලා ගම දියුණු කරන්න සහයෝගය ලබා දීම පිළිබඳ විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.ඒ වගේම අපේ කොට්ඨාශ වල ග්‍රාම සේවා වසම් වල යෝජනා ගැනීමේදී පක්ෂ විපක්ෂ භේදයකින් තොරව විලේගොඩ ජයන්ත මහත්තයාටත්, පොල්වත්ත ජනිත් මහත්මයාටත් පෝරඹ දේව් මන්ත්‍රීතුමාටත් ලබා දීලා ,එතුමන්ලා තමයි එතන මුල සුන අරගෙන ඒ යෝජනා ලබා දුන්නේ.ඒ වගේම ඒ තැන් වල වැඩ බලන්නත් අපේ ආණ්ඩුපක්ෂේ මන්ත්‍රීවරු යන්නේත් නෑ සභාපතිතුමණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**

අපි මුලසුනේ වාඩි කරවලා ඉන්නවා තමයි.මිනිස්සු අපටනේ බනින්නේ.අද විලේගොඩ ආවේ 06 දෙනයි. මිනිස්සු කීවා නෑ ජයන්ත අයියා ඕකට යන්න ඕන නෑ, ඔය එක වැඩක්වත් කරන්නෑ කියලා.එනිසා අපි එන්නෑ, කියන්න මෙන්න මේ පාරවල් ටික හදලා දෙන්න කියලා.කාණු ටික බැදලා දෙන්න කියන්න කියලා.මම දැන් කියන්න ඕන විලේගොඩ එදා මුලසුනට මගෙයි මෙතුමාගෙයි දෙන්නගෙම නම් දාලා තිබුණා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**
අපේ ඒවයේදිත් එහෙම දාලා තිබුණා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**
තමුන්නාන්සේගේ ඒකේ හිටියේ තමුන්නාන්සෙයි ලක්ෂ්මි මන්ත්‍රීතුමියයි.එහෙම දාලා තිබුණ නිසා තමයි මිනිස්සු තවත් ආවේ නැත්තේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ඉතින් අපේ කොට්ඨාස වලටත් තව අය දාලා තිබුණා.ගිය පාර පෝරඹ අපේ ගරු දේව් මන්ත්‍රීතුමා හිටියේ.මම දැක්කා එතුමා මුළු දවසෙම එතන හිටියා.මං දැක්කා ජනිත් මන්ත්‍රීතුමත් පොල්වත්තේ කරන කොට හිටියා බලාගෙන.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ජයන්ත මහත්තයාගේ ගෙවල් පාර හදද්දී උදේ ඉඳන් හවස් වෙනකම්ම එහාට යනවා මෙහාට යනවා , තාර අඩුයි කියනවා. බොරු බලන්නැහැ කියන කතාව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

කොහොම වුනත් සභාපතිතුමණි එතුමන්ලාගේ කොට්ඨාශ වලත් වැඩ කරනවා.එතුමන්ලාටත් ජන්දේ ලැබෙයි.දේව් මන්ත්‍රීතුමා කීවා 08 වෙනිදාගෙන් පස්සේ බලමු කියලා මොකද වෙන්නේ කියලා.අපේ පක්ෂේ ඉදපු මහ ලේකම්තුමා මෛත්‍රිපාල සිරිසේන මහතා මං ඉතා ගරු කරන මහතෙක්.මම රූපවාහිණියේ ප්‍රවෘත්ති බලලා තියෙනවා කිසිම වැඩසටහනක එතුමා කාගෙන්වත් වචනයක් අහපු කෙනෙක් නෙවෙයි.බොහොම බුද්ධිමත්ව නීතිගරුකව කටයුතු කරපු කෙනෙක්.මම බොහොම ගරු කළ කෙනෙක්.නමුත් දැන් මට හිතෙනවා මේ අවුරුදු 09 ක් දේශපාලනය කළ මට තරම්වත් මොළයක් නෑ කියලා එතුමාට.මොකද ඒ වගේ විපක්ෂයකට ගිහින් ජනාධිපතිතුමාට විරුද්ධව ජන්දේ ඉල්ලන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා,ප්‍රාදේශීය ජන ප්‍රධානින් සවි බල ගැන්වීමට අපේ රාජ්‍ය නායකයා විධිමත් වූ පියවර අරගෙන.මේ අවස්ථාවේදී දීමනාව වැඩි කිරීමෙන් පමණක් එතුමා සෑහීමකට පත් වෙලා නෑ.සවි බල ගන්වන මේ ග්‍රාමීය මට්ටමේ පාලකයින්ට ගමන් පහසුව සැලසීම සඳහාත් එතුමා කටයුතු සැලසීම පිළිබඳ මේ

අවස්ථාවේ ස්තුතිය එල කරමින් , මෙය ඉවසාදරාගත නොහැකි අමනෝඥ ඇතමුන්ට අපේ සුභ පල කරන අතර ජනාධිපතිතුමාගේ අනාගතය ප්‍රභාෂ්වර වේවායි පතමින් මම නවතිනවා.ස්තුතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>**

අපේ උප සභාපතිතුමා යෝජනාවක් සකස් කරලා දීලා තියෙනවා,මන්ත්‍රී දීමනාව වැඩි කර දීම සම්බන්ධයෙන් ස්තුතිය එල කරලා.මමත් එයට හිස නමා ස්තුති කරනවා.ඒක ප්‍රශ්නයක් නෑ.මොකද ඒ යෝජනාව තුළ තියෙන සේරම දේවල් ඇවිස්සිලා ආවා.ඒවටත් උත්තර දෙන්න ඕන,මෙතුමාගේ තියෙන අමනෝඥ වගේ අමුතු වචනත් අහගෙන.මං හිතන්නේ දේව් මන්ත්‍රීතුමා මතු කළ කාරණය උඩ තමයි මේ දේවල් බොහෝ දුරට මතු වුනේ.මන්ත්‍රීවරුන්ට සැලකීම, මන්ත්‍රී වැටුප වැඩි කිරීම ,ගරු සේවයක් විදියට මේ ප්‍රදේශයේ නියෝජිතයින් පත් කළ ආකාරය , අද වෙන තුරු දීමනා ලබා දීම සම්බන්ධයෙන් එක එක රජයන් එක එක තීරණ අරගෙන අද මේ තත්වයට ඇවිල්ලා තියෙනවා.අපි ඇත්ත වශයෙන්ම කීවේ නෑ පහුගිය දවස් වල ඇහුවම , මගෙන් විශේෂයෙන්ම අහනවා මම රජයේ සේවකයෙක් නිසා ඔයාට වැටුප් දෙකක් ලැබෙනවා නේද කියලා.මම කියනවා මට රජයේ සේවකයෙක් විදියට වැටුප ලැබෙනවා.මේක දීමනාවක් කියලා.මේක දීමනාවක් වුනත් මම කියන්නෑ.මොකද රුපියල් 5000.00 කියන්න ලැජ්ජයි.අද කම්කරුවෙකුත් රුපියල් 13000.00 න් තමයි වැටුප් පටන් ගත්තේ.සමහර වේලාවට මේ ලැබෙන දීමනාව මේ සභාවෙදිම ඉවර වෙන වෙලාවලුත් තියෙනවා.මොකද දානේ පළ ,මළ ගෙදර,මඟුල් ගෙදර මේවට සහභාගී වෙන්නත් මේ දීමනාව මදි.අපි ගමේ මළ ගෙදරට ,මඟුල් ගෙදරට, බණ ගෙදරට සහභාගී නොවුනොත් අපට ඒක බලපානවා අපේ දේශපාලන ගමන් මඟට.ඉතින් අපි ණය වෙලා හරි මේ කටයුතු කරන්න ඕන.මං හිතන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඉතාමත්ම සහන අය වැයක් ඉදිරිපත් කරලා තියෙනවා.ඒ අය වැයේවත් නොතිබුණ දෙයක් මේ දීමනාව වැඩි කිරීම.ඉතින් මං හිතන්නේ හොඳයි.නමුත් මෙතනදී මන්ත්‍රීවරුන්ට දෙවිදියකට සැලකීම පිළිබඳ අපි කණගාටු වෙනවා.මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරු විදියට අපි තමයි බිම් මට්ටමේ සංවර්ධනප කටයුතු වලට ගෙයින් ගෙට යන්නේ.ඉතින් අපි අනන්තවත් කියලා ඇති අපට අඩුම ගානේ මෝටර් සයිකළයක්වත් දෙන්න කියලා මේ සභාවේ.නමුත් දුන්නේ නැහැ.මේ සභාවේ අපි මහ ඇමතිතුමාටත් ස්තුති කළා ගෙවීමේ ණය පදනමක් මත හරි එතුමා අපට බයිසිකලයක් ලබා දුන්නා.ඒක තාමත් වැටුපෙන් කැපෙනවා.අපි කියන්නේ එවැනි ආකාරයෙන් බයිසිකල් දීලා පාලක පක්ෂය ශක්තිමත් කරලා තියෙනවා.සමෘද්ධි නියාමකවරු ගොවි නියාමකවරු ශක්තිමත් කරලා තියෙනවා.නගර සභාවෙත් යම් යම් නිළධාරීන්ට ලබා දීලා තියෙනවා.නමුත් අද මිනිස්සු කතා කරනවා රු.50000.00 ට බයිසිකලයක් දෙනකොට , ලක්ෂ 2 ට ආසන්න මුදලක් වෙළඳපලේ තියෙනවා.එතකොට ආණ්ඩුව මෙතෙක් කාලයක් කොච්චර බදු මුදලක් අයකරලා තියෙනවද.අද මේ ආණ්ඩුවේ විශේෂම ආදායම බදු.ඉතින් මෙච්චර කාළයකට උපයාගත්ත බදු ආදායමෙන් ඉතාම සොච්චමක් තමයි මේ මන්ත්‍රීවරුන්ට ලබා දෙන්නේ.මෙතෙක් කාළයක් ඒ බදු මුදල් කොහේ ගියාද දන්නෑ.අද මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා, රාජිත සේනාරත්ත මැතිතුමා එතන තිබ්බව පීඩනය ගැන කියනවා.අද බලන්න තමුන්නාන්සේලාට සලකන්න හැම ගමකටම දෙනවා කොන්ත්‍රාත්.මහ නැඟුම ,දිවි නැඟුම මේ සියලු කොන්ත්‍රාත් එනවා.මේ කොන්ත්‍රාත් එන්නේ ඔබතුමන්ලා ශක්තිමත් කරන්න.ඔබතුමන්ලා තමයි ඒවයෙන් ශක්තිමත් අය වෙලා ,ඇති හැකි අය වෙලා තියෙන්නේ.ප්‍රාදේශීය සභාවේ පුටසයිකලෙන් ආපු මන්ත්‍රීවරු අද යාන වාහන වලින් යනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා ,මෙතුමා මේ වැරදි ප්‍රකාශ කරනවනේ.එහෙම ප්‍රකාශ කරන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>**

මම කීවේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් කියලා.බටපොල කියලා කීවනේ මම.පුටසයිකලෙන් ප්‍රාදේශීය සභාවට තේරීලා අද යාන වාහන වලින් යන තත්වයට පත්වෙලා තියෙනවා.සුඛිත මුදිත වෙලා තියෙනවා.සමහරක් මන්ත්‍රීවරු හොදට හැදිලා තියෙනවා.හැදිච්ච මන්ත්‍රීවරු ඉන්නවා.ඒවා අම්බලන්ගොඩ නගර සභා සීමාව තුළ මම හේතු සාධක ඇතිව පෙන්නන්නම්.මම දන්නෑ කවුද මේ කොන්ත්‍රාත් එක කළේ කියලා.හැබැයි අද මේ පාරවල් වල යන්න බැරි තත්වෙට පත්වෙලා තියෙනවා.විශේෂයෙන්ම තේ වත්ත පාර.තමුන්නාන්සේ ගිහිල්ලා බලන්න යන්න පුලුවන් ද කියලා ඒ පාරේ.මේවා දුන්නේ සමිති හරහා.අපි දන්නෑ මේවා පිටිපස්සේ ඉන්නේ කවුද කියලා.ජනාධිපතිතුමා දෙනවා ඇති අවංකවම මහ නැඟුම.ඒත් ගමේ ඉන්න දේශපාලඥයා හෝ කවුරුන්ම හෝ මේ මුදල් කොහෙන් හෝ ගසා කනවා.මේ පාරවල් මාස දෙකෙන් තුනෙන් කැඩෙනවා.හල් වතුර පාර ගිහිල්ලා බලන්න.අද පාර උඩින් තාර දාලා පැච් කරනවා.පත්තර වාර්තාකරුවන්ට බලන්න පුලුවන් ගිහිල්ලා.මං කියන්නේ බොරුද කියලා.තව දළුක්කන්ද පාර ,සුමනදාස මාවත ගිහිල්ලා බලන්න ඒත් ඒ විදියයි. මේ වගේ හරස් පාරවල් තැනින් තැන ඔහොමයි.මොකද වාහනයක් ගියොත් ඒ පාරේ වැඩි කල් යන්න වෙන්නෑ.ජනතා මුදල් ගසා කාලා තියෙන්නේ.අද මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා කියනවා චීනෙත් එක්ක ගනුදෙනු කරනවා කිසිම දෙයක් නෑ කොන්ත්‍රාත් , ටෙන්ඩර් මොනවත් නෑ.මේවා අන්තිමට කොහේ යනවද දන්නෑ කියලා.ඒ වගේ දූෂණයක් වෙනවා කියලා අද ඒ රජයේ මහලේකම්තුමා කියනවා.විශාල මුදල් අක්‍රමිකතා වෙද්දී අපෙන් ගන්න බදු මුදලෙන් තමයි මේ ගසා කෑම වෙන්නේ.විශාල දූෂණයක් වෙනවා.ඒකට ජනතාව නිසි පිළිතුරු දෙන්න බලාගෙන ඉන්නවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තුළ විශාල

පිරිසක් ඒකට පෙළ ගැහෙමින් ඉන්නවා.එවා ඉදිරියේදී ජනතාවට තීරණය කරන්න දෙමු.අයවැය යෝජනා වල මූලසුන දැරීම ගැනත් කියන්න ඕන.මම ඉස්සෙල්ලම ගියා මූලසුන දරණ නිසා සහ ගමේ තියෙන දෙයක් නිසාත්. මොකද මූලසුනට මගේ නම දාලා ගමේම පෝස්ටර් ගැහුවම, මම මූලසුනට නොගියොත් මිනිස්සු බනින්නේ ජනිත් වික්‍රමතිලකට.මම ගියා.මොකද මට බය නැතිව යන්න පුලුවන්.ඔබතුමා බයට හෝ ආවේ නෑ.ඔබතුමා තමයි මේකේ සභාපති.

__ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__
ජනාධිපතිතුමා කැඳවීමක් කළා සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන්ට.අපට ඒකට යන්න සිද්ද වුණා.නමුත් අපි නිළධාරීන්ට උපදෙස් ලබා දුන්නා රැස්වීම ඔබතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් කරන්න කියලා.

__ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්__
ගියපු නිළධාරීන් මෙතන නැනේ.ගියපු නිළධාරීන් දැක්කා ගිය වර ඉදිරිපත් කරපු යෝජනා වලින් රු.20000.00 ක එකක් විතරයි පොල්වත්තේ කරලා තිබුණේ.මිනිස්සු අන්න ඒක අහන්න හිටියේ.පොල්වත්ත ක්‍රීඩා පිට්ටනියේ වැසිතකිළියක් ප්‍රතිසංස්කරණය කරන එක විතරයි කරලා තිබුණේ.ලේකම් මහත්තයා ගියානේ.ඔබතුමාගෙන් ඇහුවනේ.අලුත් යෝජනා සහ ඒ යෝජනා සියල්ලම මේ කෙටුම්පතටත් ඇවිත් තියෙනවා.ජනතාව මුලා කරන්න බෑ.ජනතාව ඒකට සහභාගීත්වය මුල් අවස්ථාවේ කමිටු රැස්වීම ඔබතුමා ප්‍රසිද්ධ කරන කොට විශාල පිරිසක් සහභාගී වුණා.මං ඒකටත් ගියා.ගියවර කරපු යෝජනා ඉටු නොකලම එවත් ආදගන තමයි මිනිස්සු මේපාර ඒවට එන්නේ.මම දන්නෑ ජනාධිපතිතුමා කැඳවුවද කවුරු කැඳවුවද කියන්න.නමුත් තමුන්නාන්සේ ඒක මග හැරියා. මම බය නැතිව මූණ දුන්නා ඒකට.මම කීවා සභාපතිතුමා කොසේ වෙතත් මං ලේකම් මහතාට සහ සියලුම නිළධාරීන්ට කීවා මේ සියලුම චෝදනා ඒ ආකාරයෙන්ම සභාපතිතුමාට කියන්න කියලා.මම දන්නෑ කිවුවද නැද්ද කියලා.මම කියන්නේ ඔබතුමාට සුද්ධ සිංහලෙන් බනින්න තමයි මිනිස්සු බලන් හිටියේ.ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සභාපති සංගමයේ ධනසිරි මාදුවගේ විශාල දෝෂා රෝපනයක් කළා.ඔබතුමා නාපු එකට කනගාටුව ප්‍රකාශ කළා.මේවට උත්තර දෙන්න ඕන සභාපතිතුමා කීවා.එහෙමයි ගමේ මිනිස්සුන්ගේ ප්‍රතිචාර.මේ දේවල් මෙතනින් පැන නැග්ග නිසා මම මේ දේවල් කීවේ.නැතිනම් ස්තුතිය විතරයි කරන්න හිටියේ.කොහොම වෙතත් අපට කොන්ද කෙලින් තියන් වැඩ කරන්න මුදල් නොදුන්නත් ගමේ මළ ගෙදරට,මඟුල් ගෙදරට යම් මට්ටමකින් හෝ කොන්ද කෙලින් තියන් යන්න පුලුවන් වෙන්න දීමනාව වැඩි කිරීම සම්බන්ධයෙන් මගේ ගෞරවය ජනාධිපතිතුමාට පුදකර සිටිමින් මම නිහඬ වෙනවා.ස්තුතියි.

- ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා සහ ජේ.ඩබ්.ජයන්ත මහතා සභාවෙන් ඉවත්ව යන ලදී.

__ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්__
ප්‍රථමයෙන්ම උප සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන්.පක්ෂ විපක්ෂ බේදයකින් තොරව අදහස් ප්‍රකාශ කිරීම සම්බන්ධයෙනුත් ස්තුතිවන්න වෙනවා.ඒ වගේම විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළ දේවල් සම්බන්දයෙන් අදහසක් ප්‍රකාශ නොකලොත් ඒක යුතුකම පැහැර හැරීමක් වෙනවා.අපේ විපක්ෂනායකතුමා ප්‍රකාශ කළ අකාරයට ප්‍රේමදාස මැතිතුමා කරපු දේවල් වලට අපිත් ස්තුතිවන්ත වෙනවා.එතුමාට අමතක වෙලා ඇති ප්‍රේමදාස මහත්තයා ජේ.ආර්.ජයවර්ධනත් එක්ක විවෘත ආර්ථිකය ගෙන එද්දි ,රටේ පැවැති මේ ප්‍රවාහයට රට තල්ලු කරලා තියෙන්නේ 77 දී තමයි.ඒක ඇත්ත.ඉතිහාසය ඒක කියනවා.තමුන්නාන්සේලාගේ හෘර්ද සාක්ෂිය ඒක කියනවා.සාම විනිසුරුකම් මන්ත්‍රීවරුන්ට දුන්නා වගේ ගෝනවල සුනිල් වගේ අයටත් දුන්නා.ඔබතුමාලට පුලුවන්නම් ,අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලයේ සිදු වෙච්ච හෝ ඉදිරියට පවතින කාලයේදී විපත්තියක් වේවි කියලා එබතුමාලට සැක සිතෙන හෝ එක කාරණයක් කියන්න පුලුවන් නම් බලන්න.මෝටර් බයිසිකල් දීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමණි,අතිගරු ජනාධිපතිතුමා ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රීවරුන්ට වගේම තමුන්නාන්සේලාගේ ඉල්ලීමක් තියෙනවා විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ ,තමුන්නාන්සේලාගේ සංසදයක් ඇති මං හිතන්නේ එහෙමවත් සංසදයක් නෑ කෑ හැහුවට.විපක්ෂයේ පළාත් පාලන මන්ත්‍රීවරුන්ගේ සංසදයක්වත් නෑ මෙතුමන්ලා මේ ආණ්ඩුපෙරලන්න ,ආණ්ඩුපිහිටන්න කතා කළාට.ජන්දපොළ නියෝජිතයෙක් තාම පත් කරගන්න නෑ.එහෙම තත්ව වට පිටාවක් තියෙන්නේ.මෙතුමන්ලාට තියෙන්නේ පික් පොකට් ගැහීමේ න්‍යායක්.මේ තියෙන යම් යම් අඩු පාඩු කම් අතර ඉතිහාසයේ තියෙනවා රට පවා දීම්.ජනවාරි 09 වෙනිදට මේ කාලහෝරාවට තමුන්නාන්සේලා අපි එකතුවෙමු මෙතනට මොකක්ද තත්වය ,රටේ ඉතිහාසය කොහොමද වෙනස් වෙන්නේ කියලා බලන්න, බුද්ධිමත් ජනතාවක් ඉන්න රටක.තමුන්නාන්සේලා කීවා මෝටර් සයිකල් පිළිබඳ යෝජනාවක් කළා , ආණ්ඩුපක්ෂයට විතරයි දුන්නේ කියලා.ගරු ජනාධිපතිතුමා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ඇහුම්කන් දෙනවා.එතුමා ප්‍රකාශයට පත්කළා.තමුන්නාන්සේලාගේ ඒවත් දෙනවා.මේ ජන්දේ නිසා දීපු දේවල් නෙවේ.මහින්ද චින්තන වැඩ පිළිවෙළවල් පසු ගිය අයවැයෙන් යෝජනා කරපුවා.අනෙක මෙතුමා මෝටර් සයිකල් දුන්නෑ කියනවා , දුන්න බයිසිකලේවත් ගත්තේ නැනේ .අපේ සහෝදර දේව් මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ නොසිටීම සම්බන්දයෙනුත් ,අපේ එක්සත් ජාතික පක්ෂයේ හිටපු සංවිධායකතුමත් නොසිටී සම්බන්ධයෙනුත් මම කණගාටු වෙනවා.කොන්ද කඩපු අතීතයක් ගැන මෙතුමන්ලා කිවුවා.මෙතුමන්ලාට අමතකයි 2002 දී මාස 22 ට මෙතුමන්ලා පත් වෙච්ච අවස්ථාවේ අපේ ශ්‍රී ලංකා නිදහස්

සංවිධානේ පාක්ෂිකයෝ 800 ගණනකගේ කොන්ද කැඩුවා ඔබතුමන්ලා ශාරීරිකව.10000 කට අධික ප්‍රමාණයක් සිර ගෙවල් වල දුක් වින්දා.තමුන්ගේ බිරින්දෑවරුන්ට දරුවන්ටවත් බලන්න යන්න දුන්නෑ.එහෙම අතීතයක් තියෙන මෙතුමන්ලා කියනවා විපක්ෂයේ කොන්ද කැඩුවා කියලා.මෙතුමන්ලා ඒක ප්‍රතයක්ෂ කරලා නිරීක්ෂණයකින් තොරව ඒ සියල්ල කළා.ගෝන බිල්ලෝ අතීතයක් තිබුණ මෙතුමන්ලා 60000 ක් වදකාගාර වල පිච්චුවා.අපට බොහොම ආවේගශීලී වෙනවා සහෝදර මන්ත්‍රීවරු කියන දේවල් වලට ගරු සභාපතිතුමණි.විස්කි වීදුරුව අතේ තියාගෙන කකුල් දෙක උඩ ගහගෙන බටලන්ද වදකාගාරයේ ඔබතුමන්ලාගේ නායකතුමා රනිල් වික්‍රමසිංහ මැතිතුමා කරපු කියපු දේවල් වලට සාක්ෂි ඇතිව දේවල් තියෙනවා.සූරියකන්ද සිසු ඝාතණය ,තමුන්නාන්සේලා කොන්ද කැඩුවේ අන්න එහෙම.තමුන්නාන්සේලා ලේ නොබී පුච්චලා කෑවා.තමුන්නාන්සේලා ඒ වෙනුවෙන් කිසිදු පාපෝච්චාරණයක් තවම කරලා නෑ.තමුන්නාන්සේලා ඒ අතීතය අමතක කරලා ඒ වගේ අතීතයකට යන්න තමයි හදන්නේ.රටේ පාවා දෙන්නන් රාජසිංහ රජුගේ කාලෙත් හිටියා.අදත් වෙන්නේ ඒ දේවල් තමයි. තව දෙයක් කියන්න ඕන සභාපතිතුමා ගිරාදුරුකෝට්ටේ ,සූරියවැව, මැදිරිගිරිය,මාවතලන්ද,ලුණුගමේවහෙර වගේ ප්‍රදේශ වල ඉන්න හේන් ගොවියා හේන වපුරලා නියං සායකට මේ කන්නේ හේන අහු වුනොත් කියලා සාමාන්‍ය සාම්ප්‍රධාය තියෙනවා දඩ මස් ටිකක් එහෙම වේලලා , මී පැණි ටිකක් එකතු කරගෙන ස්ටැන්බයි ඉන්නවා දුර්භික්ෂයට මුහුණ දෙන්න.අඩුගානේ මෙතුමන්ලාගේ එහෙම සැලසුමක්වත් තියෙනවද.අවුරුදු 20 ක් තිස්සේ ජනාධිපති අපේක්ෂකයෙක් තෝරගන්න බැරි තමුන්නාන්සේලා මේ ආණ්ඩුවක් ගැන සිහින මවනවා. ගිරාදුරු කෝටටේ ගොවියන්ට තියෙන සංවිධාන ශක්තිය නැති තමුන්නාන්සේලද ආණ්ඩු පිහිටන්න, රට භාර ගන්න කතා කරන්නේ.ගරු ෆොන්සේකා මැතිතුමා ජන්දෙට ආවා.මෙතුමන්ලා එතුමාව කරේ තියාගෙන ගියා.නමුත් එතුමාම අවසානේ ප්‍රකාශයක් කළා එතුමාගේ බිරිඳ සහ දරුවන් පමණයි එතුමාගේ දුක සැප බලන්න හිටියේ කියලා.එතකොට පක්ෂය ප්‍රතිපත්ති වශයෙන් ගනිපු තීරණයක්නම් දුකේදී සැපේදී දෙකේදීම එතුමා සමඟ ඉන්න ඕන.අපි බලන තරම්වත් එතුමන්ලා බැලුවේ නෑ. එතුමන්ලා දන්නෑ එන අපේක්ෂකයගේ පාට කළුද සුදුද කියලා.තාම පක්ෂේ පාට ,ලකුණ තීරණය කරලා නෑ.අවුරුදු 20 ක් තිස්සේ පොදු අපේක්ෂකයෙක් සොයා ගන්න බැරි මෙතුමන්ලා දිගින් දිගටම කියනවා ආණ්ඩුවක් පිහිටවනවා කියලා.තව දෙයක් සභාපතිතුමණි, විලේගොඩ එක වර පාරවල් 4 ක් සංවර්ධනය කළා , අපි ඔබතුමා එක්ක වාද කළා මතකයි ඒ අවස්ථාවේ සංවර්ධනයේ අරුණෑල්ල මහ අම්බලන්ගොඩටත් දෙන්න තල්ගස්ගොඩටත් දෙන්න කියලා.විලේගොඩ ජනතාවට අපි එහෙමයි සලකලා තියෙන්නේ.මෙතුමා ඔට්ටු තිබ්බා හීන් ඇළ පාර කරන්න මේ සභාවට ශක්තියක් නෑ කියලා.ලක්ෂ 26 ක ඇස්තමේන්තුව ඉදිරිපත් කළාම.නමුත් ඒ සියල්ල සංවර්ධනය කරලා ගං වතුර තත්වය පාලනය කරලා ඇළ මාර්ග සියල්ල හදලා ඒ සංවර්ධන කටයුතු සිදු කෙරෙනවා.තව දෙයක් කියන්න ඕන සභාපතිතුමණි ,හිතට එනවා ගොඩක් දේවල් කියන්න.ඒත් මෙතුමා විතරක් ඉන්න තැන කියලා වැඩක් නෑ.අපි ඒවා ජනතාව ඉදිරියට ගෙනියනවා.සියලුම පිල් එකතුකරලා විපක්ෂයේ යම් අපේක්ෂකත්වයකට පිවිසුම් වෙන්න ,නායකත්වයකට උරුමකම් කියන්න පුලුවන් නායකයෙක් විපක්ෂයෙන් ඉදිරිපත් වුනේ පසු ගිය ජනාධිපති මැතිවරණයේදී සභාපත්තුමණි.ඒ අපේ ගමේ ඉපදුන ජෙනරල් ෆොන්සේකා මැතිතුමා.අපි එතුමාට නිසි බුහුමන් අපේ සභාවෙන් ලබලා දුන්නා ඔබතුමා ප්‍රමුඛ අපි සියලු දෙනාම අම්බලන්ගොඩ ජනතාව සමඟ.රටේ තීරණාත්මක අවස්ථාවකදි ඒ වගේම නිසි තැන ඉදගන අම්බලන්ගොඩ ජනතාව වැඩි ජන්ද 15000 න් නගරයේ ඉපදුන එතුමාට නිසි පිළිතුරු දුන්නා එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ වැඩි ජන්ද 15000 න් ජනාධිපති අපේක්ෂකයා දිනවලා.ගිය වර ජනාධිපතිවරණයේදී ලක්ෂ 18 ක වැඩි ජන්ද වලින් ජයග්‍රහණය කළේ විපක්ෂයේ උපරිම ගොනු කිරීම තිබුණ ජෙනරල් ෆොන්සේකා මැතිතුමා ජන්ද ලක්ෂ 18 න් තමයි පරාජයට පත්වුනේ.එහෙම නම් ගරු සභාපතිතුමණි අපි විශ්වාස කරනවා එළඹෙන මැතිවරණයේදී වැඩි ජන්ද ලක්ෂ 20 න් අපි ජයග්‍රහණය කරනවා කියන විශ්වාසය ඇතිව ජෙනරල් ෆොන්සේකා මැතිතුමා ජනාධිපති අපේක්කයා විදියට තරඟ කළ අවස්ථාවේ වැඩි ජන්ද 15000 න් ඒ ගිහිපු ජයග්‍රහණය මේ වතාවේදි වැඩි ජන්ද 20000 කට නොවැඩි සංඛ්‍යාවකින් ජයග්‍රහණය කරනවා කියන විශ්වාසය ඇතිව, තමුන්නාන්සේලාට ස්තූතිවන්ත වෙමින් නිහඩ වෙනවා.

## <u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමණි, මුලින්ම කණගාටු වෙනවා මන්ත්‍රීවරුන් අපේ රජයට දෝෂාරෝපණය කරලා ,පිළිතුරු කතාව කරද්දි මේ සභාවේ රැදී නොසිටීම සම්බන්ධයෙන්.ඒ වගේම මේ යෝජනාවට සහයෝගය දැක්වීම සම්බන්ධයෙන් ස්තූතිකරනවා.ඒ වගේම මේ යෝජනාව ගෙනාවම ඒක හොදයි කියලා ඒ හරහා අපේ රජයට යම් දෝශාරෝපනයක් ගෙන ආවා.අපි ඒකට පිළිතුරු දිය යුතුයි.ගරු සභාපතිතුමා අපට කවදාවත් සල්ලි දුන්නෑ.ග්‍රාමසේවා කොට්ඨාශ වලට සල්ලි දුන්නේ.අපේ දේව් මන්ත්‍රීතුමා කරපු ඉල්ලීම් කිහිපයක්ම අපි කරලා දීලා තියෙනවා.මට මතකයි එතුමාගේ ගෙදර පාරත් අතිගරු ජනාධිපතිතුමා දීපු සල්ලි වලින් හැදුවේ.ඒ වගේම එතුමාගේ ව්‍යාපාර කටයුතු කරන ස්ථානය මේ ළඟදි සංවර්ධනය කළා.ඒවත් අතිගරු ජනාධපතිතුමා දීපු මුදල් වලින් කළේ.එතුමාගේ මහ ගෙවල් ළඟ කාණුව ලක්ෂ 4 ගාණක්,ඒකත් ජනාධිපතිතුමා දීපු සල්ලි වලින් කළේ.එහෙම කරලා තියෙද්දි කියනවා කොන්ද කඩනවා කියලා.අපි පාලක පක්ෂයේ මන්ත්‍රීවරු.අපට විශේෂ සැලකිල්ලක් අපේ රජයෙන් තියෙනවා.අපි විතරක් නෙවෙයි, විපක්ෂයේ රජයක් ආවොත් එතුමාලට සලකාවී.අපේ රජය අපේ ජනාධිපතිතුමා යටතේ අපේ මහ ඇමතිතුමා යටතේ අපට වැඩක් කරන්න පුලුවන් ශක්තිය එතුමාලා ලබා දෙනවා.ඒක තමයි මේ සභාව දිගින් දිගටම තුන් වරක් අපේ ගරු සභාපතිතුමා සභාපතිවරයා වුනේ.මම මේ සභාව නියෝජනය කළේ 1997 අවසාන මන්ත්‍රීවරයා වශයෙන් සම් සභාවට තේරීපත් වුනේ.අවුරුදු 10 ක් යනකොට මම මේ සභාවේ උප සභාපති දූරයට පත් වුනේ අපි ජනතාවත් එක්ක

වැඩ කරපු නිසා.හොරකම් කරපු නිසා නෙවෙයි.දේව් මන්ත්‍රීතුමාලා අවුරුදු 04 ක් ඇතුලත ඇවිල්ලා, අපි දන්නවා එතුමාව පත් කළ ජනතාව පක්ෂ භේදයක් නැතිව එතුමාට ඡන්දය දුන්නා.අපි දන්නවා අපිත් එක්ක මිනිස්සු කොච්චර දොස් කියනවද කියලා අද එතුමාට.ඒ වැඩ නොකරපු නිසා.ඒ වගේම අපේ ජයන්ත මහත්තයා ප්‍රකාශ කළා සභාපතිතුමණි, බයිසිකල් එතුමන්ලාට දෙන්නේ නෑ කියලා.ගරු ප්‍රධාන අමාත්‍යතුමා දීපු බයිසිකලේවත් ගත්තේ නෑ එතුමා.ඒ වගේම එතුමා අවුරුදු 30 ගාණක් මේ සභාව නියෝජනය කළ මන්ත්‍රීවරයා.එතුමාට ඔය තරම් ජනතාවක් ඉන්නවනම් අවුරුඅදු 30 ගාණක් මේ සභාවේ ඉදලත් මේ සභාවේ සභාපතිවරයා වෙන්න බැරි වුණා.මං මේ සභාවට ඇවිල්ලා වෙන්නේ අවුරුදු 10 -12 විතර.ඒ කාලෙට අපි ජනතාවත් එක්ක වැඩ කළ නිසා අද මේ තත්වේ ඉන්නවා.මං දැක්කා එතුමා මහ ලේකම්තුමා පොදු අපේක්ෂකයා බවට පත් කළ දවසේ අම්බලන්ගොඩ ටවුන් එකේ රතිඤ්ඤා වගයක් පත්තු කරනවා.අපට මතකයි ජනිත් මහත්තයා අපේ හිටපු එක්සත් ජාතික පක්ෂ සංවිධායකතුමාට අපි සුභ පැතුවා ,එතුමාට සංවිධායක දූරය ලැබුණ දවසේ.අඩුම ගානේ එතුමාටවත් නොකිය තමයි සංවිධායක දූරය අයින් කළේ. 1991 ඉඳලා 2007මේ වෙනකොට එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරු කී දෙනෙක් පත් කළාද මේ අම්බලන්ගොඩට.අවුරුද්දෙන් අවුරුද්දට මාරු කළා.විශේෂයෙන්ම සභාපතිතුමණි මම කියන්න ඕන.මේක මම කාටවත් කීවේ නෑ.සභාපතිතුමාට නම් මම කෝල් කරලා කීවා.සභාපතිතුමණි මොවුන් දැන් ජයග්‍රහණය කරන්නේ මුදල් වලින්.තමුන්නාන්සේට මම කීවා , මට ලක්ෂ 100 ක් දෙන්නම් ඒ පැත්තට එන්න කියනවා.මට නගරාධිපතිකම අරන් දෙන්නම් කිව්වා.මම ඒගොල්ලන්ට කීවා මට ජන්දෙ දීපු ජනතාව දාලා මම එන්නෑ කියලා කවදාවත්.අන්තිමට මට බේරෙන්න බැරි තැන මම කීවා මම පොලීසි යනවා කියලා.මම සභාපතිතුමාට දූරකථනයෙන් කීවා මෙහෙම කියනවා කියලා.සභාපතිතුමා මට කීවා පොලීසි යන්න කියලා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
මට මෙතුමා කෝල් කරලා කීවා මෙහෙම පණිවිඩයක් ආවා මොකක්ද කරන්නේ කියලා ඇහුවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
අපි විශේෂයෙන්ම කියන්න ඕන අපේ රට බේරගත්ත ,අපේ දරුවන්ගේ අනාගතය භාරදෙන්න පුලුවන් වතාවරණයක් ඇති කළ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට මේ ඉදිරි ජනාධිපතිවරණයෙත් දිවි හිමියෙන් වැඩ කරනවා.මොකද අපි නිදහසේ පාරේ යන්නේ එතුමා නිසා.තමුන්නාන්සේලා කකුලෙන් අදිද්දි එතුමා දැඩි තීරණ අරගෙන මේ රට බේර ගත්තා.ඒවට මිනිස්සු ජනවාරි 08 වෙනිදට උත්තර දෙයි.අපට මතකයි යුද්දෙ දිනුවා විතරයි තමුන්නාන්සේලා ෆොන්සේකා මහත්තයා දාලා ,එතුමාට ලණුවක් දීලා තමයි එතුමා මැතිවරණයට ඉදිරිපත් කළේ.තරහෙට දාලා එක්සත් ජාතික පක්ෂය එතුමාට උදවු කළේ නෑ.එහෙම උදවු කරන පක්ෂයක් නෙවෙයි.මොකද රනිල් මහත්තයට ඕන එතුමාගේ නායකකම රැකගන්න.එනිසා තමයි මේ පාර අපේ පක්ෂේ මහ ලේකම්තුමා අරගෙන තරහෙට ඉදිරිපත් කරලා තියෙන්නේ.එතුමාටත් වෙන්නේ සරත් ෆොන්සේකට වෙච්ච දේ තමයි.අපේ මන්ත්‍රීතුමා කීවා වගේ අපි ගරු කළ ලේකම්වරයෙක්.අද රනිල්ලගේ ලණුව කාලා ඒ පැත්තට ගියා.ජනිත් මහත්මයා දිගින් දිගටම දෝෂාරෝපණය කළා.එතුමා අවුරුදු ගාණක් මේ සභාව නියෝජනය කරනවා සභාපතිතුමණි.අඩු ගානේ ගෙදරට යන පාරවත් හදාගන්න බැරි වුණා.ඒකත් හැදුවේ අපේ රජයෙන් ජනාධිපතිතුමා දීපු සල්ලි වලින් ලක්ෂ 21 දීලා.මතක තියා ගන්න.

- ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා සහ ජේ.ඩබ්.ජයන්ත මහතා නැවතත් සභාවට පැමිණෙන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>
මෙතුමා වැරදි ප්‍රකාශ කරනවා.පාර හැදුවේ සභාවේ සල්ලි වලින්.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
වතුර බහින කාණුව හදලා දුන්නේ අපේ ජනාධිපතිතුමා දීපු සල්ලි වලින්.එනිසා හෙට ජන්දයක් තිබ්බත් අපි දිනනවා.ඔබතුමාලට ඒක වලක්වන්න බෑ.ඒ වගේම එතුමා ප්‍රකාශ කළා බඳු මුදල් වලින් තමයි මේ සොච්චම දුන්නේ කියලා.එතුමා ඉතාමත් පහත් වචනයක් ඒ කීවේ සභාපතිතුමණි. රජයේ සේවකයන්ට රාජ්‍ය සේවය කරගෙන යන්න දීපු රුකුලක් වශයෙන් මේ බයිසිකලය ලබා දුන්නේ.ඒකත් කොමිස් ගහපු මුදලෙන් කීවා ලබා දුන්නේ.රු.50000 ක් අය කරලා රජයෙන් රු.38000 ක් ගෙවලා තමයි බයිසිකලය දීලා තියෙන්නේ මං දන්න විදියට බයිසිකලය රු.85000ක් .ඉතින් මේවා මේ මාධ්‍ය හරහා ජනප්‍රිය වෙන්න කියන කතා.එනිසා අපි කණගාටු වෙනවා ජනිත් මන්ත්‍රීතුමා කළ මේ ප්‍රකාශ ගැන.ඒ වගේම එතුමා ප්‍රකාශ කළා මම නියෝජනය කරන පාරවල් 2 ක් ගැන. අපි දන්නවා තේ වත්ත පාර අබලන් තත්වයේ තිබුනේ.අපි සභාපතිතුමාට කීවා මේක හදන්න ඕන කියලා.මේක අපි කරපු පාරක් නවෙයි.මේක පී.ආර්.ඩී.එකෙන් දකුණු පළාත් සභාවෙන් කෙරුණු පාරක් .ඒකේ විශාල වාහන ප්‍රමාණයක් යනවා.මේකේ ලොකු ගල් කොරි 2 ක් තියෙනවා.මගේ වැඩපලකුත් තියෙනවා. එනිසා මම සභාපතිතුමාට යෝජනා කළා මම මගේ සල්ලි වලින් රු.50000 ක කාපට් ගෙනත් දෙන්නම් මේක හදමු

- ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහාන් ද සිල්වා මහතා නැවතත් සභාවට පැමිණෙන ලදී.

කියලා.මම විශේෂයෙන් කියන්න ඕන සභාපතිතුමණි මෙතුමා තමයි තල්ගස්ගොඩ සුදුවැල්ලේ පස් කන්ද කපන් ඇවිත් පොල්වත්ත ප්‍රදේශයේ පාර හදාගත්ත මන්ත්‍රීවරයා.වැරදි දෙයක් නෙවෙයි ඇත්ත කියන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**</u>

බොරු කියන්න එපා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

බොරු නෙවේ ඇත්ත කියන්නේ.මම සභාපතිතුමා වෘත්තියෙන්ම කොන්ත්‍රාත්කරුවෙක්.රජයේ කොන්ත්‍රාත්කරුවෙක්.මම ජීවත්වෙන්නේ ඒකෙන්.මම කොන්ත්‍රාත් ජීවිතේ බ්ලැක් ලිස්ට් වෙලා තියෙනවා නම් ,ඒක ඔප්පු කළොත් මම මේ තනතුරෙන් ඉවත්වෙනවා.තව මෙතුමා කීවා අවුරුදු 5 ක සංවර්ධන සැලැස්මේ රු.20000.00 ක වැඩක් විතරයි පොල්වත්ත ප්‍රදේශයේ කරලා තියෙන්නේ කියලා.අපි කියන්න ඕන තල්ගස්ගොඩ ප්‍රදේශයේ මේ අයවැය යෝජනා වලට දාපු වැඩ කොටස් වලින් පොඩි පොඩි ඒවා තමයි කෙරිලා තියෙන්නේ.අපි සභාවෙන් මුදල් දාලා කරන වැඩ කොටස් තමයි මේකෙන් දාලා තියෙන්නේ.හැබැයි අපි ජනාධිපතිතුමා හරහා, පළාත් සභාව හරහා එන මුදල් වලින් හැම කොට්ඨාශයකටම සම සේ වැඩ කරලා තියෙනවා. අපි කණගාටු වෙනවා අවුරුදු 20 ගාණක් මේ සභාව නියෝජනය කරලත් මේ වගේ බොරු මඩ ප්‍රචාර ගෙනයාම සම්බන්ධයෙන්.නමුත් ජනතාව දන්නවා අපි මොනවද කළේ කියලා.1978 ඉදලා 1994 වෙනකම් තමුන්නාන්සේලා මොනවද කළේ කියලා අපි දන්නවා.2001-2002 මොනවද කළේ කියලා අපි දන්නවා.ජනතාවත් දන්නවා.එනිසා අපි කියනවා අතිගරු ජනාධිපතිතුමා මේ රට බේරගත්ත නිසා දිවි හිමියෙන් අපි සියලුම කටයුතු කරලා, අපේ කිත්සිරි මන්ත්‍රීතුමා කීවා වගේ ලක්ෂ 20 ක වැඩි ජන්ද ප්‍රමාණයකින් ජයග්‍රහනය කරන්නට එතුමාට ශක්තිය ධෛර්යය වාසනාව උදාවේවායි පතමින් මම නිහඬ වෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්**</u>

සභාපතිතුමා වැරදි වැටහීමක් ඇති වෙන්න පුලුවන්.එනිසා මම සඳහන් කළ යුතුයි.මට අවවාද අනුශාසනා දීපු කෙනෙක් අපේ විපක්ෂ නායකතුමාගේ බිරිඳ ,පුස්තකාලයාධිපතිනිය හැටියට හිටිය.මම අදහස් කළේ වෙන දෙයක්.මම කීවේ එතුමියගෙන් අහන්න කියලා අපි හැසිරෙන විදිය කොහොමද කියලා.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මන්ත්‍රීතුමා දැන් වාඩි වෙන්න.දැන් පිළිතුරු කතාවත් කරලා තියෙන්නේ.මේ යෝජනාවට විරුද්ධ අය ඉන්නවද.පක්ෂ අය ඉන්නවද.ඒකමතිකව සම්මතයි.

## (6) කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** **2014.11.26** වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>**පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව**</u>

<u>**2014.11.26. ප.ව.2.30**</u>

<u>**සහභාගීත්වය**</u>

1. අම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් — ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව
2. භාරත සමරසේකර — ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව
3. එම්.ඩී.මිත්‍රසිරි ද සිල්වා — පොලිස් පරීක්ෂක
4. වෛද්‍ය පී.ආර්.එන්.ද.සිල්වා — සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි
5. එච්.නයනා චාන්දනි — සංවර්ධන සම්බන්ධීකරණ
6. ආර්.වීමා ගාල්ලගේ — ග්‍රාම නිලධාරී, 83 කරිත්තකන්ද
7. වෛද්‍ය එම්.පී.බී.ඩබ්.යූ.කුමාරි — නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව අම්බලන්ගොඩ

8. පී.සී.සංජීවනි — තාක්ෂණ සේවා නිලධාරි
9. බී.ඩී.ඊ.කොඩිතුවක්කු — පවුල් සෞඛ්‍ය සේවිකා
10. ඩී.එස්.ඊ.ගමගේ — පවුල් සෞඛ්‍ය සේවිකා
11. පී.එච්.එල්.පුෂ්පරාණී — සංවර්ධන සහකාර
12. ආර්.සුසිලා නන්දනී ද සිල්වා — කළමණාකරණ සහකාර
13. එච්.එම්.ටී.එච්.ද.සිල්වා — ග්‍රාම නිලධාරී 86 බී ඕකන්ද
14. ග්‍රේෂන් කෙරමිණියගේ — නාගරික මන්ත්‍රී අම්බලන්ගොඩ නගර සභාව
15. පී.පි.රන්දික මදූෂාන් — ග්‍රාම නිලධාරී 85 බී පටබැඳිමුල්ල
16. එච්.කේ.ඩබ්.දේවප්‍රිය ගුණසේකර — ග්‍රාම නිලධාරී 85 ඒ හෙප්පුමුල්ල
17. පී.එච්.කුමාර ද සිල්වා — 86 ඒ කළුවඩුමුල්ල
18. පී.එස්.එස්.ද සිල්වා.

පිළිගැනීම

ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා.සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනිය ඇතුළු සියළු නිලධාරී මහත්ම මහත්මීන් හා නගර සභා කාර්යමණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි.

**2014.10.27 දින පැවති රැස්වීමේ සාකච්ඡා වූ කරුණු සමාලෝචනය**

| මාතෘකාව | සාකච්ඡා වූ කරුණු | ප්‍රකාශය කවුරුන් විසින් ද යන වග. | තීරණය |
|---|---|---|---|
| කසල අවසන් බැහැරලන ස්ථානයට ප්‍රවේශ මාර්ගය සකස් කිරීම. | තව නොබෝ දිනකින් සිදු කළ හැකි බව. | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා. | |
| වාර්ෂික උපත් සංඛ්‍යාලේඛන ලේඛනගත කළ යුතු බව | පසුගිය කාල වකවානුව තුළ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ වැඩ වර්ජනය නිසා ලබා දීමට නොහැකි වූ වාර්තා සකස් කරමින් පවතින බැවින් එම කටයුතු අවසන් කළ වහාම මෙම තොරතුරු ලබා දිය හැකි බව. | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ජී.ආර්.එන් ද සිල්වා මිය | |
| සුනඛ වන්ද්‍යාකරණ කටයුතු සඳහා පශු වෛද්‍යවරයකුගේ සහාය ලබා ගැනීම. | දෛනික රාජකාරි කටයුතු සමඟ මෙම කාර්යය ඉටු කිරීම අපහසු බවට රජයේ පශු වෛද්‍ය නිලධාරී විසින් යොමු කරන ලද ලිපිය ඉදිරිපත් කිරීම. දැනට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් සුනඛ සැත්කම් කොපමණ සිදු කර ඇත් ද යන්න විමසන ලදි. | ගරු සභාපති. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා. | |
| | දැනට සුනඛයින් 300ක් පමණ සැත්කම් සඳහා භාජනය කර ඇති බවත්, දෙසැම්බර් 16 දින සුනඛ වන්ද්‍යාකරණ වැඩසටහනක් නගර සභා සීමාව තුළ පවත්වන බව. | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ජී. ආර්. එන් ද සිල්වා මිය | |

| | | | |
|---|---|---|---|
| පටබැඳිමුල්ල ඕකඩ ඇළ කාණු පද්ධතිය පිරිසිදු කිරීම. | වැඩ අවසන් කර ඇති බව. | තාක්ෂණ සේවා නිලධාරි ජී. සී සජීවනී. | |
| නගරයේ සිටින පිස්සු මිනිසුන් පුනරුත්තාපනය කිරීම | පොලීසියේ නිලධාරීන් මෙයට මැදිහත් වී උසාවි නියෝගයක් ලබා ගෙන පුනරුත්තාපනය සඳහා යොමු කරන ලෙස. | ගරු සභාපති. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා. | |
| ලැබී ඇති ලිපි සභාවට ඉදිරිපත් කිරීම | ගාල්ල බරවා මර්ධන ඒකකය මගින් යොමු කරන ලද මදුරුවන් බෝවන ස්ථාන ඉවත් කරන ලෙසද දැනුම් දීම මැයෙන් යොමු කරන ලද ලිපිය කමිටුවට ඉදිරිපත් කිරීම | | |
| | කර්මාන්ත අංශයේ වහලෙහි පීලිවල ජලය රැඳී ඇති බව යාබද නිවෙස් හිමියා පැවසූ බව හා පොලීසියේ වැසිකිළිවල දැඩි දුර්ගන්ධයක් හමන බවට මහජන පැමිණිලි ලැබී ඇති බව. | ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා. | |
| | ඉහත ස්ථාන පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු ඉටු කරන ලෙසත් පොලීසියේ වැසිකිළි වල සම්බන්ධව පොලිස් ස්ථානාධිපතිතුමා අවශ්‍ය කටයුතු කරන ලෙස. | ගරු සභාපති. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා. | |
| | ධම්මකුසල මාවතේ භික්ෂුණී ආරාමයේ වැසිකිළි වල කැඩී ඇති බව තමාට පැවසූ බවත් එය යථා තත්වයට පත් කර දෙන ලෙස කාර්මික නිලධාරීට උපදෙස් දෙන ලදි. | ගරු සභාපති. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා. | |
| නිරෝගී ලංකා ජාතික සෞඛ්‍ය වැඩසටහන | සෞඛ්‍ය අමාත්‍යංශය මගින් 2014.12.1 දින සිට 2014.12.07 දින දක්වා ක්‍රියාත්මක කිරීමට යෝජිත නිරෝගී ලංකා ජාතික සෞඛ්‍ය වැඩසටහන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සහාය ඇතිව ක්‍රියාත්මක කරන ලෙස | ගරු සභාපති. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා. | |
| පටබැඳිමුල්ල කොට්ඨාශයේ ඩෙංගු මර්ධනය සඳහා වැඩපිළිවෙලක් යෙදීම | වෙරළ අයිනේ ඇති භාවිතයෙන් ඉවත් කරන ලද බෝට්ටු විනාශ කිරීම සඳහා කරන්දෙණිය යුධ හමුදා කඳවුරේ නිලධාරීන්ගේ සේවය මෙම මස 30 වන දිනෙන් පසු ලබා ගත හැකි බව එම නිලධාරීන් සඳහා දිවා ආහාර සැපයිය යුතු බව බෝට්ටු විනාශ කිරීමට පෙර ඒ බව ශබ්ද විකාශන යන්ත්‍ර මගින් ජනතාව දැනුවත් කළ යුතු බව. | ගරු සභාපති. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා. | |
| අදහස් යෝජනා | | | |

| | | | |
|---|---|---|---|
| ව්‍යාපාර නාම නිකුත් කිරීමේ දී අතුරු බදු දීම සම්බන්ධ ගැටළුව | ව්‍යාපාර නාම නිකුත් කිරීමේ දී අතුරු බදු දීමට අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කිරීම. | සංවර්ධන සම්බන්ධීකාරක නයනා චාන්දනී මිය | |
| | අතුරු බදු දීමකින් බලපත්‍ර ලබා දිය නොහැකි බව | ගරු සභාපති. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා. | |
| ළදරු සායන ගොඩනැගිල්ල විවෘත කිරිම සඳහා දිනයක් ලබා ගැනීම | මොහාන් පී ද සිල්වා මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ දරුවන්ගේ බර කිරීම සඳහා ඉදිකරන ලද ළදරු සායන ගොඩනැගිල්ල විවෘත කිරිම සඳහා දිනයක් ලබා දෙන ලෙස. | ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා. | |
| පවුල් සෞඛ්‍ය සේවිකාවන් බර කිරීම සඳහා තම කොට්ඨාශයේ පොදු ස්ථානයක් යොදා ගත යුතු බව. | පවුල් සෞඛ්‍ය සේවිකාවන් බර කිරීම සඳහා තම කොට්ඨාශයේ පොදු ස්ථානයක් යොදා ගත යුතු බවත්, පෝරඹ කොට්ඨාශයේ බර කිරීම සඳහා පොල්වත්ත පෙර පාසල යොදා ගන්නා ලෙස. | ගරු සභාපති. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | |
| නිවෙස්වලින් පිටකරන අපද්‍රව්‍ය ගලායාම සම්බන්ධව | නිවෙස්වලින් පිටකරන අපද්‍රව්‍ය ගලායාම සම්බන්ධව යම් වැඩපිළිවෙලක් තිබිය යුතු බව. | ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා. | |
| | සමහර නිවෙස්වල වැසිකිළි වලවල් පවා පාරට හරවා ඇති බව. | ඕකන්ද ග්‍රාම නිලධාරී, එච්.එච්.ටී ද සිල්වා මයා. | |
| පටබැඳිමුල්ල වරාය අසල පොදු වැසිකිළිය ආශ්‍රිතව කසල දැමීම | වරාය අසල පොදු වැසිකිළිය ආශ්‍රිතව කසල දැමීම නිසා නොයෙක් අකටයුතුකම් සිදුවන බව. | පටබැඳිමුල්ල ග්‍රාම නිලධාරී ජී.ජී රන්දික මදුෂාන් මයා | |
| | එම වැසිකිළිය කඩා ඉවත් කිරීම සම්බන්ධව කාර්මික නිලධාරී මගින් වාර්තාවක් ලබා ගන්නා ලෙස. | ගරු සභාපති. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | |
| ස්තුති කතාව | වෙනත් පළාත් පාලන ආයතනවල නාම මාත්‍රිකව පවත්නා මෙම කමිටු සක්‍රිය ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමාට කෘතඥ පූර්වක ස්තුතිය පුද කරන බවත්, අද දින කමිටුව සඳහා සහභාගී වූ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමිය ඇතුළු සියළුම ග්‍රාම නිලධාරී මහත්ම මහත්මීන්ටත්, නගර සභා කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පුද කරන බව. | ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා. | |
| නිමාව | ප.ව 4.30 ට | | |

සකස් කළේ -
පි.එච්.එල්.සී.පුෂ්පරාණි
සංවර්ධන සහකාර (පරිසර)

ලේකම්
භාරත සමරසේකර

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සුනඛ වන්‍යන්ධිකරණ වැඩ සටහනක් පැවැත්වෙනවා පටබැඳිමුල්ලේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

කරිත්ත කන්ද ප්‍රදේශයේ ශ්‍රමදානයක් පවත්වන්න මිනිස්සු කතා කළා.ඒ සඳහා අවශ්‍ය සම්පත් ලබා දෙන්න, මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා සහ ට්‍රැක්ටර් ටික ලබා දෙන්න පුලුවන් නම් හොඳයි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම් මහත්තයා මේ සඳහා අවශ්‍ය යම් දෙයක් තියෙනව නම් ලබා දෙන්න ඒ කටයුත්ත ඉටු කරන්න.ලේකම් මහත්තයා මුහුදු වෙරලේ ඇති කැඩි බිඳීගිය බෝට්ටු ඉවත් කිරීමට යුධ හමුදාවේ සහය ලබා ගන්න.සහය ලබා දෙන්නම් කියලා අපට කියලා තියෙන්නේ.මොකද ඒ ආශ්‍රිතව විශාල වශයෙන් ඩෙංගු මදුරුවන් බෝවෙනවා බීමත් අය විසින් දමා යන බෝතල් ආදිය නිසා මුහුදු වෙරළ ඩෙංගු මදුරුවන් බෝවෙන ප්‍රධාන ස්ථානයක් වෙලා තියෙනවා.පොලීසියටත් දන්වන්න මේ කාර්යය කරන අයට එය සෞඛ්‍යට අයහපත් වෙන ආකාරයෙන් කරන්න එපා කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සුනඛ සැත්කම් කිරීම දෙසැම්බර් 16 දිනට යොදාගෙන තියෙනවා.මං ඉල්ලීමක් කරන්න කැමතී එදින වර්ෂාව සහිත දිනයක් වුනොත් සැත්කමින් පසු එම බල්ලන් නිදහස් කිරීම නොකරන්න කියලා. මොකද ගිය පාර මෙය කරද්දී බල්ලන් 9 - 10 ක් පමණ වර්ෂාව නිසා මිය ගිහින් තිබුණා.මං ඉල්ලීමක් කරන්න කැමති මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගෙන් සහ අදාළ නිළධාරීන්ගෙන් එදිනට වැසි සහිත දිනයක් වුනොත් මේ බල්ලන් නිදහස් කරන්න එපා කියලා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බල්ලන් නිදහස් කරන්නේ අල්ලාගත් ප්‍රදේශ වලටමයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

එහෙම නිදහස් කරන එක හරි.නමුත් එදා වර්ෂාව නිසා බල්ලන් 10 ක් විතර මැරිලා හිටියා.ඒකෙන් පරිසරයට ලොකු හානියක් වෙනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙන්නම්.

**ඒ අනුව 2014. දින පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝදතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** **2014.11.24** වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමණාකරණ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාව

<u>කළමණාකරන කමිටු රැස්වීම් වාර්තාව</u>

දිනය - 2014.11.24 වේලාව - ප.ව. 2.30

ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව

පැමිණීම

1. ඩී.ඩබ්.පත්මසිරි මහතා - ගණකාධිකාරී , නගර සභාව.අම්බල්නගොඩ.
2. ඩී.වාසනා තරංගී මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී ,නගර සභාව , අම්බල්නගොඩ.
3. එම්.ජී.ආර්.පුෂ්පකුමාර මහතා - සංවර්ධන සහකාර, නගර සභාව , අම්බලන්ගොඩ.
4. එස්.ජී.සජීවනී මිය - තාක්ෂන නිලධාරී , නගර සභාව , අම්බලන්ගොඩ.
5. ජී.කුසුම් ද සිල්වා මිය - කළමණාකරන සහකාර - ආදායම් අංශ ප්‍රධානි
6. කේ.ඩබ්.රංජනී මානෙල් මෙනවිය - පුස්තකාලයාධිපති
7. එස්.නිර්මලාද සිල්වා මිය - ප්‍රධාන කළමණාකරන සහකාර
8. ඩබ්.පී. සිල්වා මිය - අභ්‍යන්තර විගණන නිලධාරී
9. පී.එස්.එස්.ද සිල්වා මයා - මහජන සෞඛ්‍ය පරීක්ෂක

ප්‍රධාන කළමණාකරන සහකාර එස්.නිර්මලාද සිල්වා මිය විසින් පැමිණ සිටි සියළු දෙනා පිළිගනිමින් රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි. පසු ගිය කමිටුවේ දි ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව විමසන ලදුව එහි ප්‍රගතිය සාකච්ඡා කරන ලදි. අනතුරුව එක් එක් අංශයන් පිළිබඳව අංශ ප්‍රධානීන් විසින් කරුණු දක්වන ලදි.

<u>ආයතන අංශය</u>

ආයතන අංශයේ කටයුතු සඳහා පරිගණකයක් හා ප්‍රින්ටරයක් අවශ්‍ය බව ප්‍ර.කළ .සහකාර මහත්මිය විසින් ඉල්ලීමක් කරන ලදි.

<u>ආදායම් අංශය</u>

ආදායම් අංශ ප්‍රධාන කළ .සහකාර ජී කුසුම් ද සිල්වා මිය විසින් ප්‍රකාශ කර සිටියේ අශෝක මහතා විසින් මුදල් එකතු කිරිම නිසි පරිද ඉටු නොකළ බවත්, එසේම අමතර වැඩ කිහිපයක් , (ප්‍රජා මණ්ඩල පැවැත්වීම වැනි ) යෙදීම නිසා මුදල් එකතු කිරීම ප්‍රමාණවත්ව ඉටු නොවූ බව ත් , ලේඛණ යාවත්කාලීන කිරීම ට නොහැකි වීම නිසා රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බවත්ය.

<u>ගිණුම් අංශය</u>

ගණකාධිකාරී අදහස් දක්වමින් කියා සිටියේ 2015 අයවැය කෙටුම්පත් සාකච්ඡාව මේ මස 27 දින පැවැත්වෙන බවය. එසේම හිඟ වරිපනම් එකතු කිරීමේ දී සම්පූර්ණ මුදලම ලබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා සිටින ලදි. ආදායම් පරීක්ෂක සිතාර නයනජිත් මහතා කියා සිටියේ රු.2 ක් වැනි මුදලක් නොමැති වීම නිසා එසේ සිදුවන්නට ඇති බවත්, සුළු මුදල් නොසළකා හැරීමට ක්‍රියාකිරීමක් සිතාමතා සිදු කර නැති බවත්ය. මින් ඉදිරියට හිඟ එකතුකිරීමේ දී සම්පූර්ණ මුදල ලබා ගන්නා ලෙස ගණකාධිකාරී විසින් උපදෙස් දෙන ලදි. එසේම කළින් සාකච්ඡාකර ආදායම් අංශයේ නිලධාරීන් මෙම රැස්වීමට පැමිණෙන ලෙස ද දන්වා සිටින ලදි.

<u>ප්‍රජා සංවර්ධන අංශය</u>

ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් කියා සිටියේ පෙර පාසල් විවිධ ප්‍රසංගය දෙසැම්බර් 01 දා පැවැත්වෙන බවත් , නගර ක්‍රිඩා තරගාවලිය දෙසැම්බර් 03 දා පැවැත්වෙන බවත්ය. එබැවින් එම කටයුතු සඳහා පුහුණුව සඳහා පැමිණි අයගේ සහය ලබා දෙන ලෙස කමිටුව නිර්දේශ කරන ලදි.

<u>කර්මාන්ත අංශය</u>

ආදාහනාගාරය කැඩී ඇති බැවින් ඉක්මනින් සකස් කර ගැනීමට අවශ්‍ය බව තා.සේ.නි.ජී.සී සජීවනි මිය විසින් දන්වන ලද අතර . වැඩ අධික බැවින් කර්මාන්ත අංශයේ රාජකාරී වැඩ කොටස් සමානව තාසේනි න් අතර බෙදා දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි. මාර්ග ඉනවෙන්ට්‍රිය සකස් කර ගැසට් කිරීමේ කටයුතු කිරීම සඳහා කළ.සහකාර සම්පත් මයාට පවරන ලෙස කමිටුව තීරණය කරන ලදි.

<u>සෞඛ්‍ය අංශය</u>

ම.සෞ.ප. පී.එස්.එස්.සංජීව මයා විසින් කියා සිටියේ දැනට ට්‍රැක්ටරයක් කැඩී ඇති බවත් , තවත් ට්‍රැක්ටරයක් ගලවා ඇති බවත් , නිරන්තරයෙන් ට්‍රැක්ටර් කැඩෙන බැවින් අළුතින් ට්‍රැක්ටරයක් මිළ දී ගැනීමට කටයුතු කරන ලෙසත්ය.

කසළ බැහැරලන ස්ථානයේ පිවිසුම් මාර්ග සකස් කර නොමැති බැවින් වාහන එරෙන වබත් , ටික දවසකින් එම ස්ථානයට යාමට නොහැකි වන බවත්, එබැවින් එම පිවිසුම් මාර්ග සකස් කර දෙන ලෙසත් දන්වා සිටින ලදි. මේ සම්බන්ධයෙන් තාසේනි පවසා සිටියේ කොන්ත්‍රාත්තුව ගබා ගැනීමේ ගැටළුවක් පවතින බවය.

එසේ ම, වැඩ පරීක්ෂක වරුන් 4න් දැන් සිටිනනේ 3ක් බවත් එයින් එක් අයෙක් විශ්‍රාම යාමට නියමිතව ඇති බවත්, එවිට වැඩ පරීක්ෂක වරුන් 02 ක් පමණක් සියළු කාර්යයන්ට ඉතිරි වන බවත්, කාර්යක්ෂමව කටයුතු කිරීමට එවිට නොහැකි වන බවත් පෙන්වා දෙන ලදි.

තවදුරටත් අදහස් දැක්වූ මසෞ.ප සංජීව මහතා කියා සිටියේ ක්‍රිඩාගාරය ඉදිරිපස පරීක්ෂා කළ බවත් එහි වැසිකිළි වලක් සොයාගැනීමට නෙැහැකි බවත් , කැළෑව පවිත්‍ර කර කොරි ඩස්ට් යොදා එම ස්ථානය සකස් කිරීමට අවශ්‍ය බවත්ය. මේ සම්බන්ධයෙන් තාසේනි විසින් සොයා බැලීමට සටහන් කරගන්නා ලදි.

අනතුරුව ප්‍රධාන කළමණාකරන සහකාර එස්.නිර්මලාද සිල්වා මිය විසින් පැමිණි සියළු දෙනාට ස්තුති කරමින් රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ : එම්.ජී.ආර්. පුෂ්පකුමාර
සංවර්ධන සහකාර

ලේකම් වෙනුවට
ප්‍රධාන කළමණාකරන සහකාර

නීතිඥ ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප්
සභාපති
නගර සභාව අම්බලන්ගොඩ

**ඒ අනුව 2014.11.24 දින පවත්වන ලද කළමණාකරන කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝදතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 3** **2014.11.20** වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාව

සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාව

දිනය - 2014.11.20 වේලාව - පෙ.ව.11.00

ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව

පැමිණීම

10. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා - සභාපති , නගර සභාව ,අම්බලන්ගොඩ.
11. ඩබ්ලිව් . කමල් ද සිල්වා මහතා - උප සභාපති , නගර සභාව , අම්බලන්ගොඩ.
12. එච්.එල්.අනුර කිත්සිරි මහතා - නගර සභා මන්ත්‍රී, නගර සභාව,අම්බලන්ගොඩ
13. භාරත සමරසේකර මහතා - ලේකම්, නගර සභාව අම්බලන්ගොඩ.
14. ඩී.ඩබ්.පත්මසිරි මහතා - ගණකාධිකාරී , නගර සභාව.අම්බල්නගොඩ.
15. ජී.ඩබ්. ගුණසිරි මහතා - සංවර්ධන උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
16. යූ.සමරසිංහ මහතා - සංවර්ධන උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
17. එම්.ජී.ආර්.පුෂ්පකුමාර මහතා - සංවර්ධන සහකාර, නගර සභාව , අම්බලන්ගොඩ.
18. එස්.ජී.සජීවනී මිය - තාක්ෂණ නිලධාරී , නගර සභාව , අම්බලන්ගොඩ.
19. බර්ටි රණසූරිය මහතා - පෝරඹ, උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
20. එච්.මහින්දසේන මහතා - ඕකන්ද, උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
21. පී.එස්.එස්. ද සිල්වා මහතා - මහජන සෞඛ්‍ය පරීක්ෂක , නගර සභාව ,අම්බලන්ගොඩ

ගරු සභාපති නීතිඥ ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් පැමිණ සිටි සියළු දෙනා පිළිගනිමින් රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි. 2015 වර්ෂය සඳහා ප්‍රජා කමිටු රැස්වීම් පවත්වමින් ලබා ගත් යෝජනා පිළිබඟව සළකා බැලීමට අද දින බලාපොරොත්තු වන බව ද ප්‍රකාශ කරන ලදි. විශේෂයෙන්ම අද දින ස්වේච්ඡාවෙන් මෙම රැස්වීමට පැමිණි ප්‍රජා නියෝජිත සංවර්ධන උපදේශක කාරක සභා සාමාජිකයන් ට සිය ස්තූතිය පුද කරන බව ප්‍රකාශ කළ සභාපති තුමා අඛන්ඩව මෙම කමිටුව නියෝජනය කිරීමට අපහසු නියෝජිතයන් සිටී නම් ඒ වෙනුවට වෙනත් නියෝජිතයන් නම් කිරීම සුදුසු බවත් , එසේ නොපැමිණීම් පිළිබඳව වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලෙසත් දන්වන ලදි.

එක් එක් කොට්ඨාශයේ ප්‍රජා රැස්වීම් වලට පත් කර ඇති නිලධාරීන් ගේ නම් අයවැය ලේඛණයට ඇතුලත් කරන ලෙස ද ගරු සභාපති තුමා විසින් දන්වන ලදි.

සංවර්ධන යෝජනා ප්‍රමුඛතා ගත කිරීම සඳහා නිර්නායක පදනම් කර ගන්නා ලෙස කමිටු නියෝජිත යූ.සමරසිංහ මහතා විසින් පෙන්වා දෙන ලදි. එසේ නොමැති වූ විට පුද්ගලික අදහස් අනුව මේවා ප්‍රමුඛතා කරන බව ද පෙන්වා දෙන ලදි. තව දුරටත් ඒ මහතා ප්‍රකාශ කර සිටියේ කර්මාන්ත කරන අතර තුර ජනතාව සමග අධීක්ෂන කටයුතු සඳහා වැඩපිළිවලක් සකස් කරන ලෙසය.

එක් එක් කොට්ඨාශ සඳහා ප්‍රජා රැස්වීම් වලදී ලබා දෙන ලද 2015 අයවැය යෝජනා පහත දක්වා ඇති අතර මේ සම්බන්ධයෙන් සංවර්ධන උපදේශක කාරක සභා ව සාකච්ඡා කරන ලදි.

01- <u>ඕකන්ද ග්‍රාම නිලධාරී වසම</u>

1 ඕක්න්ද මාර්ගයේ ඇති කාණු පද්ධතියේ වැඩි දියුණු කිරීමට ඇති ස්ථාන නිවැරදි කරමින් කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම.

2 ඕකන්ද ප්‍රධාන මාර්ගයේ දෙවන හරස් පාරෙහි පැති බැම්ම තවත් ඉදිරියට ඉදි කිරීම.

3 විහාරගොඩ පාර පොලවත්ත දක්වා දීර්ග කොට සෑදීම.
4 රූපවතී මහත්මියගේ නිවස ඉදිරිපිට ඇති කොන්ක්‍රීට් ස්ලැබ් හා කාණුවේ තැනින් තැන කැඩී ඇති ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම.
5 විහාරගොඩ මාර්ගයේ ආරම්භයේ සිට නාන ළිඳ දක්වා ඇති මාර්ගයේ පැති බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම.
6 ඕකන්ද නිවාස 1-8 දක්වා ප්‍රදේශයේ කාණු පද්ධතිය සෑදීම.
7 ඕකන්ද ප්‍රජා ශාලාව වටා දැල් වැටක් ඉදි කිරීම හා ශාලාවට වතුර ලබා ගැනීම

02- <u>කළුවඩුමුල්ල ග්‍රාම නිලධාරී වසම</u>

1. ශ්‍රී විජයාරාම පාරේ ග්‍රාමණී විද්‍යාලය ඉදිරිපිට බෝක්කුව සෑදීම.
2. පීරිස් වෙද මාවතේ පුස්තකාලය ඉදිරපිට කාණුව ප්‍රතිසංස්කරණය කිරීම.
3. පඤ්ඤාලෝක මාවතේ පොදු නාන ලිඳ ප්‍රතිසංස්කරණය කිරීම.
4. කළුවඩුමුල්ල විජයාරාම පටු මගේ ඩයලොග් කුළුණ අසළ මැටි පාර සංවර්ධනය කිරීම.
5. පඤ්ඤාලෝක මාවතේ අතුරු මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරීම.
6. ධිරක්ඛන්ද කාණු පද්ධතිය සකස් කිරීම.
7. කළුවඩුමුල්ල ළමා ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණය කිරීම.
8. ශ්‍රි විජයාරාම පන්සල අසළ ඇති පාර සංවර්ධනය කිරීම.
9. මාර්ග සති පාරේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම.
10. ශ්‍රී විජයාරාම පාරේ අතුරු මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.
11. මාර්ග සතිපාරේ අතුරු මාර්ගය ප්‍රත්සංස්කරණය කිරීම.
12. ග්‍රාමණී විද්‍යාල මාවතේ අතුරු මාර්ගය සංවර්ධනය කිරීම.
13. ලියනාරච්චි පෙදෙස කාණුපද්ධතිය සකස් කිරීම.
14. ග්‍රාමණී විද්‍යාල මාවතේ නො 001 /ඒ නිවස අසළින් පිහිටා ඇති කාණුව ප්‍රතිසංස්කරණය කිරීම.

03- <u>පොල්වත්ත ග්‍රාම නිලධාරී වසම</u>

1. පොල්වත්ත පිං ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම.
2. නුගේතුඩුව මාර්ගය දෙවන වර තාර ආලේප කිරීම.
3. එම්.කේ.සිරිසේන මහතාගේ නිවසට බුද්ධදත්ත මාවතේ සිට එන පාර සංවර්ධනය කිරීම.
4. එම මාර්ගයේ පිවිසුම පුළුල් කිරීම හා කාණුපද්ධතිය සංවර්ධනය කිරීම.
5. නුගේතුඩුව 1 වන හරස් පාර පුළුල් කිරීම හා කොන්ක්‍රිට් කිරීම.
6. පොල්වත්තපුර කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම.
7. නුගේතුඩුව පාර පළල් කිරීම
8. බුද්ධ දත්ත මාවතින් පැමිණි කාණුව දීර්ග කිරීම හා නිසියාකාරව නඩත්තු කිරීම.
9. පන්සල ලඟ සිට බුද්ධදත්ත මාවත ඉදිරියට කාණු පද්ධතියක් දැමීම හෝ නිසියාකාරව නඩත්තු කිරීම.
10. දෙදුවස්ස පාර අවසාන කොටස ප්‍රතිසංස්කරණය කිරීම.
11. සියළු කොට්ඨාශ සඳහා තණකොළ කපන මැෂින් 5/6 පමණ මිළ දී ගෙන නිතිපතා කම්කරුවකු යෙදවීම.
12. අතුරු පාරවල් වල තම නිවස ඉදිරිපිට කොටස තමන් විසින් ම පවිත්‍ර කරකසළ කළමණාකරණයට ක්‍රමයක් සැකසීම.
13. කෘෂිකර්මය අසළින් ලයිට් කණුවක් මායිමට ගෙන වැටක් ගසා ඇති බැවින් එම ස්ථානයෙන් වාහනයක් හැරවීමට ඇති අපහසුතාවය ඉවත් කරීම හා එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

04- <u>පෝරඹ ග්‍රාම නිලධාරී වසම</u>

1) රොබට් වික්‍රමසූරිය පාරේ අතුරු පාර කොන්ක්‍රීට් කිරිම.
2) පොල්වත්ත පාර ජී. එම්. ජයවර්ධන මහතාගේ නිවසට යන පාර (ලිදමුල වත්ත අතුරු මාර්ගය) කොන්ක්‍රීට් කිරිම.
3) පළාදුව පාර පිළිසකර කිරීම.
4) සුගතබිම්බාරාම පාර පිළිසකර කීරිම.
5) පෝරඹ ශාඛා පුස්තකාලය ඉදිරිපිට කාණුව පිළිසකර කීරිම.
6) විදී ලාම්පු වල එළිය ලැබෙන සේ අවට තිබෙන ගස් වල අතු කපා දැමීම. ( සිංහ සමාජය ලග තිබෙන විදී ලාම්පුව හා දයාසිරි මහතාගේ නිවස අසල විධි ලාම්පුව)
7) පෝරඹ වලව්වත්ත පරේ හරස් මාර්ගයේ වී කාණු සෑදීම.

8) තොටුපොළ පාරේ කාණු පද්ධතිය පිළිසකර කිරීම.
9) රොබට් වික්‍රමසූරිය පාරේ මීටර් 100 ගිය පසු වතුර පිරෙන ස්ථානය පිළිසකර කිරීම.
10) බුද්ධදත්ත පාර පිළිසකර කිරීම.
11) කසළ බැහැරලන ස්ථානය එක වසා මැසි මදුරු උවදුර මැඩලීමට කටයුතු කිරීම.
12) පෝරඹ හන්දියේ ජල කරාමය නැවත පිළිසකර කිරීම.
13) අ.ම. කරුණාරත්න ගොඩනැගිල්ල අසළින් ඇති උඩ පාරේ ගල් කුට් ඇතිරීම.
14) පොල්වත්ත පාරේ ලක්ෂ්මී බෙහෙත් ශාලාවේ නිවස අසල පාර බට යොදා පිළිසකර කිරීම.
15) පෝරඹ ග්‍රමසේවා කොට්ඨාශයේ පාර පිළිසකර කිරීමට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට දන්වන්න.

**05- හිරේවත්ත ග්‍රාමසේවා වසම**

01. R.P ආතර් සිල්වා මාවත කාණු පද්ධතිය සකස්කිරීම.
02. නවෝද්‍යා පෙර පාසල අසල පාර සකස් කිරීම.
03. නම්බිමුල්ල හරස් පාර කාණු පද්ධතිය සකස් කිරීම.
04. උස්වැල්ල පාර කාණු පද්ධතිය දීර්ඝ කිරීම.
05. පුස්තකාලය අසල ළිද ප්‍රතිසංස්කරණය කිරීම.
06. මාදම්පා ගග ආශ්‍රිතව ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම.
07. K.M.S සිට හෙලන් මහතාගේ නිවස දක්වා පාර කොන්ක්‍රීට් කිරීම.
08. නාගරික කෘෂි ව්‍යපෘතියක් සකස් කිරීම.

**06 - 84 ඒ පනියන්දූව ග්‍රාම නිලධාරි වසම 2015 අයවැය සඳහා ඉදිරිපත් වූ යෝජනා**

01. පනියන්දූව පාරේ පැති කාණුවක් සකස් කර දීම.
02. එඩෙරමුල්ල පාරේ කාණුව දැමීම
03. එඩෙරමුල්ල හන්දියේ කුණු බක්කිය ඉවත් කිරීමට කටයුතු කිරීම.
04. මානාන පන්සලේ බස්නාහිර පැත්තේ ඉඩමේ කන්නන්ගර ඇල ළඟින් නිවාස සංකීර්ණයක් සෑදීම.
05. අංක 63 නිවස ඉදිරිපිට ඉඩම පස් දමා සකස් කර දීම.
06. කම්කරු කාර්යාලය ළඟින් යන පාරේ කාණුව දීර්ඝ කර දීම.
07. දේගොඩ ඇල සුද්ධ කර දීම.
08. පනියන්දූවට විකල්ප මාර්ගයක් සකස් කර දීම.
09. ප්‍රජා ශාලාව අයත් ඉඩමට ආරක්ෂිත වැටක් සකස් කර දීම.

**07- පටබැඳිමුල්ල ග්‍රාම නිලධාරි වසම**

01 සිරි නිකේතනාරාම පාරේ පැතිබැම්ම ප්‍රතිසංස්කරණය කිරීම.
02 සිරි නිකේතනාරාම විහාරස්ථානය පිටුපස කසල දැමීම නිසා දැඩි දුර්ගන්ධයක් හමන බැවින් ඒ සඳහා වැඩපිළිවෙලක් යෙදීම
03 2014 අයවැය යෝජනාවල අංක 11 යටතේ දක්වා ඇති යෝජනාවට ප්‍රමුඛතාව ලබා දීම.
04 2014 අයවැය යෝජනාවල මෙතෙක් ඉටු වී නැති යෝජනා 2015 අයවැය සඳහා ඉදිරිපත් කිරීම

**08 - කරිත්තකන්ද කොට්ඨාශයේ යෝජනා**

01 (විද්‍යාල මාවත) මුදළිඳු එස්.තෝමස් ද සිල්වා මාවත,දුම්රිය පාරෙන් බැසීමට පඩිපෙලක් සකස් කිරීම
02 පීරිස් වෙද මාවත හන්දියේ සිට සුපුල් විදානගේ මහතා ඇතුළු පදිංචිකරුවන් ගමන් ගන්නා පාරේපැති කාණු ඉතා පළල් බැවින් අනතුරු අවම කර ගැනීම සඳහා අඩි 2.5 ක පමණ දිගැති කොන්ක්‍රීට් ලෑලි දැමීම
03 බුවින් තිලකචන්ද්‍ර මහතාගේ සහ අසල්වැසි අය පාවිච්චි කරන පාර පැති බැම්ම බැඳ කොන්ක්‍රීට් කිරීම
04 පීරිස් වෙද මාවත නීතිඥ පුෂ්පා වෛද්‍යසේකර මහත්මිගේ ඉඩමේ දකුණු පසින් පෝරෝක් ඇළට ජලය බැස යන කාණුව කොන්ක්‍රීට් කිරීම.

05 හල්වතුර කුලරත්න හරස් පාර දෙපස කාණු බැදීම, අතුරු පාරවල් දෙක කොන්ක්‍රීට් කිරීම හා ජලය බැස යන කාණු කැපීම

06 හල්වතුර හන්දියේ සිට දුම්රිය පාලම දක්වා පෝරඹට යන පාරේ උතුරු පැත්ත කාණුව බැඳ කුට්ටි ගල් අතුරා පදිකයින්ට පදික වේදිකාවක් සකස් කිරීම හා පාලමට සමාන්තරව මඟී පාලමක් ඉදි කිරීම

07 පීරිස් වෙද මාවතේ සිට කුලරත්න පාර දක්වා නවාරා පන්තියට යන පාරේ දකුණු පැත්ත පැති කාණු බැදීම හා වලවල් සෑදී ඇති කොටස සංවර්ධනය කිරීම.

08 සංඝරාජ පාර පන්සල හන්දිය කාණුව පුළුල් කර බැදීම.

09 පීරිස් වෙද මාවතට සමාන්තරව හල්වතුර ඉඩම වටා යන ඇළ මාස 06 වරක් වත් ශුද්ධ කිරීම

10 පීරිස් වෙද මාවතේ පෝරෝක් ඇළ පටන් ගන්නා ස්ථානය වැලි පිරි වල් බිහිවී ඇත.වැසි දිනවලදි අතුරු කාණු 04 කි ගලා එන වැසි ජලය හිරවී කාණු උතුරා යන බැවින් වැලි ඉවත් කර පිළියම් යෙදීම

11 රේල්පාරට සමාන්තරව ජලය ගලා එන කාණුව පීරිස් වෙද මාවත අනුර ප්‍රනාන්දු මහතාගේ නිවස ඉදිරිපිටදි වංගු සහිත බැවින්, සුළු වර්ෂාවකදිත්, කාණුව උතුරා පාර යටවන නිසා කාණුව කෙලින් කර බැදිම.

12 දැනට සකස් කර ගෙන යන හල්වතුර ක්‍රීඩාංගනය ඇළ පැත්තේ දැල් ආවරණයක් ගැසීම

13 පටබැදි ගෙදර වත්ත පළමු පටු මඟ කාණුව විද්‍යාල මාවත කාණුවට සම්බන්ද කිරීම

14 පටබැදි ගෙදර වත්ත පටු මඟ 02 මුල් කොටස පාර ගැලවී වලවල් සෑදි ඇත සංවර්ධනය කිරීම.

15 (කන්ද මාවත) අම්බලන්ගොඩ චන්ද්‍රසිරිහිමි මාවත පශු වෛද්‍ය කාර්යාලය අසල දකුණු පැත්ත කාණුව බැදිම

16 ළමා උද්‍යානය විදුලි ආලෝක කිරීම

17 (කන්ද මාවත) චන්ද්‍රසිරි මාවතේ අංක 09, 10 නිවාස පේළියට ඉදිරිපස ඇති අතුරු පාරේ කාණුව ගැඹුරු කර බැදීම හා පිටුපස කාණුව අලුත්වැඩියාවට අවහිරව ඇති කාණු බැම්ම උඩ ඉදිකර ඇති බැම්ම (මායිම් බැම්ම) ඉවත් කර දීම.

18 (අශෝක මහතාගේ නිවස පිටුපසින් ඇති කාණුව) පළවන හරස් පාරෙන් අංක 07 හා 08 ගෙවල් අසල ඇති කාණුව බැදීම

19 විද්‍යාල මාවතේ පළවන හරස් පාරේ අලුතින් කොන්ට් කරන ලද කොටස් ස්ලැබ් දමා අවසන් කිරීම

20 විද්‍යාල මාවතේ අවසන් කොටසේ පුෂ්පා මියගේ නිවස අසල පාරේ ඇති විදුලි කණුව ඉවත් කිරීම

21 විද්‍යාල මාවත පළවනි හරස් පාරින් යසරත්න මහතාගේ නිවසට ඇතුළුවන තැන සපත්තු කාණුවට උඩින් ස්ලැබ් දමා අවසන් කිරීම

22 කුලරත්න පාරේ හල්වතුර වම් කොටසේ කාණු පද්ධතිය සැකසීම

23 හල්වතුර ත්‍රීඩාංගනය සැකසීම

24 ප්‍රජා ශාලාවට පුටු 50 ක් ලබා දීම

25 කන්ද මාවත දෙවන හරස් පාරේ සපත්තු කාණුව ප්‍රතිසංස්කරණය කිරීම

26 ධර්මාශෝක විද්‍යාලයේ පිහිනුම් තටාකය පිටුපසින් විද්‍යාලයේ වතුර බැස යාමට සාදා ඇති කොන්ක්‍රිට් කාණුව ලේ පාර අසල කාණුවට සම්බන්ධ කිරීම

**<u>10 -86 බී කෙරම්ණිය ග්‍රාම නිලධාරි වසම</u>**

1. කෙරම්ණිය- පින්නදූව ළමුන් සඳහා ක්‍රීඩා පිටියක් තැනීම.
2. දූව වත්ත දෙවන හරස් පාර කොන්ක්‍රිට් කිරීම
3. පින්නදූව,තොටුපල පාර සංවර්ධනය කිරීම
4. පින්නදූව පාර (ප්‍රධාන පාර) අලුත්වැඩියා කිරීම හා කාණු අලුත්වැඩියා කිරීම

5. දුව වත්ත පාර,එස්මන්ඩ් මහතාගේ නිවසට යන පාරේ කාණුව හා බෝක්කුව ඉදි කිරීම
6. පින්නදූව පාරේ, සෝමතුංග මහතාගේ නිවස අසල නගර සභාව මඟින් පුළුල් කරන ලද කොටස සංවර්ධනය කිරීම
7. පින්නදූව ඇළ, ආරච්චි ඇළ, පතහා ඇළ, පොල් කඳ ඇළ ශුද්ධ කිරීම
8. පින්නදූව,වටරවුම් පාර II හා III වන හරස් පාරවල් සංවර්ධනය කිරීම
9. එස්.එම්.විජේපාල මහතාගේ නිවස අසල පැති බැම්ම සකස් කිරීම
10. කේ.ඩබ්. මල්කාන්ති මහත්මියගේ ඉඩමේ මායිමට යාබදව පිහිටි වංගුව ආරක්ෂිත පැති බැම්ම ඉදි කිරීම
11. පින්නදූව, ඉරේෂ් මහතාගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීම
12. පින්නදූව සුනාමි නිවාස අසල පිහිටි මාර්ගය කොන්ක්‍රීට් කිරීම
13. පින්නදූව රොෂාන් මහතාගේ නිවස පිහිටි වටරවුම් පාර (IV) කොන්ක්‍රීට් කිරීම
14. පින්නදූව බකිනි මහත්මියගේ නිවස අසලින් යන මාර්ගය කොන්ක්‍රීට් කිරීම
15. දුව වත්ත , අශෝකා ජානකි මියගේ නිවස අසල වීදි පහනක් යෙදීම
16. පොකුණපාරේ පැති කාණු ඉදි කිරීම
17. කෙරමිණිය,පොකුණ පාරේ , කිංස්ලි පරණවිතාන මහතාගේ නිවස පිහිටි මාර්ගය කොන්ක්‍රීට් කිරීම
18. කේ. සමන් දමින්ද කුමාර මහතාගේ නිවසට යන මාර්ගය කොන්ක්‍රීට් කිරීම( ශ්‍රම පදනම මත)
19. කෙරමිණිය නදුන්ශාන්ත වැල්ලගේ මහතාගේ නිවසට යන මාර්ගය කොන්ක්‍රීට් කිරීම
20. කෙරමිණිය ඊ.නන්දරත්න මහතාගේ නිවසට යන මාර්ගය කොන්ක්‍රීට් කිරීම
21. කෙරමිණිය,ඩිස්නි පාරේ ඇතුල්වන ස්ථානයේ බෝක්කුව හා පැති කාණු සකස් කිරීම
22. සේවා පියසක් ඉදි කිරීම( ග්‍රාම නිලධාරි,දිවි නැගුම සංවර්ධන නිලධාරි, ආර්ථික සංවර්ධන නිලධාරි වෙනුවෙන්)
23. කෙරමිණිය සමෘද්ධි සමිතියේ ගිණුමේ ඇති මුදලින් තණ කොළ මැෂිමක් මිලදී ගැනීම
24. කෙරමිණිය,පතිරාජ පාරේ අවශ්‍ය ස්ථාන වල පැති බැම් හා කාණු ඉදි කිරීම
25. කෙරමිණිය,පෙර පාසල සඳහා ලිස්සන බෝට්ටුවක් ඉදි කිරීම
26. පින්නදූව, VII වන පටුමඟ පාර සංවර්ධනය කිරීම

**<u>11- හේප්පුමුල්ල ග්‍රාමසේවා වසම</u>**

1. සේවා පියස ඉදිරිපිට කාණු පද්ධතිය 35 m කාණු පද්ධතිය සෑදීම.
2. ආර්.ඊ.ද.සිල්වා මාවත අතුරු මාර්ගය සෑදීම.
3. වර්ගනේත්ති පාරේ අතුරු මාර්ගය සංවර්ධනය කිරීම.
4. නාමල් ඇළ ජලයෙන් යටවන තත්වය මග හැරවීම.
5. හෙප්පුමුල්ල පටුමග බෝක්කුව අඩි 25 ප්‍රමාණය පතුල දමන ලෙස.
6. හෙප්පුමුල්ල පටුමග මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම.
7. මේධානන්ද මාවත ප්‍රතිසංස්කරණය කිරීම.
8. සිරිනිකේතනාරාමය පිහිටි පාරේ ඇති ලයිට් කණුව සහ ආර්.ඊ.ද.සිල්වා මාවතේ අතුරු මාර්ගයේ ඇති ලයිට් කණුව ඉවත් කිරීම.
9. සමගි ප්‍රජා මණ්ඩලයට පුටු 200 ,කූඩාරමක් හා බුෆේ සෙට් එකක් ලබා දීම.

**<u>12- මහ අම්බලන්ගොඩ</u>**

1) මානිමුල්ල වට රවුම් පාරේ පැති කාණුව සකස් කිරීම.
2) නගර සභා නිවාස සංකිර්ණ පාර තාර දැමීම
3) පොදු ළිං දෙක ප්‍රතිසංස්කරණය කිරීම
4) තුඩුව මුල්ල තොටුපොළ ළඟ සිට දෙල්දූව පාලම අවසානය දක්වා කාණු පද්ධතිය සකස් කිරීම.

5) මානි මුල්ල දෙවන හරස් පාර සකස් කිරීම.

6) මානිමුල්ල වට රවුම් පාරේ පොදු ළිඳට යන පාර සකස් කිරීම

7) පුස්තකාලය ඉදිරිපිට මාර්ගයේ කාණු සකස් කිරීම.

8) මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලය තීන්ත ආලේප කිරීම සහ පුටු 30 ක් ලබා දීම.

9) කසළ එකතු කරන ට්‍රැක්ටර් සඳහා නළා සංඥා සවි කිරීම.

10) කාණු පිරිසිදු කරන අයට අත් කරත්ත ලබා දීම.

11) දෙල්දූව පාරේ වතුර දෙල්දූව තොටුපල අසලින් බැස යාමට සැලැස්වීම.

12) ධම්ම කුසල ඉදිරිපිට මානවඩු මහතාගේ නිවස අසලින් යන පාර වතුර බැස යන ආකාරයට සකස් කිරීම.

13) මානිමුල්ල දෙවන පටු මහ දෙවන මිශ්‍රණය යෙදීම.

14) විජය වික්‍රම නිවස අසල ඇති දෙවන තාර මිශ්‍රණය යෙදීම.

**<u>13- විලේගොඩ</u>**

1) ධම්මයුක්ති පාර ප්‍රතිසංස්කරණය කිරීම

2) ධම්මානන්ද පාර කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම

3 ) දෙමටගොඩ පාර ප්‍රතිසංස්කරණය කිරීම

4) හීන් ඇළ පටුමහ සංවර්ධනය කිරීම ( දොස්තර රාජසිංහ මහතාගේ බෙහෙත් ශාලාව දක්වා)

5) එස්.පී. ඩී.ඊ.එස්.මාවත ( ගිය අවුරුදු 3 ,5) කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම

6) හීන් ඇළ පාර පොල්වත්තට වැටෙන පාර සංවර්ධනය කිරීම

7) හීන් ඇළ පාර (කසල ප්‍රතිචක්‍රි කරණ වැඩසටහන් )

ඉහත යෝජනා වලින් 2014.11.20 දිනට පසුව ලද යෝජනා ද මෙම වාර්තාවට ඇතුලත් කර ඇත.
කම්ටු නියෝජිත බර්ටි රණසූරිය මහතා ප්‍රකාශ කළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ඉටු කරන ලද කරමාන්ත කරන විට අපි සකස් කර තිබූ කසමහරක් කාණු කඩන්න තීරනය කරලා තියන බවත්, නගර සභාව මගින් මෙම කටයුතු ඉටු කරන්නේ වඩා සුදුවුසු බවත්ය. ගරු සභාපති තුමා කියා සිටියේ නගර සභා මාර්ග කැඩීමට පෙර නගර සභා වේ අවසරය කලින් ලබා ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්ට දන්වන ලෙසය.
පොල්වත්ත කොට්ඨාශයන් ඉදිරිපත් වු මාර්ගයේ පිහිටා ඇති කොස්ගස ඉවත් කිරීමට ප්‍රාදේශීය ලේකම්, වෙත දන්වා යවන ලෙස ගරු සභාපති තුමා විසින් දැනුම් දෙන ලදි.
යු.සමරසිංහ මහතා විසින් ධම්මානන්ද මාවතේ ස්ලැබ් යෙදීම සමබන්ධයෙන් තාක්ෂණ නිලධාරී සමග ගොස් පෙන්වීමට කැමැත්ත ප්‍රකාශ කරන ලද අතර එසේ පැමිණිමට දැනුවත් කරන ලෙස තාක්ෂණ සේවා නිලධාරීගෙන් ඉල්ලීක් ද කරන ලදි.

සකස් කළේ : එම්.ජී.ආර්. පුෂ්පකුමාර
සංවර්ධන සහකාර

ලේකම්
අම්බලන්ගොඩ නගර සභාව

නීතීඥ ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප්
සභාපති
නගර සභාව අම්බලන්ගොඩ

**ඒ අනුව 2014.11.20 දින පවත්වන ලද සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 4** **2014.11.19** වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

**ක්‍රීඩා කමිටු වාර්තාව - අම්බලන්ගොඩ නගර සභාව**

**දිනය -** 2014.11.19
**වේලාව -** ප.ව. 2.30
**ස්ථානය -** නගර සභා රැස්වීම් ශාලාව

**සහභාගිත්වය -**

| | | |
|---|---|---|
| ඇම්.ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | - | ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව. |
| භාරත සමරසේකර මහතා | - | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව. |
| කේ.ජේ.තාබ්‍රෙව් මහතා | - | රියෝ ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ. |
| ටී.සරත් ශාන්ත මහතා | - | සිංහ ක්‍රීඩා සමාජය, අම්බලන්ගොඩ. |
| එස්.කේ.පත්මසිරි මහතා | - | ක්‍රීඩා කමිටු සාමාජික. |
| කසුන් ගාල්ලගේ මහතා | - | ක්‍රීඩා නිලධාරි,අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය |
| ජී. අශෝක කුමාර මහතා | - | ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව. |
| එච්.යසරත්න ද සිල්වා මහතා | - | ක්‍රීඩා භූමි භාරකරු, අම්බලන්ගොඩ නගර සභාව. |
| ඉඳුනිල් එදිරිවික්‍රම සූරිය මහතා | - | පාපන්දු පුහුණුකරු ,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඩී.වී.තරංගි මිය | - | ප්‍රජාසංවර්ධන නිලධාරි, අම්බලන්ගොඩ නගරසභාව. |

**පිළිගැනීම- ගරු සභාපති ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා**

ක්‍රීඩා කමිටුව සඳහා පැමිණි සියළුම මහත්ම මහත්මීන් පිළිගනිමින් ක්‍රීඩා කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදි.

2014 වර්ෂයේ නගර ක්‍රීඩා තරගාවලියේ ජයගාහක ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා කුසලාන සහ සහතිකපත් ප්‍රදානෝත්සවය පාසල් නිවාඩුවට පෙර පැවැත්වීමට අවශ කටයුතු සිදු කිරීමට ප්‍රජාසංවර්ධන නිලධාරිට උපදෙස් ලබා දෙන ලදි.

පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා වැඩි තරග අවස්ථා ලබා දීමෙන් ඔවුන්ගේ ක්‍රීඩා කුසලතාවයන් ඔප් නැංවීම සේම අඩු පහසුකම් සහිත පාසල් වල දක්ෂ දරුවන්ට නගරයේ පාසල් වලට ඇතුළත් වීමට අවස්ථාව ලබා දීම ද මෙම ක්‍රීඩා තරගාවලියේ අරමුණක් බව ගරු සභාපතිතුමා විසින් පැහැදිළි කරදෙන ලදි. මෙම තරගාවලිය පැවැත්වීමට කිසිදු දේශපාලන අරමුණක් නොමැති බවද ගරු සභාපතිතුමා විසින් පැහැදිලි කර දෙන ලදි. සියළුම තරග වයස අවු. 15 න් පහළ තරග ලෙස පවත්වනු ලබන්නේද දක්ෂ ක්‍රීඩකයන් හඳුනාගෙන ඔවුන්ට හොඳ පුහුණුවක් ලබා දීම මගින් ඉදිරියට ගැනිම බවත් මෙම අරමුණු ඉටු කර ගැනීමට පාසල්වල විදුහල්පතිවරුන් කටයුතු නොකරන බව වැඩිදුරටත් පෙන්වා දෙන ලදි.

**එස්.කේ.පත්මසිරි මහතා-**

1970,80 ගණන්වල ක්‍රීඩාවලින් දක්ෂතා පෙන්වන පහසුකම් අඩු පාසල්වල ක්‍රීඩකයන් නගරයේ පාසල්වලට ඇතුළත් කරගත් බවත් තමන් ද ධර්මාශෝක පාසලට ඇතුළත්වූයේ ද එම ආකාරයට බව පෙන්වා දෙන ලදි.

**ටී.සරත් ශාන්ත මහතා**

ඉදිරියේ දී කරසපනැළු රිද්රා මගින් සංවිධානය කරනු ලබන තරග පැවැත්වීම සඳහා ක්‍රීඩාංගණය වෙන් කරගත හැකි ද යන්න විමසීම. මෙම තරග පැවැත්වීම සඳහා රත්ගම බණ්ඩරවත්ත ක්‍රීඩාංගණය වෙන් කරගැනීමට උත්සහ කළද එම ක්‍රීඩාංගණයේ ද ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරන බව දන්වා ඇති බැවින් තරග පැවැත්වීමේ ගැටළු ඇතිවිය හැකිබව.

**ගරු සභාපතිතුමා-**

ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතු මෙම මාසය අවසන් වීමට පෙර සිදු කිරිමට බොහෝ දුරට ඉඩ ඇති බැවින් වෙන් කිරිම සිදු කළ නොහැකි අතර මේ පිළිබඳව කරසපනැළු රිද්රා එක දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස දන්වා සිටින ලදි.

**කසුන් ගාල්ලගේ මහතා-**

ඉදිරියේ දී පාසල් තරග පොල්වත්ත ක්‍රීඩාංගණයේ දී පැවැත්වීමට නියමිත බැවින් මළල ක්‍රීඩා තරග පැවැත්වීමට හැකි ලෙස එම ක්‍රීඩාංගණයේ අදාළ සකස් කිරීම් සිදුකර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.
ජාතික ක්‍රීඩා උළෙලේ දී සෑම වර්ෂයකම මේස පන්දු, බැඩ්මින්ටන්, කරාතේ, පිහිණුම් සහ මළල ක්‍රීඩා ආදි තරගවලින් පදක්කම් අම්බලන්ගොඩ නගරයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසින් හිමිකර ගන්නා බවත් මේ නිසා ක්‍රීඩාවලින් ඉදිරියට යන ක්‍රීඩා ගම්මානයක් ලෙස අම්බලන්ගොඩ නම් කර ඇති බවත් දන්වා සිටින ලදි.
නගර ක්‍රීඩා උළෙලේ දී නගර සභා බල ප්‍රදේශයේ පාසල් පද්ධතියේ ජාතික මට්ටමින් තරග නියෝජනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගයීමට හැකිනම් එය ඉතා වටින බව හා අනෙකුත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ටද ආදර්ශයක් වන බව .

**ක්‍රීඩාභූමි උපදේශක-**

තාක්ෂණ නිලධාරි සමග ක්‍රීඩාංගණය පරික්ෂා කළ බවත් සිදු කළයුතු ඉදිකිරීම් සහ සකස් කිරීමවලට අදාළ ඇස්තමේන්තුව සකස් කර සභාවට ඉදිරිපත් කරන බවට දන්වා සිටින ලදි.

**එස්.කේ.පත්මසිරි මහතා -**

වොලිබෝල් පුහුණුවීම් සඳහා නගර සභාවට අයත් ක්‍රීඩාංගණ වල පහසුකම් සලසා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදි. එමෙන්ම ඩොල්ෆින් ජල ක්‍රීඩා සංගමය මේ වන විට දියපන්දු ආරම්භ කර ඇති බවද දන්වා සිටින ලදි.

**ගරු සභාපතිතුමා**

වොලි බෝල් පුහුණුව සඳහා ක්‍රීඩාංගණ වල පහසුකම් ලබා දිමට කටයුතු කරන බවත් එය ඉතා හොඳ යෝජනාවක බවත් පෙන්වා දෙන ලදි.

**ස්තූති කථාව - ලේකම්, භාරත සමරසේකර මහතා**

අද දින තම වටිනා කාලය හා ශ්‍රමය කැප කරමින් කමිටුව සඳහා පැමිණි සියළුම මහත්ම මහත්මීන්ට ක්‍රීඩාවේ දියුණුව වෙනුවෙන් තම අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම වෙනුවෙන් ස්තූතිය පළකරමින් කමිටුවේ වැඩකටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ-
ඩී.වී.තරංගි,
ප්‍රජා සංවර්ධන නිලධාරි.

ලේකම්,

අම්බලන්ගොඩ නගර සභාව.

**ඒ අනුව 2014.11.19 දින පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝදතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**6: 5** **2014.11.27** වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල්ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා මූලාසනය දැරූ 2014/11/27 දින පුස්තකාල කමිටු වාර්තාව</u>

- ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා (ගරු සභාපති)
- ග්‍රේෂන් කෙරමිණියගේ (ගරු නගර සභා මන්ත්‍රී)
- භාරත සමරසේකර මහතා (ලේකම්,නගර සභාව අම්බලන්ගොඩ)
- කේ.ඩබ්ලිව් රංජනි මානෙල් මෙනවිය (පුස්තකාලයාධිපතිනි)
- ඩී.වී.වාසනා තරංගි මිය (ප්‍රජා සංවර්ධන නිලධාරිනී)
- සුගත් හෙට්ටි ආරච්චි මහතා (කමිටු සමාජික)

- ජී.ඩබ්ලිව්.ගුණසිරි මහතා (කමිටු සමාජික)
- හර්බට් වීරක්කොඩි මහතා (කමිටු සමාජික)
- පී.එච්.එල්.පියන්ති මෙනවිය (පුස්තකාල සහයිකා)
- ඒ.ඩබ්ලිව් ඉන්ද්‍රදාස මහතා (පුස්තකාල සහයක)
- ඒ.ජී.රසිකා මිය (පුස්තකාල සහයිකා)

- ගෞරි වරුසවිතාන මිය (පුස්තකාල සහයිකා)
- කේ.ඒ.විසුද්ධි රේණුකා මිය (පුස්තකාල සහයිකා)
- එස්.සුසිලා දීපානි මිය (පුස්තකාල සහයිකා)
- එම්.ඩබ්ලිව්.ජේ.සුමංගලි මිය (පුස්තකාල සහයිකා)

- මාලති සමන්තා ආරියසිංහ (පුස්තකාල සහයිකා)

ගරු සභාපතිතුමා කමිටුවට පැමිණි මහත්ම මහත්මීන් පිළිගැනීමෙන් පසු එදින ප.ව.2.30 ට සභාවේ වැඩ ආරම්භ කළේය.

- **පුස්තකාල ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරිම පළමුව සිදුවිය.**

ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපතිනිය විසින් ඉදිරිපත් කරන ලදි.පෝරඹ ශාඛා පුස්තකාලයේ සහයිකාව අසනීප බැවින් එම ශාඛාවේ වාර්තාව ඒ.ඩබ්ලිව් ඉන්ද්‍රදාස මහතා විසින් ඉදිරිපත් කරන ලදි.අනෙකුතු ශාඛා පුස්තකාලවල ප්‍රගති වාර්තා ඒ ඒ ශාඛාභාර නිලධාරී විසින් ද , විද්‍යුත් පුස්තකාලයේ වාර්තාව ප්‍රධාන පුස්තකාලයේ සේවය කරන ප්‍රියන්ති මෙනවිය විසින්ද, ඉදිරිපත් කරන ලදි.

- ශාඛා පුස්තකාලවල පොත් බැහැර දීමේ සංසරණ ප්‍රස්ථාරය බලා හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලයේ පොත් ප්‍රමාණය 1485 බවත් පොත් 1500ක් දක්වා වැඩි කළ යුතු බවද පැවසුහ.මෙවර පුස්තකාලයට පොත් මිලදි නොගත් බවත්, වාසනා ප්‍රකාශකයින්ගෙන් පරිත්‍යාග වශයෙන් ලැබුනු රු.50000.00 ක වටිනාකම පොත් වලින් රු.15000.00 ක පොත් ප්‍රධාන පුස්තකාලයටත්, ඉතිරි රු.35000.00 ක මුදල රු.50000.00 ක වටිනාකමකින් යුත් පොත් කට්ටල ශාඛා පුස්තකාලයන් සඳහා ලබා දුන් බව පුස්තකාලයාධිපතිනිය පැවසුවාය. ඉදිරියේදි පොත් මිලදි ගැනීමේදි එම අඩුපාඩු සපුරන බවත් එතුමිය වැඩිදුරටත් පැවසුවාය.
- ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලය මඟින් පැවැත්වූ තරගාවලියේ විශිෂ්ඨතම මහජන පුස්තකාල සංරක්ෂණ මධ්‍යස්ථානය තේරීමේ වැඩසටහනේ ප්‍රථම ස්ථානයද, 2013 වසරේ කියවීමේ මාසය වෙනුවෙන් සම්මානයක්ද ලැබීම සම්බන්ධයෙන් කමිටු සාමාජික මහතුන් දැනුවත් කරන ලෙස ගරු සභාපති තුමා විසින් ප්‍රජා සංවර්ධන තුමියට පැවසුවේය.

- ජාතික පුස්තකාල හා සේවා මණ්ඩලයෙන් පැවැත්වූ වැඩමුළුව සඳහා සහභාගි වූ නිලධාරින්ට සභාවෙන් මුදල් ගෙවා පුහුණුව ලබා දීම ගැන මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයේ සහයිකාව ගරු සභාපතිතුමාට ස්තූතිය ප්‍රකාශ කරන ලදි. එයින් ලබා ගත් දැනුමට අනුව ශාඛා පුස්තකාලවල ක්‍රියා කළ යුතු බව ගරු සභාපතිතුමා පැවසුවේය. එම වැඩමුළුව පුස්තකාල විද්‍යාව අනුව ඩී.වී. දශම වර්ගීකරණය 21 වන සංස්කරණය අනුව පොත් වර්ග කිරීම බව පුස්තකාලයාධිපතිනිය පැවසුවාය. ජාතික පුස්තකාලයෙන් මිලදී ගත් 21 වන සංස්කරණ ඩී.වී. දශම වර්ගීකරණය පොත් සඳහා මුදල් ගෙවූ රිසිට්පත ඉදිරිපත් කොට එම සහයිකාවන්ට මුදල් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා පුස්තකාලයාධිපතිනියට උපදෙස් දෙන ලදි.එම පොත පුස්තකාල පරිග්‍රහණ ලේඛණ වලට ඇතුළත් කළ යුතුබව පැවසුවේය. පුස්තකාලයේ පොත් බැදුම්කරණය සම්බන්දව සියළු දෙනාම පොත් බැදුම්කරුගෙන් ඉගෙන ගතයුතු බවත්, සතියට දින දෙකක්වත් පුහුණුව ලැබිය යුතු බව ගරු සභාපතිතුමා පැවසුවේය.

- පුස්තකාලසහයිකාවන් සඳහා පුස්තකාල විද්‍යාව හැදැරීමට සභාවෙන් මුදල් ලබා දිය හැකි බව ගරු සභාපතිතුමා පැවසුවේය. ඒ සඳහා සභාවෙන් අනුමැතිය ලබා ගැනීමට ලිපියක් ඉදිරිපේ කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ප්‍රජාසංවර්ධන නිලධාරීතුමිය දැනුවත් කළාය. එම පාඨමාලාව හැදැරීමට තමා කැමති බව හෙප්පුමුල්ල ශාඛාවේ සේවය කරන ගෞරි මහත්මිය පැවසුවාය. පාඨමාලාව ඉරිදා දිනයන්හි පැවැත්වෙන බැවින් එයට සහභාගිවීම සඳහා තමාගේ විවේක දින දෙකෙන් එකක් සතියේ දිනකත් අනිත් දිනය ඉරිදා දිනය ලබා දෙන ලෙස එතුමිය ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කළේය. සෙනසුරාදා දින ඉරිදා පුවත්පතුත් පුස්තකාලයට ලැබෙන බැවින් පාඨකයන්ට කිසිදු අවහිරයක් එයින් සිදු නොවන බවද ගෞරි මහත්මිය ප්‍රකාශ කළාය. එයට ගරු සභාපතිතුමා, ලේකම් මහතා ඇතුළු කමිටු සමාජික මහතුන් කැමැත්ත ප්‍රකාශ කළේය.

- කමිටු සමාජික හර්බට් වීරක්කොඩි මහතා විසින් කියවීම් මාසයේ උත්සවය ඉතාමත් සාර්ථකව ඉටු කිරීම ගැන ප්‍රජාසංවර්ධන නිළධාරිතුමියට හා පුස්තකාලයාධිපතිනිය ඇතුළු පුස්තකාල කාර්ය මණ්ඩලයට ස්තූතිය ප්‍රකාශ කළේය. පක්ෂයේ ගරු නගර සභා මන්ත්‍රීවරු සීමිත සංඛ්‍යාවක් සහභාගි වූ බවත් විරුද්ධ පක්ෂයේ ගරු නගර සභ මන්ත්‍රීවරු සහභාගි නොවීම කණගාටුවට කරුණක් බව කමිටු සමාජික හර්බට් වීරක්කොඩි මහතා විසින් පවසන ලදි. සහභාගි වූ නගර සභා මන්ත්‍රීවරුන්ට එතුමා ස්තූතිය පුද කළේය. පූජ්‍ය පක්ෂයේ අය සහ පාසල්වල විදුහල්පතිවරු සහභාගි නොවීම අඩුපාඩුවක් බව සුගත් හෙට්ටිආරච්චි මහතා ප්‍රකාශ කළේය. ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය හා පුස්තකාලයාධිපතිනිය විහාරස්ථාන වලට ගොස් පූජ්‍ය පක්ෂයට ආරාධනා කළ යුතු බව ගරු සභාපතිතුමා පැවසුවේය.

- පොල්වත්ත ශාඛා පුස්තකාලයේ නව ගොඩනැගිල්ල සෑදීමේදි පුස්තකාලයකට අදාල සැලැස්ම අනුව සෑදිය යුතු බැවින් එම සැලැස්ම කලින් බැලීම සුදුසු බව කමිටු සාමාජික ජී.ඩබ්.ගුණසිරි මහතා ප්‍රකාශ කළේය.එම සැලැස්ම බලන ලෙස ගරු සභාපතිතුමා ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය දැනුවත් කළේය.

- පොල්වත්ත, මහ අම්බලන්ගොඩ සහ ඕකන්ද ශාඛාවල පොත් දැමීමට කබඩ් අඩු බව එම සහයිකාවන් පැවසුවාය. එම කබඩ් ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියට ගරු සභාපතිතුමා පැවසුවේය.

- ශාඛා පුස්තකාලවල පරණ පුවත්පත් මාස කිහිපයක් තිබිමෙන් ඉඩ අපහසුතා මහ හරවා ගැනීමට මාස තුනෙන් තුනට වෙන්දේසි කිරීමට කමිටුවේ කැමැත්ත ප්‍රකාශ කළේය. මේ පිළිබඳව ගණකාධිකාරිතුමාගෙන් ගරු සභාපතිතුමා අදහස් විමසන ලදි. සෑම ශාඛා පුස්තකාලයකම ටෙන්ඩර් ලේඛණයක් හා ගොණුවක් තබා ගත යුතු

බවත්, ගණකාධිකාරිතුමාගේ අවසරය ලබා ගෙන ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියගේ හා පුස්තකාලයාධිපතිනියගේ අධික්ෂණය යටතේ එම ශාඛාවල සේවය කරන සහයිකාවන් ඇතුලත්ව පුවත්පත් විකිණිමට බලය පැවරීමට පුළුවන් බව ගණකාධිකාරිතුමා ප්‍රකාශ කළේය.මේ සම්බන්ධව සභාවෙන් අනුමැතිය ලබා ගතයුතු බව ගරු සභාපතිතුමා පැවසුවේය.

• ගරු සභාපතිතුමා පාඨක අදහස් පොත් පරීක්ෂා කර කෙරමිණිය ශාඛා පුස්තකාලයේ පාඨකයන් විසින් සඳහන් කර ඇති දිවා ආහාරය සඳහා ප.ව.12.00 සිට ප.ව. 1.00 කාලය ලබා දෙන ලෙස ඉල්ලා සිටිම සම්බන්ධවගරු සභාපතිතුමා විසින් එම වේලාව අපහසු නැද්ද යන්න සම්බන්ධයෙන් එතුමියගෙන් කරුණු විමසන ලදි . එම වේලාව ඇයට අපහසුවක් නොවන බව පුස්තකාල සහයිකා ඒ.ජී.රසිකා මිය පැවසුවාය. ඇයට අපහසුවක් නොවන බව පැවසු හෙයින් එම වේලාවට දිවා විවේකය සඳහා වැසීමට සුදුසු බව ගරු සභාපතිතුමා පැවසුවේය.

• ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා නාම පුවරු ගැන විමසන ලදි. ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය පැවසුවේ පුස්තකාලයේ හා පෙර පාසලේ නම එකට සඳහන් කරන විට නාම පුවරු විශාල වන බැවින් වෙන වෙන සැදිම සුදුසු බවයි.

• මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයේ වහල පිළිසකර කර දෙන ලෙස එම සහයිකාව ඉල්ලීමක් කළාය.වසර කිහිපයක් අලුත්වැඩියා කටයුතු නොකළ බැවින් එය අලුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුත කරන ලෙස ගරු සභාපතිතුමා ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියට පැවසුවේය.

• ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ඔසු පැළ රෝපණය කිරීමට කෙරමිණිය ශාඛා පුස්තකාලයට හා ආයුර්වේදයට ලබා දීය හැකි බව පැවසුවේය.එයට කමිටු සාමාජික සමතුන් සහ ගරු සභාපතිතුමා කැමැත්ත ප්‍රකාශ කළේය.

• කමිටුවේ වැඩ කටයුතු අවසනු කිරීමට පළමුව ස්තුති කතාව කිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතාට ආරාධනා කළේය. එහිදී එතුමා ස්වේච්චාවෙන් කමිටුවට පැමිණි සියළු මහත්ම මහත්මින්ට ස්තුතිය ප්‍රකාශ කරමින් කමිටුවේ වැඩ අවසන් කළේය.

''''''''''''''''''''''''''''''''''''''''''

කමිටු ලේකම්.
නගර සභාව අම්බලන්ගොඩ

''''''''''''''''''''''''''''''''''''''''''

ලේකම්.
නගර සභාව අම්බලන්ගොඩ

''''''''''''''''''''''''''''''''''''''''''

අත්සන් කළේ සභාපති,
නගර සභාව අම්බලන්ගොඩ

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

රජයෙන් මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන වෙන් කරලා තියෙනවනේ සභාපතිතුමණි,අපි සියලුම මන්ත්‍රීවරු කිසියම් දායකත්වයක් පුස්තකාලය වෙනුවෙන් කරන්න ඕන කියන මතයේ මම ඉන්නවා.පුද්ගලිකව මම එය කරනවා.අනෙක් සියලුම මන්ත්‍රීවරු එකතුවෙලා කිසියම් මුදලක් පුස්තකාලයට ලබා දෙනවනම් හොඳයි.මොකද පුස්තකාලයට පොත් ලබා ගැනීම සහ සංවර්ධන කටයුතු ඒ මඟින් කරන්න පුලුවන්.මං එහෙම යෝජනා කරනවා රු.50000.00 ක මුදලක්වත් පුස්තකාල අරමුදලට ලබා දෙන්න පුලුවන්නම් හොඳයි කියලා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැනට මගේ යෝජනාව මං යවලා තියෙන්නේ. මං නැවත සංශෝධනය කරලා යවන්නම්.

**ඒ අනුව 2014.11.27 වන දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝදතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 6** **2014.11.11** වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ගුණ ගරුක සමාජයක් උදෙසා දරුවන් යහමඟට යොමු කිරීම සඳහා ඉරිදා සහ පොහොය දින අතිරේක පන්ති නතර කිරීම පිළිබඳ විශේෂ සාකච්ඡාවේ වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

**ගුණ ගරුක සමාජයක් උදෙසා දරුවන් යහමඟට යොමු කිරීම සඳහා**
**ඉරිදා සහ පොහොය දින අතිරේක පන්ති නතර කිරීම පිළිබඳ- විශේෂ සාකච්ඡාව**

දිනය **-2014.11.11** **වේලාව - ප.ව. 2.30** **ස්ථානය- නගර සභා රැස්වීම් ශාලාව**

**සහභාගිත්වය-**

1. අරුණ ප්‍රදීප් මනිමෙල් වඩු මහතා - ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව.
2. එච්.එල්.අනුර කිත්සිරි මහතා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව.
3. ජේ.ඩබ්ලිව්.ජයන්ත මහතා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව.
4. ජේ.ඩබ්ලිව්.භාෂිණී විජේසූරිය මිය - ගරු නගර සභා මන්ත්‍රීණී, අම්බලන්ගොඩ නගර සභාව.
5. ආර්.පී.දේව් රොහාන් ද සිල්වා මහතා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව.
6. කේ.පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව.
7. අම්බලන්ගොඩ සුධර්ම හිමි - ලේඛකාධිකාරි අම්බලන්ගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලය.
8. යටියන සීවලි හිමි - සුමනමාතාරාමය, කැටැන්තොට.
9. වේනමුල්ලේ සෝභිත හිමි - සිරිණිකේතනාරාමය, පටබැඳිමුල්ල.
10. පී.ඤාණකිත්ති හිමි - බෞද්ධ කටයුතු සමායොජක, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය.
11. මාවරල සුමනරංසි හිමි - සභාපති, දහම් ගුරු සංසඳය.
12. කිරින්දේ සෝරත හිමි - ප්‍රධානාචාර්ය,දයානන්ද දහම් පාසල.

| | | |
|---|---|---|
| 13. | නාඋල විපුලසාර හිමි | - ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, අම්බලන්ගොඩ. |
| 14. | එල්.සුගතදේව හිමි | - ශ්‍රී ධීරක්කන්ද දහම් පාසල,ශ්‍රී විජයාරාමය, කළුවඩුමුල්ල. |
| 15. | රොමේෂ් කාලිංග | - සංවර්ධන සහකාර, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය |
| 16. | නිමල් කුමාර හතරසිංහ මහතා | - ප්‍රධානාචාර්ය, බුද්ධදත්ත දහම් පාසල. |
| 17. | ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා | - ප්‍රධාන ලේකම්, අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය. |
| 18. | ප්‍රින්ස් වරුසවිතාන මහතා | - අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය |
| 19. | ඒ.ජී.යතින් පෙරේරා මහතා | - අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය |
| 20. | දීපාල් සී පින්නදූව මහතා | - සභාපති,අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය. |
| 21. | පී.දෙනියගේ මහතා | - අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය |
| 22. | ඩබ්ලිව්.ටී.කරුණාසිරි ද සිල්වා මහතා | - අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය |
| 23. | න.හේ.බුවින් තිලකචන්ද්‍ර ද සිල්වා මහතා | - අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය |
| 24. | එස්.එම්.දයානන්ද මහතා | -අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය |
| 25. | ජී.ඩබ්ලිව්.ගුණසිරි මහතා | - අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය. |
| 26. | එම්.චම්පා සුමුදු කුමාරි මිය. | - ප්‍රධානාචාර්ය, ශ්‍රී ආරියවංශ දහම් පාසල |
| 27. | ධම්මික සිරිවර්ධන මහතා | - අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය |
| 28. | ශිම්සන් මානවඩු මහතා | - අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය |
| 29. | කේ.එස්.එස්.ද සිල්වා මහතා | - අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය |
| 30. | කපිල මහතා | - උප පොලිස් පරීක්ෂක, පොලිස් ස්ථානය, අම්බලන්ගොඩ. |
| 31. | පී.ඩී.නෝමන් ජයතිලක මහතා | - අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය. |
| 32. | භාරත සමරසේකර මහතා | - ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව. |
| 33. | පී.එච්.එල්. සී. පුෂ්පරාණි මිය | - සංවර්ධන සහකාර, අම්බලන්ගොඩ නගර සභාව |
| 34. | ඩී.වී.තරංගි මිය | - ප්‍රජා සංවර්ධන නිලධාරි, අම්බලන්ගොඩ නගර සභාව. |

**පිළිගැනිම-**

**අරුණ ප්‍රදීප් මනිමෙල් වඩු මහතා, ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව**

අතිපූජා ගරුතර මහ සංඝරත්නය, තරුණ බෞද්ධ සංගමය නියෝජනය කරමින් පැමිණි සියළුම මහත්වරුන් දහම් පාසල් සහ අතිරේක පන්ති, නියෝජනය කරමින් පැමිණි ආචාර්ය මහත්ම මහත්මීන්,

ගරු නගර සභා මන්ත්‍රීවරුන් සහ නිලධාරි මණ්ඩලය පිළිගනිමින් රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

ප්‍රථමයෙන්ම මෙම රැස්වීම පැවැත්වීමට හේතු කාරක වූ අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය විසින් ගරු සභාපතිතුමා වෙත යොමුකරන ලද ලිපිය සහ ගරු සභාවේ තීරණය ඉදිරිපත් කරන ලද අතර මේ පිළිබඳව අදහස් යෝජනා විමසා සිටින ලදි.

**අම්බලන්ගොඩ සුධර්ම හිමි**

ඉරිදා සහ පොහොය දින අතිරේඛ පන්ති නතර කළයුතුය යන කාරණය පිළිබඳ දිගින් දිගටම සාකච්ඡා කිරිම පමණක් ප්‍රමාණවත් නොවන බව සහ මේ සඳහා කඩිනම් ස්ථිර විසඳුමක් අවශ්‍ය බව. මීට වසර ගණනාවකට පෙර ද මේ පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ගනු ලැබුවද එය මාසයක් හෝ දෙකක් ක්‍රියාත්මක වී නැවත පරණතත්වයට පත්වේ. දරුවන් දහම් අධ්‍යාපනයෙන් ඈත් විමෙන් සිදුවන ප්‍රතිවිපාක පැහැදිලි කිරිම අවශ්‍ය නොවේ. එය කාටත් පැහැදිලි කරුණක් අද සමාජයේ දරුවන් සදාචාර විරෝධි කටයුතු කිරිමට ප්‍රධාන හේතුව දහම් අධ්‍යාපනයෙන් දරුවන් ඈත් වීම. මේ නිසා අපි නගර සභාවෙන් ඉල්ලා සිටින්නේ අතිරේක පන්ති පවත්වාගෙන යාමට නගර

සභාවෙන් බල පත්‍රය ලබා දීමේ දී මෙය කොන්දේසියක් ලෙස හෝ එකතු කර මෙම කාර්යය ඉටු කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙසයි.

**<u>දීපාල් සී.පින්නදූව - සභාපති,අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය</u>**

අපේ මූලික අරමුණ අමතර පන්ති නතර කිරීම නොවේ. අපි ඉල්ලා සිටින්නේ අපේ ආගම ඇදහීමට අපට ඇති දිනය සහ දරුවන්ට දහම් අධ්‍යාපනය ලැබීමට ඇති එම පැය කිහිපයේ පමණක් අමතර පන්ති නතර කරන ලෙසයි. මීට පෙර අපි ස්වාමීන් වහන්සේලා සමග එකතු වී මේ පිළිබඳව අතිරේක පන්ති පවත්වා ගෙන යනු ලබන ගුරුවරුන් හමුවී ඉල්ලීමක් කළ ද ඇතැම් ආයතන දැඩි ලෙස දෝෂාරෝපණ එල්ල කළා. විශේෂයෙන්ම ශිල්ප ශාලිකා ආයතනය අපිව දැඩි ලෙස විවේචනය කරමින් කටයුතු කරනු ලබනවා. බහුතර ආයතන කියාසිටින්නේ මේ පිළිබඳව පොදු එකඟතාවයකට පැමිනෙන්නේ නම් තමන් මෙම දින දෙකේ අමතර පන්ති නතර කිරීමට සූදානම් බවයි. නමුත් මේ සඳහා අකමැති කිහිප දෙනෙකුගේ පෙළඹවීම මත ඒ අයත් මෙම කාර්යය අතහැර තිබෙනවා. විශාකා සහ දීප්ති ආයතන අපි සමග එකඟව ඉරිදා සහ පොහොය දින අතිරේක පන්ති නතර කර තිබෙනවා. අපි විශේෂයෙන්ම එම ආයතන දෙකට මෙම අවස්ථාවේ දී ස්තුතිය පළ කර සිටිනවා.එමෙන්ම ගරු සභාපතිතුමාටත් නගර සභා මන්ත්‍රිවරුන්ටත් මේ පිළිබඳව අවධානය යොමු කර අද දින මෙම සාකච්ඡාව සංවිධානය කිරීම සම්බන්ධයෙන් ද ස්තුතිය පුද කර සිටින අතර මේ සඳහා විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>වේනමුල්ලේ සෝභිත හිමි</u>**

අම්බලන්ගොඩ සුධර්ම නායක හාමුදුරුවන්ගේ අනුශාසනා පරිදි තරුණ බෞද්ධ සංගමය විසින් ඉරිදා සහ පොහොය දින අතිරේක පන්ති නතර කිරීම උදෙසා ගනු ලබන මෙම ප්‍රයත්නයට ප්‍රථමයෙන්ම කෘතඥතාවය පළ කර සිටින්න කැමතියි. අපගේ පැරණි වීරෝධාර නායකයන් විසින් පොහොය දින නිවාඩු දිනයක් ලෙස ලබා ගෙන තිබෙන්නේ විශාල සටනක් කරලා. මේ ගැන නොදන්නා අපේ බොහෝ දෙනා එම දිනය අද මුදලට යට කර තිබෙනවා. මුදල් පසුපස හබා යන අමතර පන්ති ගුරුවරු දරුවන්ට ආගම ඇදහීමට ඇති අයිතියද උදුරාගෙන තිබෙනවා. අද සමාජයේ දරුවෝ තමන්ගේ මාපියන් හඳුනන්නේ නැහැ. ඒ අයට කතාකරන්න දන්නේ නැහැ. වැඩිහිටියන්ට ගමේ පන්සලේ නායක හාමුදුරුවන්ට ගෞරව කරන්න දන්නේ නැහැ. මෙය විශාල ගැටළුවක්. මෙහි පාඩුව සිංහල බෞද්ධයන්ට. බෞද්ධාගම දැඩි නීති රීති නැති උපරිම ප්‍රජාතන්ත්‍රවාදිව කටයුතු කළ හැකි ආගමක් නිසා අපේ ආගමික නිදහස අනිසිලෙස ප්‍රයෝජනයට ගෙන තිබෙනවා. පන්සලත් සමග ඉතා ළබැඳිව කටයුතු කළ යුතු ආගමික පරිසරය අවශ්‍යම නවයොවුන් වියේ අපේ දරුවන් ආගමෙන් ඈත් කිරීමට මෙම ඔමළසඳබ ගුරුවරු කටයුතු කර තිබෙනවා. මෙහි ආදීනව අමුතුවෙන් පැහැදිළි කිරීම අවශ්‍ය නොවේ. අද බොහෝම යක් දහම් පාසල් වැසියන තත්වයට පත්ව තිබෙනවා. අපි කොපමණ කැපකිරීම් කළත් මාපියන් තම දරුවන් දහම් අධ්‍යාපනයට යොමු කරන්නේ නැති නම් අපි ගන්නා උත්සහය එලක්
වන්නේ නැහැ. එම නිසා කවුරු විරුද්ධ උණත් අපි හැමෝම එකතු වී මේ පිළිබඳ තිරණයක් ගතයුතුව තිබෙනවා.

**<u>නිමල් කුමාර හතරසිංහ මහතා, ප්‍රධානාචාර්ය, බුද්ධදත්ත දහම් පාසල.</u>**

මෙම කාරණය පිළිබඳ අප පුන පුනා කතාකිරීම අවශ්‍ය නොවේ. මොකද මෙහි අනෙක් පාර්ශවය අද දින මෙම සාකච්ඡාව සඳහා පැමිණ නැති නිසා. දහම් පාසල් මුහුණ දෙන ප්‍රධාන ම ගැටළුවක් තමයි අද කුඩා දරුවන්ට ආදර්ශමත් වැඩිහිටි සහෝදර ශිෂ්‍ය ශිෂ්‍යාවන් පෙන්වීමට නොහැකි වීම. ශිෂ්‍ය නායක නායිකාවන් තොරා ගැනිමටවත් දහම් පාසල්වල අද වැඩිහිටි ළමයි නැහැ.අ.පො.ස. සා.පෙළට පෙනී සිටින දරුවන් පමණක් නොවෙයි. 9,10 ශ්‍රේණිවල දරුවන් ද සා.පෙළ විභාගය ඉලක්ක කරගනිමින් අමතර පන්ති පවත්වන නිසා

දහම්පාසල් එන්නේ නැහැ. 5 ශ්‍රේණියේ දරුවන් බොහෝ දෙනෙක් දහම් පාසලට පැමිණෙන්නේ අගෝස්තු මාසයේ ශිෂ්‍යත්ව විභාගය අවසන් වූ පසුවයි.
ඉතාමත් කාර්ය බහුල ඒකාකාරි ජීවිතයක් ගතකිරිමට සිදුව තිබෙන දරුවන්ට දහම් අධ්‍යාපනයෙන් මනස පිරිසිදු කර නිදහස් කර දෙනවා. ළමයින්ගේ ධාරණ ශක්තිය වැඩිදියුණු කිරිමට මෙය ඉතාමත් වටිනවා. මේ නිසා දරුවන් දහම් අධ්‍යාපනයට වැඩිපුරම යොමුකළ යුත්තේ ඔමඑසදබ ගුරුවරුන් විසින්. උපකාරක පන්තිවලින් බිහිකරන යාන්ත්‍රික දරුවා ආගමික නැඹුරුවකට යොමු කිරීමට අපට තිබෙන්නේ පැය තුනක පමණ කාලයක් පමණයි. එමෙන්ම දරුවන්ගේ විවිධ කුසලතා වැඩි දියුණු කිරීමට දහම් අධ්‍යාපනය විශාල පිටුවහලක් දෙනවා. මේ නිසා මෙම අමතර පන්ති රටාව වෙනස් කිරීම සඳහා සියළු දෙනා එක්ව සාමුහික තිරණයක් ගත යුතුයි.

<u>අරුණ ප්‍රදීප් මනිමෙල් වඩු මහතා, ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව</u>

දහම් අධ්‍යාපනයෙන් දරුවන් ඈත් වීමෙන් සිදුවන මෙම විනාශය පිලිබඳ දක්වන ලද අදහස් අපි පිළිගන්නවා. ඒ සම්බන්ධ කිසිම විරෝධයක් නැහැ. නමුත් වැදගත්වන්නේ මෙය නතර කිරිම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හා වැඩපිලිවෙලවල් පිළිබඳ සාකච්ඡා කිරීමයි. නගර සභාව ලෙස අමතර පන්ති සඳහා බලපත්‍ර ලබා ගැනීමේ දි ගරු ස්වාමින් වහන්ස සඳහන් කළ පරිදි කොන්දේසි පැනවීමේ නීතිමය තත්වය පිළිබඳ සොයා බලා ඒ පිළිබඳ තිරණයක් ගැනිමට අප කටයුතු කරන්නම්. ඒ වගේම මෙම සඳහන් කරන ලද දිනයන්හි දි අතිරේක පන්ති හෝ වෙනත් අධ්‍යාපන කටයුතු සඳහා නගර දේපළ භාවිතා කිරිමට ඉඩ නොදිමට අපි කටයුතු කරනවා.මෙම කාරණය පිළිබඳ පෞද්ගලික පන්ති පවත්වාගෙන යනු ලබන ආයතන හිමි කරුවන් සමග නොව අදාළ විෂයයන් කරනු ලබන ගුරුවරුන් සමග සාකච්ඡා කිරිමෙන් මීට වඩා යහපත් ප්‍රතිඵල ලබාගත හැකි වේවි.

<u>ඉඳුනිල් එදිරි වික්‍රමසූරිය මහතා,ප්‍රධාන ලේකම්, අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය</u>.

මේ කාරණය සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීමට අපි ලොකු උත්සහයක නිරත වුනා. මේ සඳහා අමතර පන්ති 25ට ගියා. විශාකා සහ ශිල්ප ශාලිකා ආයතන දෙක හැර අනෙක් අයතන බොහෝමයක ප්‍රතිඵල සතුටු දායක වුනත් මෙම ආයතන දෙකේ පෙළඹවිම මත අනෙක් ආයතනත් පරණ තත්වයට පත්ව තිබෙනවා.මේ නිසා අප නගර සභාවෙන් ඉල්ලා සිටිනවා ලබන වසරට බලපත්‍ර ලබා දීමේ දී මෙය කොන්දේසියක් ලෙස ඇතුළත් කිරිමට කටයුතු කරන ලෙසට.
ඒ වගේම මෙම පන්ති වල දරුවන්ට තිබෙන්නේ ඉතාමත් අවම පහසුකම්. 15 වාඩිවීමට හැකි බංකුවක 25 වාඩි කරනවා. ප්‍රමාණවත් ලෙස සනීපාරක්ෂක පහසුකම් නැහැ.
අමතර පන්ති හිමියන් අපට චෝදනා කරනවා දහම් පාසල් පරිපාලනමය වශයෙන් වැටී ඇති බව. එමෙන්ම ඔවුන් පන්ති පවත්වන්නේ දරුවන් එන නිසා බවත් සඳහන් කරනවා. මේ නිසා අපි ගෙයින් ගෙට ගොස් දහම් අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳ දැනුවත් කර දරුවන් දහම් පාසල් වලට සම්බන්ධ කර ගැනිමටත් පරිපාලනමය වශයෙන් වැටි ඇති දහම් පාසල් නඟා සිටුවීමට පොදු වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කිරිමටත් කටයුතු කරමින් සිටිනවා.

<u>අරුණ ප්‍රදීප් මනිමෙල් වඩු මහතා, ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව</u>

ඉඳුනිල් එදිරිවික්‍රම සූරිය මහතා විසින් මතු කරන ලද කරුණු සම්බන්ධයෙන් ස්තූතිවන්ත වන බව. මේ වන තෙක් අතිරේක පන්ති සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පැනවීමේ අවශ්‍යතාවයක් නොවුනත් මෙම කාරණා සම්බන්ධයෙන් සළකා බලන විට එය අවශ්‍ය බව පෙන්වා දෙන ලදි.
සමස්ථ අදහස් හා යෝජනා සළකා බැලිමේ දී නගර සභාව විසින් ක්‍රියාත්මක කිරීමට හැකි පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරන ලදි.

1. Tution සඳහා බල පත්‍රය ලබා දීමේ දී සීමා පැනවීම.

2. අතිරේක පන්ති පැවැත්වීම ඇතුළු අනෙකුත් අධ්‍යාපන කාර්යයන් සඳහා ඉරිදා සහ පොහොය දින නගර සභා දේපළ බඳු දීමෙන් වැළකිම.

3. අතිරේක පන්ති සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කිරිම.

4. ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය සම්බන්ධයෙන් සීමා පැනවීමට කටයුතු කිරීම.

5. අතිරේක පන්තිවල ඉගැන්වීම් කටයුතු සිදුකරනු ලබන ගුරුවරුන් දැනුවත් කිරිමට කටයුතු කිරිම.

මේ සඳහා පොලිසියේ සංවිධානයෙන් නැවත රැස්වීමක් කැඳවීමට යෝජනා කර සිටින ලදි.

**ස්තූතිකථාව**

**<u>ජේ.ඩබ්ලිව්.ජයන්ත මහතා ගරු නගර සභා මන්ත්‍රී ,අම්බලන්ගොඩ නගර සභාව.</u>**

සෑම දරුවෙකුටම දහම් අධ්‍යාපනය හිමි විය යුතු අතර බෞද්ධ පරිසරයක අත්දැකීම් ලබා ගැනිමට අවස්ථාව සලසා දිය යුතුය. 1980,1990 ගණන්වලදී ද මේ සම්බන්ධයෙන් විහාරස්ථාන වල නායක ස්වාමින් වහන්සේලා නගර සභාව සහ පොලිසිය සමග එක්ව කටයුතු කරනු ලැබුවත් මාසයක් දෙකක් පමණක් ක්‍රියාත්මක වී පරණ තත්වයට නැවත පත්වුනා. මේ ගැන කළකිරුණු ස්වාමින්වහන්සේලා පසුව එය අත්හැර දැමුවා. ඉන්පසු කවුරුවත් ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබුවේ නැහැ. මේ පිළිබඳව නැවත වරක් තරුණ බෞද්ධ සංගමයේ අවධානය යොමු වීම ගැන ස්තූතිවන්ත විය යුතුය.

මෙම සාකච්ඡාව සඳහා අද දින වැඩමවා වදාළ අති පූජනීය ගරුතර මහසංඝ රත්නයට ගෞරව පූර්වක ස්තූතිය පුද කර සිටින ලදි. ඒ වගේම තරුණ බෞද්ධ සංගමය වෙනුවෙන් පැමිණි සියළුම මහත්වරුන්ටත් දහම් පාසල් ආචාර්ය මණ්ඩලයටත් අතිරේක පන්ති නියෝජනය කරමින් පැවති ගුරු මහත්වරුන්ටත් ස්තූතිය පුද කර සිටිමින් රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි.

**ඒ අනුව 2014.11.11 වන දින පවත්වන ලද ගුණ ගරුක සමාජයක් උදෙසා දරුවන් යහමඟට යොමු කිරිම සඳහා ඉරිදා සහ පොහොය දින අතිරේක පන්ති නතර කිරීම පිළිබඳ විශේෂ සාකච්ඡාවේ වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝදතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 7** **2014.11.18** වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද වෙළඳ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල්ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>අම්බලන්ගොඩ නගර සභාව වෙළඳ සංගමය සමග පවත්වනු ලබන කමිටු රැස්වීමේ වාර්තාව</u>**

දිනය : 2014.11.18 ප.ව.1.30

ස්ථානය : නගර සභා රැස්වීම් ශාලාව

<u>පැමිණීම</u>

1. ඇම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා - සභාපති , නගර සභාව , අම්බලන්ගොඩ.
2. ලලිත් හැලඹගේ මහතා - වෙළඳ සංගමය, අම්බලන්ගොඩ.
3. සමන් අත්තනායක මහතා - වෙළඳ සංගමය, අම්බලන්ගොඩ.

4. ජේ.එච්.වජිර සිල්වා මහතා - වෙළඳ සංගමය, අම්බලන්ගොඩ.
5. භාරත සමරසේකර මහතා - ලේකම් , නගර සභාව , අම්බලන්ගොඩ.
6. එම්.ජී.ආර්. පුෂ්පකුමාර මහතා - සංවර්ධන සහකාර, නගර සභාව අම්බලන්ගොඩ.

අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් පැමිණි සියළු දෙනා පිළිගනිමින් රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි. කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා ලිපි කිසිවක් ලැබී නොමැති බව දන්වන ලදි.වෙලඳ සංකීර්ණය සඳහා දැයට කිරුළ ප්‍රදර්ශණය යටතේ ලක්ෂ 500 ක මුදලක් ලබා දෙන බව දැනුම් දී ඇති බව සභාපති තුමා විසින දන්වන ලදි.

මහා වීදියේ තද බදය ඉවත් කිරීමට කටයුතු කරන ලෙසත් , ත්‍රිරෝද රථ සඳහා නව බලපත්‍ර ලබා නොදෙන ලෙසත් , ගාළු පාර පුළුල් කිරීම සමබන්ධයෙන් සියළු ව්‍යාපාරිකයන් කැඳවා සාකච්ඡා කරන ලෙසත් , නොමිළේ අභ්‍යාස පොත් ලබා දීම සම්බන්ධයෙන් ඇන්කර් සමාගමෙන් වෙළඳ සංගමය හා සභාපති තුමාගේ ඉල්ලීමක් වශයෙන් ලිපියක් ඉදිරිපත් කරන ලෙසත් ලලිත් හැළඹගේ මහතා විසින් ඉල්ලීමක් කරන ලදි.

ගරු සභාපති නීතිඥ ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් අදහස් දක්වමින් කියා සිටියේ පොදු වෙළඳ මහතුන්ට හිරි හැර වන සේ හැසිරෙන බේබදු අශීලාචාර අය මැඩලීම සඳහා අම්බලන්ගොඩ පොලිස් ස්ථානාධිපති තුමාගේ උපදෙස් පරිදි පොලිස් නිලධාරී මහතුන් යෙදවීමට ද , ඒ සඳහා උනන්දුවෙන් ක්‍රියා කරන පොලිස් නිලධාරී මහතුන්ට ත්‍යාග ප්‍රදානයක් කිරීමට කටයුතු පිළියෙළ කිරීමට ද හැකි බැවින් , තෝමස් සිල්වා භාරයෙන් පොලිස් නිලධාරීන් දෙදෙනෙකු යෙදවීම සඳහා පාපැදි දෙකක් අම්බලන්ගොඩ පොලිසියට පරිත්‍යාග කිරීමට තීරණය කර ඇති බවය.

ජේ.එච්. වජිර සිල්වා මහතා අදහස් දක්වමින් බස් නැවතුම් පොළ ආරක්ෂක අංශයට එම භූමියේ සංචාරය කරන ලෙස දන්වන මෙන් ඉල්ලා සිටින ලදි. සභාපති තුමා ලේකම් මහතා ට උපදෙස් දෙමින් ආරක්ෂක අංශය සඳහා ප්‍රධානියෙකු ලබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වන ලදි. එසේම බස් නැවතුම්පොලේ ආරක්ෂක කැමරා පද්ධතියක් සවි කිරීමට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අවසර ලබා දෙන බව ද ගරු සභාපති තුමා දන්වන ලදි. වෙලඳ කුටි වල ආරක්ෂක කැමරා පද්ධතියක් සවි කර එය ආරක්ෂක අංශය මගින් අධික්ෂණය කිරීම සුදුසු බව ද ගරු සභාපති තුමා විසින් ප්‍රකාශ කරන ලදි.

මහා වීදිය කාණු පද්ධතිය පවිත්‍ර කරන ලෙස සමන් අත්තනායක මහතා විසින් ඉල්ලා සිටින ලද අතර වතුර බැස යන පරිදි සකස් කර දෙන ලෙස ඉල්ලා මාර්ග සංවර්ධන අධිකාරියට ලිපියක් යවන ලෙස ගරු සභාපති තුමා විසින් දන්වන ලදි.එසේම වජිර මහතා කියා සිටියේ බස් නැවතුමේ පිරිමි වැසිකිළියේ සින්ක් එක කැඩී වතුර බැසීම බිමට සිදුවන බැවින් එය සකස් කර දෙන ලෙසය.

සකස් කලේ :

එම්.ජී .ආර්.පුෂ්පකුමාර

සංවර්ධන සහකාර

භාරත සමර සේකර

ලේකම්

අම්බලන්ගොඩ නගර සභාව

ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප්

සභාපති

අම්බලන්ගොඩ නගර සභාව

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහිදී මතක් කරන්න ඕන මීට සමගාමීව අම්බලන්ගොඩ පොලීසියට බයිසිකල් 02 ක් අරන් දෙන්න අපි තීන්දු කළා. ඒ වෙළඳ සංගමයෙන් නෙවේ තෝමස් සිල්වා භාරය යටතේ .එතුමාගේ භාරය යටතේ සඳහන් කරලා තියෙනවා පොදු මහජනතාවට අවහිර වන ආකාරයෙන් හැසිරෙන බේබදු අසීලාචාර අය මැඩලීම සඳහා අම්බලන්ගොඩ ස්ථානාධිපතිගේ උපදෙස් පරිදි පොලිස් නිළධාරීන් යෙදීමද ඒ සඳහා උනන්දු වන නිළධාරීන්ට තෑගී ප්‍රධානය කිරීමට හැකියි කියලා.ඒ අනුව අපි කල්පනා කලා තෝමස් සිල්වා භාරය යටතේ බේබදු අය සහ වෙළඳ මහතුන්ට හිරිහැර වන අය මර්ධනය කිරීම සඳහා අම්බලන්ගොඩ පොලීසියට බයිසිකල් 02 ක් ලබා දෙන්න.

**ඒ අනුව 2014.11.18 දින පවත්වන ලද වෙළඳ කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝදතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

- පෙ.ව.10.07 පමණ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා සභාවට පැමිණෙන ලදී.

## (07) ටෙන්ඩර් හා මිළ ගණන්

**7:1 ටෙන්ඩර් හා මිළ ගණන් (-**

**7:1:1 ටෙන්ඩර් (-** නැත

**7:2 මිළ ගණන් (-**

**7:2:1** ටයර් ටියුබ් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සී/ස ශ්‍රී ලංකා ර.වා.වි.නීතිගත සංස්ථාව | සුමිත් මාර්කටින් පුද්ගලික සමාගම | විජේතුංග ටයර් සර්විස් (පුද්ගලික)සමාගම |
|---|---|---|---|---|---|
| 01 | 500 x 12 ටයර් (4PR) | 01 | 5350.00 | 5632.00 | 5310.00 |
| 02 | 500 x 12 ටියුබ් | 01 | 525.00 | 740.00 | 850.00 |
| 03 | 700 x 16 ටයර් (10PR) | 01 | 14100.00 | 13780.00 | 13590.00 |
| 04 | 700 x 16 ටයර් (12PR) | 01 | - | 14270.00 | 14070.00 |
| 05 | 700 x 16 ටියුබ් (Long) | 01(S/V)<br>(L/V) | 1100.00<br>1300.00 | 1600.00 | - |
| 06 | 650 x 16 ටයර් (08PR) | 01 | 11675.00 | 1810.00 | 11650.00 |
| 07 | 650 x 16 ටයර් (10PR) | 01 | 12050.00 | 2190.00 | 12020.00 |
| 08 | 650 x 16 ටියුබ් (India) | 01 | 525.00 | 1370.00 | 1800.00 |

**7:2:2 මිළ ගණන් පැමිණ නැත.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | බී.කේ.එස්.පුද්ගලික සමාගම | පූර්ණ වෙළඳසැල | නිව් පේන්ට් සෙන්ටර් |
|---|---|---|---|---|---|
| 01 | කන්ට්‍රිකී‍්‍රම් වර්ගයේ එමලීෂන් තීන්ත | 4L | 3223.00 | 2232.00 | 2740.00 |
| 02 | එනමල් - කළු පාට | 1L | 989.00 | 744.00 | - |
| 03 | එනමල් - රතු පාට | 1L | 989.00 | 744.00 | - |
| 04 | එනමල් -රෝස පාට | 1L | 989.00 | 744.00 | - |
| 05 | එනමල් -කොළ පාට | 1L | 989.00 | 744.00 | - |
| 06 | එනමල් -බ්‍රිලියන් වයිට් | 1L | 1004.00 | 760.00 | - |
| 07 | එමල්ෂන් -බටර් මිල්ක් | 1L | 904.00 | - | - |
| 08 | එමල්ෂන්-බටර් මිල්ක් | 4L | 3223.00 | 2232.00 | 2740.00 |
| 09 | එනමල්(කළු,රතු,රෝස,කොළ) | 4L | 3624.00 | 2750.00 | 3442.00 |
| 10 | එනමල් බ්‍රිලියන් වයිට් | 4L | 3624.00 | 2750.00 | 3521.00 |

**මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

**7:2:3:1 ඕවලොක් පිහන් ගඩොල් බේසමක් මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | නන්දනී PVC සහ සෙරමික් ටේඩර්ස් | ශ්‍රී සිරි ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික)සමාගම | BKS පුද්ගලික සමාගම |
|---|---|---|---|---|---|
| 01 | ඕවලොක් පිහන් ගඩොල් බේසමක්(රෝස පැහැති) | 01 | 6000.00 | 4725.00 | නැත |
| | පෙඩස්ටීරියල් | 01 | - | | නැත |
| | වොෂ් බේසින් පෙඩස්ටීරියල් | 01 | - | | |

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒක කැඩෙන්නෙ මිනිස්සු බරවෙන නිසා.ඒක බිත්තියට හයි කරලා යටින් බදින්න.

**7:2:3:2 පරිගණක ප්‍රින්ටර්ස් අලුත්වැඩියාව සඳහා මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර පරිගණක දත්ත සටහන් ක්‍රියාකරුගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Techno Computers - Matara | E.M.D Technology - Matara | Metro Computer Technology - Galle |
|---|---|---|---|---|---|
| 01 | Printer Mother Board | 01 | 11950.00 | 12100.00 | 11800.00 |
| 02 | Service Charge | 01 | 3500.00 | | 3000.00 |

**7:2:3:3** 2014 **නගර ක්‍රීඩා සඳහා ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර ප්‍රජා සංවර්ධන නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සක්වා ප්‍රින්ටර්ස් | ඩී.ආර්.එස්.ප්‍රින්ටර්ස් | ආරියදාස ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | ආරාධනා පත් | 200 | 35.00 | 52.50 | 42.00 |
| 02 | සමරු කලාප | 650 | 57.50 | 62.50 | 74.00 |
| 03 | සිව් වර්ණ පෝස්ටර් | 350 | 30.00 | 32.50 | 35.00 |
| 04 | ලියුම් කවර(ආරාධනා පත් වල) | 200 | 3.75 | 6.00 | 4.50 |

**7:2:3:4 පූර්ව මිශ්‍රණ (පෙර මුසු)මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති එකම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | මහ නැඟුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම | කේ.ඩී.ඒ. වීරසිංහ සමාගම |
|---|---|---|---|---|
| 01 | පූර්ව මිශ්‍රන කට් බැක්(19 mm) | 01MT | 14200.00 | ණන් ත් |
| 02 | පූර්ව මිශ්‍රන වෙයාර්න් කෝස් (10mm) | 01MT | 12500.00 | කර නැත |

**7:2:4 මිළ ගණන් පැමිණ නැත.**

**7:2:5 මිළ ගණන් පැමිණ නැත.**

**7:2:6 2015 වර්ෂයේ සඳහා අම්බලන්ගොඩ බස් නැවතුම්පොල පොදු වැසිකිළිය බඳු දීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර ප්‍රසම්පාදන දැන්වීම් පත්‍රයේ සිදු වන ලද මුද්‍රණ දෝෂයක් නිසාවෙන් නැවත මිළ ගණන් කැඳවීමට ගරු සභාව තීරණය කරන ලදී.**

## (08) ගෙවීම්

8.1 ඇ. අංක 1126 යටතේ ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 32267.00 ක් ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

(1) CR පොත් පිටු 80 = රු. 52.50 x 50 = 2625.00
(2) CR පොත් පිටු 120 = රු70.00 x 36 = 2520.00
(3) CR පොත් පිටු 160 = රු. 112 x 36 = 4033.00
(4) CR පොත් පිටු 200 = රු. 140 x 36 = 5040.00
(5) හාප් ෂීට් පැකට් 40 = රු. 370.00 x 40 = 14800.00
(6) ගම් බෝතල් 25 = රු. 70.00 x 25 = 1750.00
(7) මාර්කර් පෙන් 10 = රු. 60.00 x 10 = 600.00
(8) කතුරු 10 = රු. 90.00 x 10 = 900.00
32267.00

8. 2 ඇ. අංක 1127 යටතේ Fedestul fan 03 මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ දූල්ෂාන් මැෂින් සෙන්ටර් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 11397.00 ක් ගෙවීම ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින්

යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

Fedestul fan 03 x 3799.00 = 11397.00

8.3 ඇ. අංක 1130 යටතේ ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 34700.00 ක් ගෙවීම ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

$A_4$ පැකට් 50 x රු . 575.00 = 28750.00

$A_3$ පැකට් 05 x රු . 1190.00 = 5950.00

= 34700.00

8.4 ඇ. අංක 1131 යටතේ අම්බලන්ගොඩ නගර සභාවේ ප්‍රධාන ශාලාවේ වේදිකාව සඳහා තිර රෙදි අලුතින් මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ I Like Tex and Tailors වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 31940.00 ක් ගෙවීම ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.5 ඇ. අංක 1132 යටතේ ගබඩාවට ඉදල් 100 මිලදී ගැනීම වෙනුවෙන් කන්දෙගොඩ ශ්‍රියා ඉන්ඩස්ට්‍රීස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 10000.00 ක් ගෙවීම ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී

8.6 ඇ. අංක 1137 යටතේ 2014.11.05 වන දින L.P. Gas 37.5 kg Sylinder 08 මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ මිළිඳු එන්ටර්ප්‍රස්සස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57744.00 ක් ගෙවීම ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවී සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

L.P. Gas 37.5 kg Sylinder 08 x 7218.00 = 57744.00

8.7 ඇ. අංක 1140 යටතේ ගබඩාවට වරිපනම් තක්සේරු දැන්වීම් පත්‍රිකා (K Forms) 20000 මිලදී ගැනීම වෙනුවෙන් රත්මලාන Tiljay Computer Forms (pvt) Ltd වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 100128.00 ක් ගෙවීම සඳහා ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

K Forms පැකට් 20 (Sheet 1000 බැගින්) x 4470.00 = 89400.00

12 % වැට් = 10728.00

= 100128.00

8.8 ඇ. අංක 1141 යටතේ ගබඩාවට මුද්‍රිත ලේඛන මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 32635.00 ක් ගෙවීම ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

වෙළඳ බල පත්‍ර ඉල්ලුම් පත්‍ර පොත් 50 x 355.00 = 17750.00

2015 අයවැය සිව්වර්ණ පෝස්ටර් 650 x 22.90 = 14885.00

= 32635.00

8.9 ඇ. අංක 1142 යටතේ 2014.11.20 වන දින L.P. Gas 37.5 kg Sylinder 08 මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ මිළිඳු එන්ටර්ප්‍රස්සස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57744.00 ක් ගෙවීම ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

L.P. Gas 37.5 kg Sylinder 08 x 7218.00 = 57744.00

8.10 ඇ. අංක 1143 යටතේ නගර සභා ගල් රෝල සඳහා පැනසොනික් වර්ගයේ 105 D3A බැටරි දෙකක් මිලදී ගැනීම වෙනුවෙන් හික්කඩුව ජයසිංහ බැටරි සෙන්ටර් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 33802.00 ක් ගෙවීම ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

බැටරි 2 x රු. 16901.00 = රු. 33802.00

8.11 ඇ. අංක 1148 යටතේ ගබඩාවට විදුලි උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් බලපිටිය උදය පුෂ්ප ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 3000.00 ක් ගෙවීම ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:12 ඇ. අංක 1150 යටතේ 2014.11.24 වන දින L.P. Gas 37.5 kg Sylinder 08 මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ මිළිඳු එන්ටර්ප්‍රස්සස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු.53920.00 ක් ගෙවීම ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී

L.P. Gas 37.5 kg Sylinder 08 x 6740.00 = 53920.00

8:13 කා.නි. අංක 0350 යටතේ 2014 ජාතික කිටවීමේ මාසය වෙනුවෙන් ශබ්ද විකාශන යන්ත්‍ර හා විදුලි ආලෝකය සැපයීම වෙනුවෙන් පෝරඹ උපේන්ද්‍ර ඉලෙක්ට්‍රිකල්ස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 13000.00 ක් ගෙවීම ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| බෆල් 4 x 1250.00 | = | 5000.00 |
| එෆ්. එන්. මයික් 4 x 500.00 | = | 2000.00 |
| කලර් ලයිට් | = | 6000.00 |
| | = | 13000.00 |

8:14 ඇ. අංක 1151 යටතේ ගබඩාවට කෙම්පෙක්ස් 50kg මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ BKS පුද්ගලික ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 10500.00 ක් ගෙවීම සඳහා ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

50kg x 210.00 = 10500.00

8:15 ඇ. අංක 1152 යටතේ 2014 නගර ක්‍රීඩා උත්සවය සඳහා ෆයිල් කවර 900 ක් මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ සක්වා ප්‍රින්ටර්ස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 29700.00 ක් ගෙවීම ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

ෆයිල් කවර 900 x 33.00 = 29700.00

8:16 ඇ. අංක 1153 යටතේ නගර සභා පෙර පාසල් ළමුන් සඳහා පොත් බෙදා දීම සඳහා පොත් මිලදී ගැනීම වෙනුවෙන් සී / ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 46201.58 ක් ගෙවීම ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

පිටු 80 තනි රූල් අභල් 01 - 160 x 21.43 = 3428.80

1. පිටු 80 කොටු රූල් අභල් 01 - 160 x 21.43 = 3428.80
2. පිටු 80 තනි රූල් අභල් 1/2 - 198 x 21.43 = 4243.14
3. පිටු 80 කොටු රූල් අභල් ½ - 198 x 21.43 = 4243.14
4. පිටු 80 රූල් නැති පොත් - 754 x 21.43 = 16158.22
5. පිටු 40 සුදු ඩ්‍රොවින් පොත් - 179 x 32.80 = 5871.20
6. පිටු 40 කළු ඩ්‍රොවින් පොත් - 179 x 49.32 = 8828.28

46201.58

8:17 2014 සැප්තැම්බර් මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පුද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11453 I | 42433.70 |
| 23453 I | 2596.38 |
| 34453 I | 3005.31 |
| 52453 I | 33554.97 |
| 53454 | 17208.25 |
| 62453 I | 25996.16 |
| | 124794.77 |

විදුලි බිල්පත් සඳහා රු' **124794.77** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:18 2014 සැප්තැම්බර් මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11453 II | 9441.60 |
| 23453 II | 16941.24 |
| 34453 II | 784.72 |
| 52453 II | 8035.10 |
| 62453 II | 23295.00 |
| | 58497.66 |

ජල බිල්පත සඳහා රු. **58497.66** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීමටගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:19 2014 සැප්තැම්බර් මාසයට අදාල දුරකතන බිල්පත සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11452 | 24713.38 |
| 12452 | 1211.73 |
| 25451 II | 1306.74 |
| 62452 I | 7659.63 |
| | 34891.48 |

දුරකථන බිල්පත සඳහා රු. **34891.48** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ

අනුමැතිය ලබා දෙන ලදී.

8:20 අම්බලන්ගොඩ නගර සභාව මගින් පාලනය වන පුස්තකාලට 2014 ඔක්තෝම්බර් මස සඳහා සපයන ලද පුවත් පත් වෙනුවෙන් එම්.එස්. වීරසිංහ මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු.39365.00 ක මුදලක් ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:21 ප්‍රසම්පාදන දැන්වීම් පල කිරීම වෙනුවෙන් ලේක්හවුස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු.30576.00 ක මුදලක් ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:22 නගර සභාව සතු 252 -0730 කැබ් රථය සඳහා 2014 ඔක්තෝම්බර් මස 01 - 15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 24840.40 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:23 නගර සභාව සතු 49-9421 ට්‍රැක්ටරය සඳහා 2014 ඔක්තෝම්බර් මස 01 - 15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15878.10 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:24 නගර සභාව සතු GL-9369 ගලි බවුසරය සඳහා 2014 ඔක්තෝම්බර් මස 01 - 15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 23620.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:25 නගර සභා කාර්යාලයේ දූරකථනයෙහි සැප්තැම්බර් මස බිල රු.5678.92 ක් වන අතර සහනදායක මුදල වන රු.5000.00 ක මුදල ඉක්මාව ගෙවීමට ඇති රු. 678.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශයෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:26 2014 නොවැම්බර මස වැට් මුදල් ආපසු ගෙවීම වෙනුවෙන් රු.50000.00 මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි දේශීය ආදායම් කොමසාරිසි ජනරාල් වෙත ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින්

යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:27 2014 ජූලි මස සිට සැප්තැම්බර් මස දක්වා වැට් මුදල් ආපසු ගෙවීම වෙනුවෙන් රු.209568.46 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි දේශීය ආදායම් කොමසාරිසි ජනරාල් වෙත ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:28 ජූලි ,අගෝස්තු ,සැප්තැම්බර් මාස වලට අදාලව වවුචරය ඉදිරිපත් කරන ලද ගරු මන්ත්‍රීවරුන්ගේ ගමන් වියදම් ලෙස රු.27000.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:29 ජෝන් කීල්ස් ආයතනය මගින් මිලදී ගන්නා ලද ඡායා පිටපත් යන්ත්‍රය හා රෝනියෝ යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා වාර්ෂික ගිවිසුම් වෙනුවෙන් රු.33500.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ජෝන් කීල්ස් ආයතනය වෙත ගෙවීම ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**(09** .sKqï

**9.1** 2014 ඔක්තෝම්බර් මාසය සඳහා වියදම් වාර්තාව , වියදම් වැය විශ්ලේශණය, පොදු ගිණුම , මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාගත කිරීම.

ඒ අනුව 2014 ඔතක්තෝම්බර් මස ගිණුම් වාර්තා පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**(10)** weia;fïka;=

10:1) පියසේන ළමා ක්‍රීඩාංගනය නවීකරණය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු.585021.16 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

10:2) මහ අම්බලන්ගොඩ බවානි කර්මාන්තශාලාව අසලින් යන හරස් පාර ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු.651404.03 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

10:3) හීගල්දූව පාරේ කොටසක් නවීකරණය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු.164957.10 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

10:4) පිරිස්වෙද මාවත හරස් පාර ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී විසින් සකස්කරන ලද රු. 941335.18 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

10:5) ගම නැගුම 2014 වැඩ සටහන යටතේ පටබැඳිමුල්ල ආදාහනාගාරයේ අභ්‍යන්තර මාර්ග කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරා සංවර්ධනය කිරීම වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු.1360000.00 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව ගරු මන්ත්‍රීවරුන්ගේ දැනගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.**

10:6) පින්නදූව එල්.සී.ද සිල්වා මාවතේ හරස් පාර කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරිණිය විසින් සකස් කරන ලද රු.205519..60 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**(11)** fjk;a lreKq

**11:1** ‘ කසල ප්‍රවාහන කටයුතු විධිමත් කිරීම සඳහා වාහනපහසුකම් ඉල්ලීමයි ’ මැයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාවේ දෛනික කසල බැහැර කිරීමේ කටයුතු සඳහා පවතින ට්‍රැක්ටර් 04 මේ වන විට දැඩි ලෙස අබලන්ව පවතින බවත් ,මේ වන විට ට්‍රැක්ටර් රථයක් ගලවා දමා ඇති බැවින් පටබැඳිමුල්ල හා විලේගොඩ ආදී ප්‍රදේශ වල දෛනික කසල ඉවත් කිරීම පස්වරු සේවයේ ඉටුකිරීමට සිදු වී ඇති බව සඳහන් කර තිබූ අතර නගර සභාව සතුව අතිරේක ට්‍රැක්ටර් රථයක් නොමැති වීම හේතුවෙන් වසර ගණනාවක් තිස්සේ දෛනික කසල බැහැර කිරීමේ කටයුතු අඩපණ වූ අවස්ථා පවතින බවත් එබැවින් නගර සභාවේ සෞඛ්‍ය අංශය සඳහා නව ට්‍රැක්ටර් රථයක් හෝ දෙකක් ලබා දෙන්නේ නම් එය දෛනික කසල බැහැර කිරීම සඳහා මහත් සහනයක් වන බවද සඳහන් කර තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් නගර සභාවේ සෞඛ්‍ය අංශය සඳහා නව ට්‍රැක්ටර් රථ 02 ක් ලබා ගැනීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>

මම අද කතා කරන්න හිටියේ විලේගොඩ දවස් 14 ක් කුණු ඇදලා නෑ.ධම්මානන්ද මාවතේ විශේෂයෙන්ම ප්‍රජාපතිය අසල ළමයි යන හා බොහෝ දෙනෙක් භාවිතා කරන පාරේ කුණු ගොඩ ගහලා තියෙනවා.සමහර ගෙවල් වල තියන් ඉන්නවා.මිනිස්සු අපටත් බනිනවා.කුණු පණුවොත් ගහලා. මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට කීවාම ට්‍රැක්ටර් නැති කතාවක් කීවේ.පොඩි ට්‍රැක්ටරයක් එවුවා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ගැටලු පවතින නිසා තමයි මෙහෙම වෙලා තියෙන්නේ.ට්‍රැක්ටරයක් කැඩුණොත් අතිකාල සේවය තමයි යොදවන්න වෙන්නේ. අපි සභාවේ අනුමත කරගෙන තිබුණොත් අපිට ට්‍රැක්ටර් 02 ක් ගන්න පුලුවන්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>

සභාපතිතුමණි ට්‍රැක්ටර් රථ නැතිව කුණු ඇදීම නතර වේලා තියෙනව නම් අපි ට්‍රැක්ටර් රථ ලබා ගැනීමට විරුද්ධ වෙන්නෑ.සභාපතිතුමණි මම කියනවා සවස් කාලයේ හරි මේක කරන්න කියලා.කලින් මහ අම්බලන්ගොඩ යන එක ඒ පැත්තෙන් ගිහින් තමයි ආවේ.එතකොට ටික ටික හරි ඇදෙනවා.දැඩි විරෝදතාවයක් තියෙනවා.ප්‍රජාපතිය ළඟ කාණු සුද්ධ කරන්න දැම්මා.දවසයි දෙකයි කරේ, දැන් ඒක කරන්නෑ.ඒක දිගමට කර දෙන්න කියලා විලෝගොඩ ගම් වාසීන්ගේ ඉල්ලීමක් තියෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල්ද සිල්වා මහතා කතා කරමින්</u>

මෙයටම සම්බන්ධයි සභාපතිතුමණි,මහ වීදියේ අලුත් පාර අපට අයිති නැතත් කාණු ටික සුද්ධ කර දාන්න පුලුවන් නම් හොඳයි.මොකද දරුණු විදියටම හිර වෙනවා.මිනිස්සු අපට බනිනවා නගර සභාවෙන් මේක කරන්නෑ කියලා.මිනිස්සු දන්නෑනේ මේවා සභාවට අයිති නැති බව.මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට කීවම එතුමා සුද්ධ කරන්න දානවා.නමුත් ඒවා හිර වෙනවා.මේ කාණු දිනපතාම සුද්ධ කරන්න ඕන.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මහ වීදියේ කාණු බැහැලා තියෙන්නේ.මම මාර්ග සංවර්ධන අධිකාරියටත් දැන්වුවා.විශේෂ ඉල්ලීමක් කළා අපට පතුලවත් දාන්න අවසර දෙන්න කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

දවස් 02 වත් සැරයක් කවුරුන්ම හරි දාලා මේක සුද්ධ කරන්න පුලුවන් නම් හොඳයි.මොකද නගර සභාවට මේක විශාල අපකීර්තියක්.ජනතාවට කියන්න බැනේ මේක අපට අයිති නෑ කියලා.ජනතාව කියන්නේ මන්ත්‍රීවරුත් යනවා අහක බලාගෙන කියලා. මට අනන්තවත් කියලා තියෙනවා.අඩුම ගානේ මහ වීදියේ ටවුන් ඒරියා එකේ කාණු ටිකවත් සුද්ධ කරන්න පුලුවන්නම් හොඳයි.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දින පතා මහවීදියේ කාණු සුද්ධ කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමණි මම මේ කතා කරන්නේ මාර්කට් හන්දියේ ඉදලා පොළ ගාවට වෙනකම්.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගොඩක් දෙනෙක් ලෑලි දලා තියෙනවා මං දැකලා තියෙනවා.මහින්ද ප්‍රෙස් එකේ වගේ අඩි 15 ක් විතර එක දිගට තනි කොන්ක්‍රීට් එකක් දාලා.ඒවා සුද්ධ කරන්න බෑ මොන විදියකටවත්.ඇත්තටම මහ වීදිය අයිති මාර්ග සංවර්ධන අධිකාරීයට.අපි මේ සම්බන්ධයෙන් විශාල වශයෙන් ඉල්ලීම් කළා මේ වතුර රැදෙන ස්ථාන පිළිසකර කරන්න කියලා.මේ සමහර කාණු සුද්ධා බැදපු කාණු.මේවා අලුතින් සෑදිය යුතු කාලය ඇවිල්ලා තියෙන්නේ. ඇත්තටම අපේ වෙළඳ ව්‍යාපාරිකයොත් ඒ කාණු සියල්ලම වහලා කොන්ක්‍රීට් කරලා තියෙන්නේ.ලේකම් මහත්තයා මේ අයට දැණුම් දෙන්න සුද්ධ කරන්න පුලුවන් විදියට මේවා සකස් කරන්න කියලා සති 02 ක් විතර කල් දීලා නැතිනම් කඩලා සුද්ධ කරලා දාන්න.වෙන කරන්න දෙයක් නෑ.ට්‍රැක්ටර් ටේලර් ලබා ගැනීමේ අවශයතාවයක් නෑ.මොකද අපි ටේලර් නගර සභාවේ හදන නිසා.

**ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්**

පවතින ට්‍රැක්ටර් අපට තව එක වාරයක්වත් යොදන්න බැරිද සභාපතිතුමා ,අතිකාල දීමනා දීලා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අතිකාල දීමනා ලබා දෙනවා.කිසිම ගැටලුවක් නෑ.අපි උපරිම ලබා දෙනවා සෞඛ්‍ය අංශයට.

**ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්**

විපක්ෂ නායකතුමා කියන ආකාරයට ඒ වගේ ගැටලුවක් තියෙනවනම් තව එක වාරයක් යොදන එක හොඳයි.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙතන තියෙන ගැටලුව වෙන්නේ , මම බලලා තියෙනවා මේ අය වැඩට එන්නේ උදේ 06.00 ට.ඉතින් සමහර විට ගෙදරින් 05.00 ට විතර එන්නේ.වැඩ ඉවර වෙන්නේ 02.00 ට.අපි මොවුන්ට කෑම පැයක් දෙන්නෙත් නෑ.මේ

02.00 ඉදන් 06.00 වෙනකම් කරන වැඩ මුරය බොහෝ විට අසාර්ථකයි.මොකද ඇත්තටම ඔවුන්ට කන්න බොන්න වේලාවක්වත් නැනේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>

සභාපතිතුමණි සියලුම කණ්ඩායම් වලින් එක් කෙනා බැගින්වත් අරගෙන බැරිද තව කණ්ඩායමක් හදන්න හවසට කුණු අදින්න.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එහෙම නව නිර්මාණයක් කරන්න වෙනවා එහෙම වුනොත්.මම අද කුණු ඇදීමේ නව කාලසටහන ඉදිරිපත් කරනවා.මන්ත්‍රීවරුන්ට බලා ගන්න පුලුවන්.

- පෙ.ව.10.30 පමණ ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා සභාවෙන් පිටව යන ලදී.

**11:2** **'** සුනාමි ව්‍යසනයෙන් හා ඉඩම් කැබලි කිරීමේදී අහිමි වූ දේපල හා සංශෝධනය විය යුතු දේපල පිළිබඳ වාර්තාව **'** මැයෙන් ආදියම් නිළධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

වරිපනම් ලේඛණ වල හා පරිගණක වැඩසටහනේ ඇතුලත්ව ඇති යම් යම් දේපල මේ වන විට විවිධ හේතුන් මත නැති වී ගොස් ඇති බවත් එනමුදු තවමත් මෙම දේපල වරිපනම් හිග එකතුවෙමින් විශාල හිග මුදලක් එක් රැස් වී ඇති බවත් එම දේපල වරිපනම් හිග ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා අනුමැතිය ඉල්ලා තිබුණි.

කොටස් අංක 01 මුහුදු වෙරළ පාරේ 53/3 ජී.ජී.කළ්‍යාණවතී රු.3932.93 , 75/4 කේ.ඩබ්.මිත්‍රසේන රු. 1590.04 ,75/7 එස් . ඒ. ජයරත්න රු.1074.71 ,75/33 මාදුවගේ ශාන්ත රු.1059.78 ,75/34 කේ.ඩබ්. පද්මානන්ද රු.1097.74 , 79/5 ආර්.එම්. පියසීලි රු.1215.80 , 79/8 ඩී.රත්නසිරි රු.1059.79 ,83/12 ජී.සනී රු.1110.01 ක් ලෙස හිග මුදල් පවතින බවත් එය 2014.12.31 වන දිනට මුළු හිග මුදල රු.11140.80 ක් බවත් මෙම දේපල සුනාමියට හසු වී ඇති නිසාවෙන් දැනට හිස් ඉඩම් ලෙස පවතින බවත් අයිතිකරුවන් ධම්මිකපුර හා ටී.එච්.ඩබ්. නිවාස යෝජනා ක්‍රමයේ පදිංචිව සිටින බවත් මේවායේ වාර්ෂික වටිනාකම රු. 100.00 කළ යුතු බව සඳහන් කර තිබුණි.

කොටස් අංක 02 මුහුදු වෙරළ පාරේ 27/2 අයිතිකරු(හි.කි)කේ .චන්ද්‍රසේකර රු.263.67,27/3 අයිතිකරු (හි.කි.)එම්.ජගත් අනුර රු. 299.47 ,35D අයිතිකරු(හි.කි)කේ.එච්. සමන්ති රු.299.46 , 41ජී.ජී.බී.නිශ්ශංකද සිල්වා රු.157.99 , 41B අයිතිකරු(හි.කි)එල්.ජී.ලාල් මෙන්ඩිස් රු. 317.72 , 45A අයිතිකරු(හි.කි) ඩබ්.සම්පත් රු.394.08 බවත් මෙම දේපල සුනාමියට හසු වීම නිසා දැනට හිස් ඉඩමක් ලෙස පමණක් පවතින බැවින් වාර්ෂික වටිනාකම රු.100.00 කළ යුතු බව සඳහන් කර තිබුණි.

කොටස් අංක 02 මුහුදු වෙරළ පාරේ 33/3A අයිතිකරු (හි.කි)ඒ. පාකීම් රු.384.90(තාරෂීට් තහඩු සෙවිලි ගෙය),33/4 අයිතිකරු(හි.කි) කේ.සාමෙල් රු.239.61 (තාරෂීට් තහඩු සෙවිලි ගෙය) , 33D/3 අයිතිකරු (හි.කි)එම්.ප්‍රියලාල් රු.574.87(ඇස්බැස්ටස් සෙවිලි ගෙය), 33D/4 අයිතිකරු (හි.කි)එම්.ජී.ජේ. අනුර රු.162.50 ක් ලෙස හිහ මුදල් පවතින බවත් 2014.12.31 දිනට මුළු හිහය රු.1361.88 බවත් මෙම දේපල සුනාමියට හසු වීම

නිසා දැනට මෙම භූමිද මුහුදට යට වී ඇති බවත් එම නිසා මෙම දේපල ලේඛනයෙන් ඉවත් විය යුතු බවත් සඳහන් කර තිබුණි.

කොටස් අංක 13 තල්ගස්ගොඩ පාර ,වරිපනම් අංක 161 අයිතිකරු (හි.කි)ඊ.ආර්.ද. සිල්වා රු.79975.13(කුරඳු ඉඩම) මෙම කුරුඳු ඉඩම කැබලි කිරීමෙන් පසු ඒවාට වරිපනම් අංක ලබා දී ඇති බවත් නමුත් මුල් දේපල ලේඛණයෙන් ඉවත් වී නොමැති බවත් 2006.01.02 වන දින වන විටත් රු.26361.00හිඟයක් පැවති බවත් සඳහන් කර තිබුණි.

245 , නගර සභාව , අම්බලන්ගොඩ(කුරුඳු ඉඩම) රු.28419.48 (කොටස් අංක 12/A/2 ලේඛණයේ මෙම අංකය දරණ දේපලෙහි අයිතිකරු ලෙස එම්.ඩබ්.කරුණාරත්ත යන නම සඳහන්ව ඇතත් ATD/12A/190/2007 මඟින් ද ෆිනෑස් කම්පැණි නමට හැර වී ඇති බවත් 12/A/4 ලේඛණයේද 245 ලෙස අංකයක් සඳහන්ව ඇති අතර එය 245 මුල් ඉඩම කැබලි කිරීමෙන් පසුව ලොට් 18 සඳහා ලබා දුන් අංකය බවත් මේ අනුව 245 ලෙස ලේඛණ 2 ක සඳහන්ව ඇති බව පැහැදිලි වන බවත් ලේඛණ වල මෙසේ සඳහන් වුවත් ආදායම් අංශයට ලබා දී ඇති හිඟ ලැයිස්තුවේ 245 අංකය නගර සභාව- අම්බලන්ගොඩ හට අයත් ලෙස සඳහන්ව ඇති බවත් ,නමුත් ද ෆිනෑස් කම්පැනි හී ලොට් 18 සඳහා නගර සභාවට අයිතියක් නොමැති අතර ලොට් 03 කොටස පමණක් නගර සභාවට පවරා දී ඇති බවත් ,අවසාන වරට නගර සභාවට අයත් මෙම දේපල සඳහා 2012.01.02 වන දිනට රු.107.00ක් ගෙවා ඇති අතර එදිනට රු.2142.00හිඟයක් පවතින බවත් සඳහන් කර තිබුණි.)ලොට් අංක 03 - 245/L/12 රු.00.00, ලොට් 18- ද ෆිනෑස් කම්පැනි රු.28419.48 හිඟයක් පවතින බවත් 2014.12.31 දිනට තල්ගස්ගොඩ පාර මුළු හිඟය රු.108394.61 බවත් සඳහන් කර තිබුණි.

කොටස් අංක 01,02, හා 13 හී සංශෝධනය විය යුතු දේපල සංශෝධනය කිරිමටත් , ඉවත් කළ යුතු දේපල ඉවත් කිරීමටත් අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>ගරු සභාපති ඈම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙය RI, CCR සහ ලේකම් මහතා විසින් නිර්දේශ කරලා තියෙනවා.සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>

සභාපතිතුමණි,මුහුද් වෙරළ පාරේ ප්‍රකාශ කළ ඉඩම් අපි දන්නවා සුනාමියට ගියා.ඒවායේ දැනට අයිතිකරුවන් කවුද.

<u>ගරු සභාපති ඈම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒ අයිතිකාරයින්ගේ නමටම හිස් ඉඩමක් වෙනුවෙන් රු.100.00 ක් අය කරන්න යෝජනා කරනවා.එතකොට රු.4.00 වැටෙන්නේ.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් කොටස් අංක 01,02, හා 13 හි සංශෝධනය කළ යුතු දේපල සංශෝධනය කිරීමටත් , ඉවත් කළ යුතු දේපල ඉවත් කිරීමටත් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:3** ‘ ෆන්පිපානී පෙර පාසලේ නම, සෙනෙහස පෙර පාසල ලෙස වෙනස් කර ගැනීම ’ මැයෙන් තල්ගස්ගොඩ, විස්කම් පෙදෙසේ පදිංචි ජී.ජී. කාන්ති ගුණතුංග විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

තල්ගස්ගොඩ සෙනෙහසපෙර පාසලෙහි බඳු කුලී ගෙවීම සිදු කරනුයේ ෆන්ජිපානී පෙර පාසල යන නාමයෙන් බැවින් එහි නම සෙනෙහස පෙර පාසල ලෙස වෙනස්කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් තල්ගස්ගොඩ පෙර පාසලෙහි නම සෙනෙහස පෙර පාසල ලෙස වෙනස් කිරීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:4** ' ඉදිරි මැතිවරණය සඳහා ඡන්දය භාවිතා කිරීමට හැඳුනුම්පත් කඩිනමින් ලබා දීමට ' මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඉදිරියේදී පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය සඳහා පිළිගත් හැඳුණුම්පතක් අවශ්‍ය බවත් ග්‍රාම නිළධාරීන් මඟින් කරන ලද සමීක්ෂණයට අනුව මෙම කොට්ඨාශය තුළ හැඳුනුම්පත් නොමැති , අපහැදිලි හැඳුනුම්පත් ඇති හා හැඳුනුම්පත් අස්ථානගතව ඇති පිරිස 1500 ට ආසන්න බවත් මෙම අය සඳහා කඩිනමින් හැඳුනුම්පත් ලබා දීමේ ජංගම සේවාවන් 03 ක් අම්බලන්ගොඩ , බටපොල හා මීටියාගොඩ කලාපයන්හී නොවැම්බර් 27 ,28 හා 30 යන දිනයන් හී පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් ඒ සඳහා පූර්ව ප්‍රචාරක කටයුතු ,ඡායාරූප ලබා ගැනීම, මුද්දර ලබා ගැනීම යන අවශ්‍යතා හඳුනාගෙන ඇති බවත් ඒ අනුව ලබා දිය හැකි අනුග්‍රහය ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් පූර්ව ප්‍රචාරක කටයුතු සඳහා නගර සභාව සතු QL - 6618 අංක දරණ ත්‍රීරෝද රථය සහ ශබ්ද විකාශන යන්ත්‍රය සහා ආවරණ අනුමැතියට යටත්ව ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:5** ' 2014 වර්ෂයේ අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ වසා ඇති ව්‍යාපාර_නාම ලේඛනය ' මැයෙන් විෂය ලිපිකරු විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

<u>**අම්බලන්ගොඩ බල ප්‍රදේශයේ 2014 වර්ෂයේ වසා ඇති ව්‍යාපාර**</u>
<u>**නාම ලේඛණය**</u>

| | | |
|---|---|---|
| 01. තේ/කෝපි කඩ | එස්.එම්.අනූපමා උදයාංගනී | 234 B,පොල්වත්ත පාර |
| 02. සැලුන් | කේ.ලීලාරත්න ද සිල්වා | 02.පොල්වත්ත වෙළඳ සංකීර්ණය |
| 03. මස්/බිත්තර | එම්.ඒ.එම්.නිස්ටර් | 09. දුම්රිය පොළ පාර |
| 04. මාළු | රුහුණුගේ නුවන් ශ්‍යාමල් | 187. මහා වීදිය |
| 05. එළවළු/ පලතුරු | ලසන්ත රුක්මල් | 226. මහා වීදිය |
| 06. එළවළු/ පලතුරු | ටී.එච්.රංජිත් | 137. ගාලු පාර |
| 07. හෝටල් | ඉරාජ් ලිලන්ත | 493 ඒ මහා වීදිය |
| 08. කම්මල | ඊ.බී.රත්නපාල | 02 . ගාලු පාර |
| 09. ස්ටූඩියෝ | හසිනි හංසිකා කළුගලගේ | 291. ගාලු පාර |
| 10. තුරග තරග ඔට්ටු | ආර්.එම්.පර්සි | 15. වෙළෙඳ පොල |
| 11. ප්‍රදර්ශනාගාර | කළමනාකරු. අබාන්ස් ෂෝ රූම් | 353. මහ වීදිය |
| 12. මසා නිමි ඇඳුම් | පී.ඩබ්.මධුකා | 187. මහා වීදිය |
| 13. තොග ගබඩා | මොහොමඩ් ෆයිම් | 14 . පස් වන හරස් වීදිය |
| 14. මෝටර් රථ අමතර කොටස් | ඩී.පී.ශාන්ත | 312. මහා වීදිය |
| 15. රූපලාවන්‍යාගාර | කේ.ජී.එස්.ද සිල්වා | 16. හතර වන හරස් වීදිය |
| 16. විදුලි උපකරණ වෙළදාම | කේ.නිශාන් රවීන්ද්‍රනාත සිල්වා | 176. මහ වීදිය |

| | | |
|---|---|---|
| 17. විදුලි උපකරණ වෙළදාම | ඒ.කේ. දේවප්‍රිය | 24 කේ, ගාලු පාර |
| 18. ස්වර්ණාභරණ වෙළදාම | එම්.ටී.මොහොමඩ් | 163. ගාලු පාර |
| 19. පූජා භාණ්ඩ අලෙවිය | ඒ.ඩී.දිනිදු කුමාර | 25 Bල ගාලු පාර |
| 20. තීන්ත අලෙවිය | එම්.ටී.එෆ්.මෙන්ඩිස් | 215. මහ වීදිය |
| 21. මුළුතැන්ගෙයි උපකරණ | ශාන්ත ප්‍රනාන්දු | 36. අළුත් පාර |
| 22. ඒජන්සි | තුෂාර දමින්ද සිරිමාන්න | 145B/4, පොල්වත්ත පාර |
| 23. පාවහන් අලෙවිය | එම්.එස්.එම්.දහුලාන් | 02. වෙළෙද පොල |

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අම්බලන්ගොඩ නගර සීමාව තුළ වසා ඇති ව්‍යාපාර නාම ලේඛණයෙන් ඉවත් කිරීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(12)** න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:01** " කසල එකතු කිරීමේ මාර්ග සටහන(නව යෝජිත)'' මැයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014.11.07 වන දින මාසික සභාවේ ඉල්ලීම පරිදි කසල එකතු කිරීමේ නව මාර්ග සටහන (යෝජිත)අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ට්‍රැක්ටර් අංක 01 රියදුරු ගාමිණි සහ පී.එච් .නිශාන්ත ගාමිනීගේ ටෙලිෆෝන් අංක තියෙනවා.මන්ත්‍රීවරුන්ට ඉතාමත් වැදගත්.පටන් ගන්නේ පරණ ඇල්පිටිය පාර ,මහජන ක්‍රීඩා පිටිය, වටරවුමේ සිට පරණ පාර, දේවානන්ද විද්‍යාලය, සිංගර් හන්දිය, බැහැර කිරීම.දෙවන ගමන තියෙන්නේ හල්වතුර පාරවල් ,කුලරත්ත පාර , ආර්.පී.ආතර් ද සිල්වා පාර , තානායම් පාර , ගාලු පාර දොළොස්මහ දක්වා, මෝදර දේවාල පාර, හිරේවත්ත , බැහැර කිරීම.මේ ආකාරයෙන් තියෙනවා.මන්ත්‍රීවරුන්ට බලන්න පුලුවන්.අපි සියලු දෙනාටම ලබා දීලා තියෙනවා.සංශෝධන තියෙනවා නම් ඉදිරිපත් කරන්න.දුරකථන අංක තියෙනවා අදාල නිළධාරීන්ගේ .අවශ්‍ය නම් කතා කරන්න පුලුවන්.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් කසල එකතු කිරීමේ යෝජිත නව මාර්ග සැලැස්ම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:02** "2014 නොවැම්බර් මස වාර්තාව" මැයෙන් නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඖෂද සංයෝජක විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ආයතනයෙහි සායන පැවැත්වූ දින ගණන 18 ½ බවත්,ආයතනයට පැමිණි රෝගීන් සංඛ්‍යාව 265 ක් බවත් , රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය 14 ක් බවත්, මාසය සඳහා වැය වූ ඖෂධ වල මුළු වටිනාකම රු.20911.06 ක් බවත් , රෝගියෙක් සඳහා වැය වූ මුදල රු.78.90 ක් බවත් සඳහන් කර තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම වාර්තාව සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:03** “කන්ද ප්‍රජා ශාලාවට පුටු 50 ක් සහ ප්ලාස්ටික් මේස 02 ක් ලබා ගැනීම ” මැයෙන් කරිත්ත කන්ද ප්‍රජා මණ්ඩලය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014.11.15 වන දින පැවැති ප්‍රජා මණ්ඩල රැස්වීමේදී කන්ද ප්‍රජා ශාලාව සඳහා පුටු 50 ක් ලබා දීමට එකඟ වූ බවත් ඒ සමඟම ප්ලාස්ටික් මේස 02 ක්ද ලබන සභා වාරයට පෙර ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් කන්ද ප්‍රජා ශාලාව සඳහා පුටු 50 ක් හා ප්ලාස්ටික් මේස 02 ක් ලබා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:04** “පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගනය නොමිලයේ වෙන් කරවා ගැනීම ” මැයෙන් ශ්‍රී සුගත බිම්බාරාමයේ තැන්නෙකුඹුරේ සුමංගල හිමි විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ශ්‍රී ධම්මානන්ද දහම් පාසලේ දරුවන් විසින් පවත්වන්නට යෙදුන සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය 2014.11.29 වන දිනට යොදා ගෙන ඇති බවත් , ඒ සඳහා පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගනය නොමිලයේ ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගනය නොමිලයේ ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:05** “පරිගණක තීන්ත මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම ” මැයෙන් සැපයුම් නිළධාරිණිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

Canon LBP 6300 dn ප්‍රින්ටරය සඳහා අවශ්‍ය තීන්ත මිලදී ගැනීම සඳහා 2014.11.04 වන දින මාසික සභාවේදී අවම මිළ ගණන් පිළිගත් නමුත් ටියුලිප් ආයතනයේ තීන්ත අවසන් වී ඇති බැවින් මාතර මෙට්‍රොපොලිටන් ආයතනයෙන් මිල ගණන් ලබා ගත් බවත් එම මිල ගණන් සභාව විසින් පිළිගන්නා ලද අවම මිළ ගණන් වලටත්

වඩා අඩු බවත් සඳහන් කර තිබූ අතර මෙට්‍රොපොලිටන් ආයතනයෙන් තීන්ත මිළදී ගැනීම සඳහා අනුමැතිය ඉල්ලා තිබුණි.

| | Canon 319 (Low) | Canon 319 (Hign) |
|---|---|---|
| Tulip Computer Center | 13900.00 | 23500.00 |
| Metropolitan Office (pvt) | 11800.00 | 19900.00 |

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මාතර මෙට්‍රොපොලිටන් ආයතනයෙන් පරිගණක තීන්ත මිලදී ගැනීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

✠ **පෙ.ව.10.39 ට පමණ තේ විවේකය සඳහා සභාවේ වැඩ කටයුතු මදකට නතර කරන ලදී.**

✠ **පෙ.ව.10.45 ට පමණ සභාවේ වැඩ කටයුතු නැවත ආරම්භ කරන ලදී.**

**12:06** "පරිගණක තක්සේරු පත්‍රිකා මිලදී ගැනීම " මැයෙන් සැපයුම් නිළධාරිණිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

වරිපනම් තක්සේරු පත්‍රිකා මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවනු ලැබූවද , මිළ ගණන් නොලැබුණු බවත් , ඒ අනුව මෙම පත්‍රිකා ඉක්මණින් මිලදී ගැනීමට අවශ්‍ය බැවින් පසු ගිය වර්ෂ වල මෙම පත්‍රිකා මිලදී ගත් ආයතනය වන රත්මලාන Tiljay Computer Forms (pvt) Ltd ආයතනයෙන් මිළ ගණන් ෆැක්ස් මඟින් ලබා ගෙන මෙම පත්‍රිකා තැපැල මඟින් ලබා ගැනීමට කටයුතු කරන බවත් 2010 වර්ෂයේදී මෙම පත්‍රිකා 1000 ක් රු.4470.00ක මුදලකට ලබා දී ඇති බවත් මෙවරත් එම මිලටම ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කළ බවත් සඳහන් කර තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභා ආවරණ අනුමැතියට යටත්ව රත්මලාන Tiljay Computer Forms (pvt) Ltd ආයතනයෙන් වරිපනම් තක්සේරු දැන්වීම් පත්‍රිකා මිලදී ගැනීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:07** "බැනර් එකක් දැමීම සඳහා අවසර ලබා ගැනීම " මැයෙන් නො.63,මහ වීදිය, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි කේ.අමිල රවීන්ද්‍ර විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

තම සහෝදරයා ඔස්ට්‍රියා රටේ පැවැත්වෙන Food Olimpic තරඟය සඳහා සහභාගී වී Top Gold Medal 02 ක් දිනා ඇති බවත් ,ඔහුට සුභ පතා බස් නැවතුම්පල ඉදිරිපිට බැනරයක් නොමිලයේ ප්‍රදර්ශනය කිරීමට අවසර ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>

අපි වෙනදා කාටවත් දුන්නෑ බස් ස්ටෑන්ඩ් එක ඇතුලේ බැනර් දාන්න.නමුත් දැන් සම්බු කියලා මම දැක්කා දාලා තියෙනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම කියලා තියෙන්නේ ඒක ඉවත් කරන්න කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**

ඇත්තටම මම ගරු කරන්න ඕන, ෂාන් මහත්තයවත් දාන්නෑ එහෙම.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම් මහත්තයා මෙහෙමයි ඇත්තටම ,අපිත් අපහසුතාවයට පත් වෙනවා.අතිගරු ජනාධිපතිතුමාගේ බැනර් එකක් දාලා තියෙන්නේ.අපි අපේ එකක් වත් දාන්නැහැ.නමුත් මේක ගහලා තියෙනවා.ඒක අපේ සිකියුරිටි එකේ වැරැද්ද.මම දැන් නියෝගයක් දීලා තියෙනවා ,ඒ බැනර් එකයි හාමුදුරුවන්ගේ එකයි දවස් 2 ක් තිබ්බා.ඒ දවස් 2 කේ වැඩ කළ සේවකයන්ගේ වැටුපෙන් රු.500 ගානේ කපන්න කියලා.මොකද එයාලා තමන්ගේ වගකීම හරියට ඉටුකරන්නැත්නම් අපට ඒක ගැටලුවක්.ඇත්තටම සම්බු මහත්තයට ඒක එතන ගහන්න එපා කීවනම් ඒ මහත්තයා ඒක වෙන තැනක ගහනවා.කියන්නැති එකනේ ප්‍රශ්නේ.දැන් අද ගලවන්න කීවම අපිත් අපහසුවට ලක් වෙනවා.එනිසා නීතිය ක්‍රියාත්මක කළාම හරිනේ.කාටත් නීතිය එකයිනේ.හෙට ඇවිල්ලා මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ එකක් ගහලා ඒක ගලවන්න ගියොත් ඒක ගැටලුවක්.එනිසා දැන්ම ඉවත් කරන්න.

**<u>තීරණය</u>**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් බස් නැවතුම්පල ඉදිරිපිට නොමිලයේ බැනරයක් ප්‍රදර්ශනය කිරීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:08** “ගාල්ල දිස්ත්‍රික් මිල කමිටුව - 2014 වර්ෂයේ දෙවන භාගය සඳහා මිල ගණන් ” මැයෙන් සහකාර පළාත් පාලන කොමසාරිස් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ගාල්ල දිස්ත්‍රික් මිල කමිටුව විසින් 2014 වර්ෂයේ දෙවන භාගය සඳහා දන්වා එවා ඇති මිළ ගණන් ඉදිරිපත් කරන බවත් මේ සම්බන්ධයෙන් සියලුම තාක්ෂණ සේවා නිළධාරීන් දැනුවත් කරන මෙන් සඳහන් කර තිබුණි.

**<u>තීරණය</u>**

☞ **මෙය ගරු සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:09** “2014 වර්ෂයේ දෙවන භාගයට අදාල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා මිල ගණන් ” මැයෙන් සහකාර පළාත් පාලන කොමසාරිස් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014 වර්ෂයේ දෙවන භාගය සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් දන්වා එවූ මිළ ගණන් වල සංශෝධන කිහිපයක් මේ සමඟ ඉදිරිපත් කරන බවත් ඒ සම්බන්ධයෙන් සියලුම තාක්ෂණ සේවා නිළධාරීන් දැනුවත් කරන මෙන් සඳහන් කර තිබුණි.

**<u>තීරණය</u>**

☞ **මෙය ගරු සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:10** “අංක 0912258275 අංක දරණ කාර්යාලීය දුරකතනය ” මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

මෙම දුරකථනයේ සැප්තැම්බර් මාසය සඳහා සභාදායකත්ව මුදල ඉක්මවා ඇති බවත් එය රු.678.92 ක් බවත් එම ගෙවීම සභාවට යොමු කර ඇති බවත් ,ඔක්තෝම්බර් මාසය සඳහාද සභාදායකත්වය ඉක්මවා රු.1382.69 ක් වී ඇති බවත් දුරකථනය 2014.11.24 වන දින සිට විසන්ධි කර ඇති බවත් සඳහන් කර තිබුණි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම් මහත්තයා මේක ඔබතුමා විසින් පාලනය කළ යුතුයි.මේ 678 යි 1382 යි ගෙවන්න අපි සභාවෙන් අනුමැතිය ලබා දෙන්නම්.නමුත් චක්‍ර ලේඛයේ දක්වලා තියෙන්නේ අදාළ නිළධාරියා පුද්ගලිකව ගෙවිය යුතුයි කියලා.එනිසා දුරකථනය පාලනය කිරීම කරන්න.පැය අටයි වැඩ කරන්නේ.දවස් 21 යිනේ .ඉතින් මේ 5000 ඇතුලේ සීමා කරන්න පුලුවන්.

**<u>තීරණය</u>**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සැප්තැම්බර් මස සහ ඔක්තෝම්බර් මස සභාදායකත්වය ඉක්මවා ඇති ගාස්තු ගෙවීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දුන් අතර ඉදිරියේදී සභාදායකත්වය ඉක්මවා අයවන ගාස්තු චක්‍ර ලේඛන වලට අනුකූලව අදාල නිළධාරීයාගෙන් අය කර ගැනීමට සභාව වැඩි දුරටත් තීරණය කරන ලදී.**

**12:11** “පාසල විවේක ගන්වන අවස්ථාවන්හීදී මාර්ගය ආරක්ෂිත කර දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට කරුණු ලබන ඉල්ලීම ” මැයෙන් අම්බලන්ගොඩ ශ්‍රී දේවානන්ද විදුහලේ පාසල් සංවර්ධන කමිටුවේ ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

11.25 සිට 11.45 තෙක් පළමු හා දෙවන වසර විවේක ගැන්වීම, 12.55 සිට 1.45 තෙක් 6 වසර සිට 13 වසර දක්වා සිසුන් විවේක ගැන්වීම, උදෑසන 6.45 සිට 7.45 අතර කාලය පාසල ආරම්භය යන අවස්ථාවලදී පාසලට ප්‍රවේශ වීමට ඇති එකම පටු මාර්ගය ,රථ වාහන නැවැත්වීමේ කාර්යයෙන් දරුවන්ට සිදුවන බාධාවලින් තොර කලාපයක් කර දෙන ලෙසට ඉල්ලා තිබූ අතර විශේෂයෙන්ම 1.30 සිට 1.50 දක්වා කාලය තුළ ගාලු පාර ප්‍රවේශයේ සිට ඩෙල්ටා හන්දිය තෙක් මාර්ගයේ වාහන ගමනාගමනය හා මහ දෙපස වාහන නැවැත්වීම දරුවන්ට අනතුරුදායක සහ අපහසුතාවයට පත්වන කරුණක් බැවින් අදාල කාලය තුළ රථවාහන පොලිස් නිළධාරීන් යොදවා අවශ්‍ය පාලනය කිරීමට මැදිහත් වන ලෙසටද ඉල්ලා තිබුණි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ඇත්තටම ළමයින්ගේ ආරක්ෂාව සඳහා කෝන් ලබා දීලා තියෙන්නේ.දේවානන්දට එන ළමයි ගෙනියන්න එන බස් තමයි එන්නේ.වෙන බස් එකක් එන්නෑ.

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් දේවානන්ද විද්‍යුහලේ ඉල්ලීම පිළිබඳව පොලීසියත් සමඟ සාකච්ඡාකර තීරණයක් ලබා දීමට ගරු සභාව තීරණය කරන ලදී.**

**12:12** ''කාය වර්ධන මධ්‍යස්ථානයට උපකරණ මිලදී ගැනීමට අදාල තාක්ෂණ වාර්තාවට අනුමැතිය ලබා ගැනීම''මැයෙන් සැපයුම් නිළධාරීනිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

මෙම කරුණ සම්බන්ධයෙන් උපකරණ මිලදී ගැනීමට අදාලව ගාල්ල දිස්ත්‍රික් මලල ක්‍රීඩා පුහුණුකරු , නගර සභා තාක්ෂණ සේවා නිළධාරී හා පළාත් පාලන යාන්ත්‍රික ඉංජිනේරු එම්.ආර්.එම්.රිස්වි මහතා යන තිදෙනාගෙන් යුත් තාක්ෂණික ඇගයීම් කමිටුවේ වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි.

ඒ අනුව Lat pall down machine , Seated carf race , Chin up and Dippins , Normal fat bench ,Olimpic indine bench යන උපකරණ බණ්ඩාර සහ පුත්‍රයෝ සමාගමෙන් මිලදී ගැනීම සුදුසු බව නිර්දේශ කරන බවත් මෙම උපකරණ යොදාගනු ලබන්නේ ශාරීරික සුවතා මධ්‍යස්ථානයට බවත් , දැනට පවතින උපකරණ වලට අමතරව මෙම උපකරණ යොදාගැනීමට අවශ්‍ය බව තම අදහස බවත් සඳහන් කර තිබුණි.

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් පිළිගත් මිළ ගණන් , තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශය පරිදි ලබා ගැනීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:13** ''නගර සභා ක්‍රීඩාංගනය ලබා ගැනීම''මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014.12.19 වන දින පෙ.ව.9.00 සිට මධ්‍යම රාත්‍රී 12.00 දක්වා අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රාදේශීය සාහිත්‍ය උළෙලට සමගාමීව සංවිධානය කරනු ලබන කෝළම් මඩු සහ ශාන්තිකර්ම සංදර්ශනයට අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනය නොමිලයේ ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් 2014.12.19 වන දින අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට කෝළම් මඩු සහ ශාන්තිකර්ම සංදර්ශනයට සඳහා නොමිලයේ නගර සභා ක්‍රීඩාංගනය ලබා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:14** ''සෞඛ්‍ය කමිටු තීරණ දැනුම් දීම''මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභාව සතු පටබැඳිමුල්ලේ පවතින වැසිකිලිය දැනට භාවිතා නොවන බැවින් විවිධ අපචාර ක්‍රියා සඳහා යොදාගන්නා බවට වාර්තා වී ඇති බව සඳහන් කර තිබුණි.

මේ පිළිබඳ තාක්ෂණ සේවා නිළධාරීගේ වාර්තාව සභාවට ඉදිරිපත් කර තිබූ අතර , එම වාර්තාව අනුව මෙම ස්ථානය වල් බිහි වී ඇති බවත් කිසිවකුත් මෙය භාවිතා නොකරන බවත් මෙම ගොඩනැඟිල්ල අබලන් වී ඇති බවත් එමඟින් පාරිසරයද දූෂණය වන බවත්, එබැවින් මෙය ඉවත් කිරීම සුදුසු බවත් මෙම භූමිය නගර සභා භූමියක් බැවින් මෙම භූමිය වෙනත් පුද්ගලයින්ගෙන් ආරක්ෂාකර ගැනීම සඳහා ඉදිරි පියවර අනුගමනය කළ යුතු බවද සඳහන් කර තිබුණි.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේක සුනාමියට අහු වුණා.ඒකයි මිනිස්සු පාවිච්චි කරන්නැත්තේ.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් කාර්මික නිළධාරීගේ තීරණය පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

**12:15** ''සේවය ඇගයීම වෙනුවෙන් ත්‍යාග සහ ප්‍රසංසා සහතික පිරිනැමීම- ජී.එම් .බන්දුසීල''මැයෙන් ප්‍රජා සංවර්ධන නිළධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් පවත්වනු ලැබූ 2013 වර්ෂයේ විශිෂ්ඨතම සංරක්ෂණ මධ්‍යස්ථානය තේරීමේ තරඟයෙන් දකුණු පළාතේ ප්‍රථම ස්ථානය අම්බලන්ගොඩ නගර සභාව විසින් හිමිකරගත් බවත් ඒ වෙනුවෙන් අඩු පහසුකම් මධ්‍යයේ කැපවීමෙන් කටයුතු කළ මහජන පුස්ථකාලයේ ජී.එම්.බන්දුසීල මහතාට මුදලින් ත්‍යාගයක්(රු.5000.00 ක මුදලක්) සහ සේවය වෙනුවෙන් ප්‍රසංසා සහතිකයක් පිරිනැමීමට යෝජනාකර තිබුණි.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අපේ පුස්තකාලයේ සංරක්ෂණ කටයුතු කරන්නේ පොත් බැදීමේ නිළධාරීයා.එතකොට ඒ පොත් බදින නිළධාරියා කරපු සේවය නිසා තමයි හොදම සංරක්ෂණ පුස්තකාලය බවට පත් වන්නේ.එනිසා අපේ සභාව මඟින් ඒ මුදල් ත්‍යාගය සහ යම් සහතිකයක් සහ පොඩි පලකයක් වගේ දෙයක් ලබා දුන්නනම් ඒ සේවකයා ඇගයීමක් කළා වෙනවා.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මේ සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දුන් අතර අවශ්‍ය නම් පළාත් පාලන කොමසාරිස් මඟින්ද අනුමැතිය ලබා ගන්නා ලෙස ගරු සභාව දැනුම් දෙන ලදී.**

**12:16** ''නගර සභාව සතු ගල් රෝල සැකසීම සම්බන්ධවයි'' මැයෙන් තාක්ෂණ සේවා නිළධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභාව සතු ටොන් 80 ක ගල් රෝල අක්‍රිය තත්වයේ පැවතුන අවස්ථාවේ පළාත් පාලන යාන්ත්‍රික ඉංජිනේරුතුමාගේ උපදෙස් පරිදි මිලදී ගත් එංජිම මේ වන විට සවි කර අවසන් බවත් ,එංජිම සවි කරනු ලැබුවේ නගර සභාවේ මාර්ග කම්කරු ලෙස සේවය කරන එස්.ප්‍රදීප් ක්‍රිෂාන්ත මහතා විසින් බවත් පිටස්තර ආයතනයකට ලබා දී මෙය සිදු කළේ නම් රු.50000.00 ක පමණ මුදලක් වැය වන බවත් ,එබැවින් ක්‍රිෂාන්ත මහතා සිදු කරන ලද මෙහෙය අගය කොට රු.10000.00 ක් හා මේ සම්බන්ධව සේවය කරන ලද සියලුම කම්කරුවන්ට ප්‍රසංසා සහතිකයක් ලබා දීම සුදුසු බව නිර්දේශ කර තිබුණි.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ගල් රෝල අලුත්වැඩියා කිරීම අපේ කාර්යාලයේ වැඩ කරන මාර්ග කම්කරු ප්‍රදීප් ක්‍රිෂාන්ත මහතා විසින් සකස් කරලා තියෙනවා.අපි ඒකටත් ප්‍රසංන්සා කරන්න ඕන.එහිදීත් ඔහුට ප්‍රසංසා කරන්න රු.10000 ක මුදලකුත් ප්‍රසංසා සහතිකයක් සහ කුසලානයක් ලබා දීමට මම යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>

මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අනුමැතියක් ගන්න අවශ්‍ය නම් ඊට පස්සේ ක්‍රියාත්මක කරන්න.

**තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය පිළිගත යුතුබව ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මේ සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දුන් අතර අවශ්‍ය නම් පළාත් පාලන කොමසාරිස් මහින්ද අනුමැතිය ලබා ගන්නා ලෙස ගරු සභාව දැනුම් දෙන ලදී.**

**12:17** “ SD /2014/177 දරණ අනුබෙදුමෙ විකිණීම මත අයකරන1% ගාස්තු නිදහස් කර ගැනීම සඳහා අංක 71/4C ,තල්ගස්ගොඩපටුමඟ, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ඩී. කමලසිරි වරුෂවිතාන මහතා විසින් ඉදිරිපත් කර තිබූ දිවුරුම් ප්‍රකාශය සභාගත කරන ලදී.

බලයලත් මිනින්දෝරු තේජසම් මාදුවගේ මහතා විසින් 2014.11.11 දින මැන සහතික කරන ලද අංක 1448 දරණ පිඹුරුපතේ සඳහන් එකී ඉඩමේ 1C 1 ,1C 2, 1C 3 යනුවෙන් කැබලි 03 ට වෙන් කළ ප්‍රමාණයන් කිසිවිටකත් බාහිර පුද්ගලයින්ට හෝ බාහිර ආයතනයකට නොපැවරෙන බවත් ආදරණීය දරුවන්ට පරිත්‍යාග කිරීමට අදහසක් පවත්නා බවත් දිවුරුම් ප්‍රකාශයක් මඟින් ඉදිරිපත් කර තිබූ අතර ,එබැවින් මෙම කොටස් විකිණීම මත අයකරන 1% ගාස්තුව වන රු.70425.00 ක මුදලක් නිදහස් කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් විකිණීම මත අයකරන 1% ක ගාස්තුව වන රු.70425.00 ක මුදල නිදහස් කිරීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලද අතර වෙනත් අයකුට විකුණනු ලැබුවහොත් 1% ක ගාස්තුව අයකර ගැනීමේ කොන්දේසියට යටත්ව මෙම නිදහස් කිරීම කරන බව වැඩි දුරටත් සඳහන් කරන ලදී.**

**12:18** " SD /2014/185 දරණ අනුබෙදුමේ විකිණීම මත අයකරන1% ගාස්තු නිදහස් කර ගැනීම සඳහා අංක 51,සුගතබිම්බාපාර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ආර්.එස්.එම්.පුංචි කුමාරිහාමි මහත්මිය විසින් ඉදිරිපත් කර තිබූ දිවුරුම් ප්‍රකාශය සභාගත කරන ලදී.

බලයලත් මිනින්දෝරු එස් .ප්‍රීති වීරවර්ධන මහතාගේ අංක 2315 හා 2006.04.28 දින දරණ පිඹුරේ සඳහන් කැබලි A, B, C පාර සහ D හී හිමිකාරිය තමන් බවත් එම පිඹුරේ සඳහන් සියලුම කැබලි කිරීම් සිදු කරන ලද්දේ මෙම දේපල දරුවන් සඳහා තෑගී වශයෙන් ලබා දීමට පමණක් බව දිවුරුම් ප්‍රකාශයක් මඟින් ඉදිරිපත් කර තිබූ අතර ,එබැවින් මෙම කොටස් විකිණීම මත අයකරන 1% ගාස්තුව වන රු.264845.00 ක මුදලක් නිදහස් කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් විකිණීම මත අයකරන 1% ක ගාස්තුව වන රු. 264845.00 ක මුදල නිදහස් කිරීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලද අතර වෙනත් අයකුට විකුණනු ලැබුවහොත් 1% ක ගාස්තුව අයකර ගැනීමේ කොන්දේසියට යටත්ව මෙම නිදහස් කිරීම කරන බව වැඩි දුරටත් සඳහන් කරන ලදී.**

**12:19** "අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය සංවිධානය කරනු ලබන සදහම් වෙසක් කලාපය සඳහා බස්නැවතුම්පලේ කැට මඟින් මුදල් එකතු කිරීම සඳහා අවසර ලබා ගැනීම" මැයෙන් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2015 වෙසක් උත්සවය නිමිත්තෙන් අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය මඟින් සංවිධානය කරනු ලබන සදහම් වෙසක් කලාපය පැවැත්වීම සඳහා කැට මඟින් අම්බලන්ගොඩ ප්‍රධාන බස් නැවතුම්පලේ කැට මඟින් මුදල් එකතු කිරීම 2014.12.10 දින සිට ආරම්භ කිරීමට අදහස් කර සිටින බවත් මේ සඳහා අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මේ සඳහා පෙර වර්ෂයේදී ලබා දෙන ලද සහනයම ලබා දීමට ගරු සභාව තීරණය කරන ලදී.**

**12:20** "2014 අංක 34 දරණ මහ නගර සභා (සංශෝධන) පනත,2014 අංක 35 දරණ නගර සභා(සංශෝධිත)පනත,2014 අංක 36 දරණ ප්‍රාදේශීය සභා(සංශෝධිත)පනත , 2014 අංක 37 දරණ පළාත් පාලන ආයතන වල පුරපුපාඩු

පිරවීමේ (විශේෂ විධිවිධාන)(සංශෝධන)පනත ''මැයෙන් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

පලාත් පාලන ආයතන වල අයවැය සම්බන්ධයෙන් 262 වන අධිකාරය වූ පළාත් පාලන ජන්ද විමසීම් පනත සහ 2012 සහ 21 දරණ පළාත් පාලන ආයතන විශේෂ විධි විධාන පනත යටතේ වූ ප්‍රතිපාදන සංශෝධනය කරමින් පාර්ලිමේන්තුවේ සංශෝධනය කරගත් බවත් ,2014 අංක 34 දරණ මහ නගර සභා (සංශෝධන) පනත,2014 අංක 35 දරණ නගර සභා(සංශෝධිත)පනත,2014 අංක 36 දරණ ප්‍රාදේශීය සභා(සංශෝධිත)පනත , 2014 අංක 37 දරණ පළාත් පාලන ආයතන වල පුරපුපාඩු පිරවීමේ (විශෝෂ විධිවිධාන)(සංශෝධන)පනත මේ සමඟ එවන බවත් , තවද මෙම පනත් වල ක්‍රියාත්මක දිනය 2014.10.23 වන අතර මේ සම්බන්ධයෙන් , ගරු පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ඒ.එල්.එම්.අතා උල්ලා මැතිතුමා විසින් කරන ලද නියමයන් සහිත 1886/64-2014.10.31 දරණ අති විශේෂ ගැසට් නිවේදනය ද භාෂාත්‍රයෙන් මේ සමඟ එවනු ලැබූ බව සඳහන් කර තිබුණි.

<u>**තීරණය**</u>

☞ **මෙය ගරු සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:21** "තාක්ෂණ සේවා නිළධාරී නිර්දේශය පරිදි තල්ගස්ගොඩ පුංචි පාලම අසල සිට මහ පාලම දක්වා මාර්ගය අයිනේ එක් පැත්තක ශරීර සුවතා සං තීරුවක් ඉදිකිරීමේ කර්මාන්තයේ ගිවිසුම් කාලය 2014.10.31 දක්වා දීර්ඝ කිරීම ''මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

මෙම කර්මාන්තයට අදාල කාලය දීර්ඝ කිරීම පළාත් පාලන ආයතනය මඟින් සිදු කළ යුතු බව ප්‍රධාන ඉංජිනේරුතුමා දන්වා ඇති බැවින් ,මෙම කර්මාන්තයේ පස් සාම්පල් පරීක්ෂා කිරීම 2014.07.08 වන දින සිදු කරන ලද බවත් එහිදි යම් ප්‍රමාදයක් සිදු වූ බවත් ,ඉන් පසුව වැසි බර කාලගුණයක් පැවති බැවින් කර්මාන්තය කරගෙන යාමට අපහසු වූ බවත් එබැවින් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම පරිදි මෙම කර්මාන්තයේ කාලය 2014.10.31 දින දක්වා දීර්ඝ කිරීම සුදුසු බව තාක්ෂණ සේවා නිළධාරිණිය විසින් නිදේශ කර තිබුණි.

මෙම කර්මාන්තයේ කාලය දිර්ඝ කිරීමට විරෝදතාවය ප්‍රකාශ වූ බැවින් මේ සම්බන්ධයෙන් ජන්දය විමසන ලදී.මෙම කර්මාන්තයේ කාලය දීර්ඝ කිරීමට පක්ෂව මන්ත්‍රීවරුන් 06 දෙනෙක් සහ විපක්ෂව මන්ත්‍රීවරුන් 03 දෙනෙක් ජන්දය දෙනු ලැබිය.

<u>**තීරණය**</u>

☞ **වැඩි ජන්ද 03 න් තල්ගස්ගොඩ පුංචි පාලම අසල සිට මහ පාලම දක්වා මාර්ගය අයිනේ එක් පැත්තක ශරීර සුවතා මං තීරුවක් ඉදිකිරීමේ කර්මාන්තයේ ගිවිසුම් කාලය දීර්ඝ කිරීමේ යෝජනාව සම්මත විය.**

✪ fjk;a IreKq

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>

සභාපතිතුමා මර්කරි බල්බ් වගයක් අරන් තියෙනවා මෑතකදී.මම සණ්ඨාර කණුව ගාවටයි රේල් ගේට්ටුව ගාවටයි 2 ක් දැම්මා.ඒවා තාම වැඩ.ඒත් එළියේ තියෙනවා අඩුවක්.මම දන්නෑ මොන වර්ගයෙන් ගත්තද කියලා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පරීක්ෂා කරලා බලන්න.මර්කරි බල්බ් වල එළිය මදියිලු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**

රෑ කට ඇවිල්ලා බැලුවොත් CFL බල්බ් එකක තියෙන එළිය තියෙන්නේ.අපි මේ බල්බ් වල වර්ගයක් නම් කරන්න ඕන.වෙනදා අපි ගන්නේ වර්ගයට.හිතුන හිතුන විදියට බල්බ් ගන්නෑ අපි.ටන්සන් නම් ටන්සන්.ජපෑන් එකක් එක.අඩු වර්ගයේ බල්බ් තමයි අරන් තියෙන්නේ.කුලසේන මහත්තයගේ ගේ ගාව තියෙන්නේ පරණ බල්බ් එකක්.ඒ බල්බ් එකයි මේ බල්බ් එකයි බැලුවහම එළිය වෙනස්.ඒකයි මම කියන්නේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බලලා එළිය අඩුනම් මාරු කරන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මම යෝජනා කරනවා අපේ ජනාධිපතිතුමාට විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් බයිසිකය ගානේ ලබා දීමට.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ස්ථිර කරනවා මම ඒ යෝජනාව.ඒ යෝජනාවට විරුද්ධ අය ඉන්නවද.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**

මම මේ මාර්ග සටහන බැලුවා.ඒකේ විලේගොඩ සටහන් වෙලා නෑ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි අපි ඒක බලන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

පින්නදූව වට රවුම් පාරේ 2 වන හරස් පාර පවරා ගැනීමේ ලේඛන කට්ටලය ලැබිලා තියෙනවා.මේ කතා කරන්නේ ටේලර් අනුර මහත්මයාලගේ පාර.එම මාවතේ පදිංචි 6 දෙනෙක් අත්සන් කරලා මේක එවලා තියෙනවා.ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ පාර පවරා ගෙන සංවර්ධනය කරන්න කියලා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අත්සන් කරලම එවන්න ලේඛන කට්ටලය මන්ත්‍රීතුමා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය කතා කරමින්</u>**

ජී.ඒ .ඩබ්.රුවන්,අංක 16, බුද්ධදත්ත මාවත, පොල්වත්ත කියන ලිපිනයේ අයෙක් ලිපියක් සභාපතිතුමාට යොමු කරලා තියෙනවා.ඒ කියන්නේ සභාපතිතුමා මේ පුද්ගලයා කියන්නේ ,එයාගේ අසල් වැසි නිවැසියන් වන 16/5, පී.එච්.ජයන්ත ජයලත් යන අයගේ වහලෙන් වැසි ජලය වැටිලා ජනෙල් සහ බිත්ති වලට අලාභ හානි වෙනවා

කියලා ඔබතුමාටත් දන්වලා තියෙනවා.අපටත් පිටපතක් එවලා තියෙනවා.නගර සභාවෙන් ගිහිල්ලා බැලුවත් කීවා.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

තාක්ෂණ සේවා නිළධාරී ඒ වෙච්ච දේ සම්බන්ධයෙන් මන්ත්‍රීතුමියව දැණුවත් කරන්න.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>
නුගේ තුඩුව පාරේ අන්තිම කෙළවරෙන් මනුස්සයෙක් වැට ගහලා අවහිර කරලා තියෙනවා සභාපතිතුමණි.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

සොයලා බලන්න මොකක්ද වෙලා තියෙන්නේ කියලා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>
පින්නදූව පාරේ කාණු හදන්න කියලා ලිපියක් ආවද සභාපතිතුමා.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නෑ අපි ඒක යෝජනාවක් විදියට දැම්මනේ අයවැයට.

☞ ප.ව.12.28 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

භාරත සමරසේකර,

ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව

අරුණ ප්‍රදීප් මණීමෙල් වඩු

සභාපති,

අම්බලන්ගොඩ නගර සභාව

**2014 -12 - 23** වන දින

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.